# දෙසතිය

පුවත් සඟරාව

2025 ජූලි



# ප්‍රජා ශක්ති



# මිනිත්තු 10
# 11 අසුන

හුමි චෞහාන්

විශ්වාස්කුමාර්

ලන්ඩන්හි ගැට්වික් (London Gatwick) ගුවන්තොටුපොළ බලා ඉන්දියාවේ අහමදාබාද් ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙන් 2025 ජූනි 12 දින ගුවන්ගත වූ Ai-171 එයාර් ඉන්දියා ගුවන් සේවයට අයත් යානය ගුවන්ගත වී තත්පර 30ක කාලයකින් ගුවන්තොටුපොළ අසල බීජේ වෛද්‍ය විද්‍යාලයේ රෝහල් නේවාසිකාගාරයට කඩා වැටුණා. මෙසේ අනතුරට ලක්වුණේ බෝයිං 787-8 ඩ්‍රීම්ලයිනර් යානය. එහි තිබුණු ඉන්ධන ලීටර් 125,000කට ආසන්න ප්‍රමාණය ක්ෂණික ව දහනය වීමෙන් එය මගීන් ද සමග දැවී විනාශ වුණා. අනතුරෙන් කිසිවකු දිවි බේරා නොගත් බවයි සියල්ලන් විශ්වාස කළේ.

එහිදී ආශ්චර්යමත් ලෙස පිළිගැනෙන සිදුවීම් දෙකක් වුණා. යානයේ 11-A අසුනේ වාඩිවී සිටි ඉන්දියානු සම්භවයක් ඇති බ්‍රිතාන්‍ය ජාතික රමේෂ් විශ්වාස්කුමාර් බුචර්වාඩාගේ ජීවිතය බේරී තිබුණා. විදෙස් මාධ්‍ය වාර්තා කරන ආකාරයට සියල්ලන් මිය ගිය පසුත් මුහුණට, පපුවට සහ පාදවලට තුවාල සිදු ව ජීවිතය බේරුණු එක ම පුද්ගලයා 40 හැවිරිදි විශ්වාස්. ඔහු මාධ්‍යයට අදහස් දැක්වූයේ මෙලෙස. "ගුවන්ගත වී සුළු වේලාවකින් විශාල ශබ්දයක් සමග ඉතා ඉක්මනින් යානය කඩා වැටුණා. නැගිටිනකොට මා වටේ මළ සිරුරු තිබුණා. මම බය වෙලා දිව්වා. ගුවන්යානයේ කෑලි මා වටේ විසිරිලා තිබුණා. කවුරුහරි මාව අල්ලාගෙන ගිලන් රථයකට දාලා රෝහලට ගෙනාවා." රමේෂ්ගේ වැඩිමහල් සහෝදරයා වන අජේ කුමාර් ද යානයේ සිට ඇති අතර එහි ගමන් ගත් මගීන්ට අමතර ව ගොඩනැගිල්ලේ සහ අසළ සිටි කිහිපදෙනකු ද ජීවිතක්ෂයට පත් ව තිබෙනවා.

ගුවන්තොටුපොළට පැමිණීමට ප්‍රමාද වීම නිසා යානයට ගොඩවීමට නොහැකි වූ ලන්ඩනයේ පදිංචි ඉන්දීය කාන්තාවක වන භූමි චෞහාන් ද අනතුරට මුහුණදීමට නියමිත ව තිබුණත් ඊට මුහුණ නොදීමට වාසනාවන්ත වූ තැනැත්තියක්. ඇය මෙලෙස පවසනවා. "මම ගුවන්තොටුපොළට එන විට මාර්ග තදබදය නිසා මිනිත්තු 10ක් ප්‍රමාද වුණා. යානා අවසරපත්‍රයේ මුද්‍රිත පිටපතක් ද මා ළඟ තිබුණේ නැහැ. ඒ නිසා මා කොපමණ ආයාචනා කළත් නිලධාරින් අවසරපත්‍රයේ මුද්‍රිත පිටපත නොමැති ව මට ගුවන්යානයට ගොඩවීමට ඉඩ නොදිය හැකි බව පැවසුවා. ඒ නිසා මම ප.ව. 1:30ට ගුවන්තොටුපොළෙන් ආපසු පිට වුණා. ගුවන් යානය ප. ව. 1:38ට ගුවන්ගත වෙලා. මගේ ම ගුවන් යානා අංකය, එක ම ගුවන් තොටුපොළ, එක ම ගමනාන්තය සහිත ව එසැණින් කඩා වැටී හානියට පත් ව තිබූ යානය පිළිබඳ බිහිසුණු ප්‍රවෘත්තිය දුටු විට මගේ අත්, කකුල් වෙව්ලන්නට පටන් ගත්තා. මම බේරුණේ ඇයි? කියලා මම දන්නේ නැහැ."

**කටු**

# දෙසතිය

පුවත් සඟරාව

වෙළුම 47, කලාපය 07,
2025 ජූලි

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කරණ මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759

උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**

47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව





20



16 Axiom 4



03 ජර්මන් - ශ්‍රී ලංකා මිත්‍රත්වය



33 ඉරගිනි මද්දහන



14 ඒකාබද්ධ ඉරාන ආක්‍රමණය සහ ලෝක සාමය



41 නැවුම් දේශයක සිනමා අභිෂේකය

# ප්‍රජා ශක්ති

රාජ්‍ය යාන්ත්‍රණයත් රාජ්‍ය නිලධාරියාත් පුරවැසියාත් ඒකාබද්ධ යාන්ත්‍රණයකට ගෙන ඒම ප්‍රමුඛ අරමුණ කරගත් 'ප්‍රජා ශක්ති' වැඩසටහන නොබෝද (ජූලි 04) ඇරඹුණා. සමාජ සවිබල ගැන්වීම හා ආර්ථික ප්‍රතිලාභ සාධාරණ ව බෙදී යාම සහතික කිරීම ඉන් සිදු වන අතර එහිදී ආර්ථිකය ප්‍රසාරණය කිරීමත් ග්‍රාමීය ව විසිරුණු ජන ප්‍රජාව එම ආර්ථිකයේ පංගුකරුවන් බවට පත් කර ගැනීමත් රජයේ අරමුණ වී තිබෙනවා.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ජූලි මස 06 දින ලෝක ග්‍රාම සංවර්ධන දිනය ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ තිබීමත් අවධානයට ලක් විය යුතු කරුණක්. ග්‍රාම සංවර්ධනය රටක අත්‍යවශ්‍ය කාර්යයක් ලෙස ජාත්‍යන්තරය හඳුනාගෙන තිබෙන පසුබිමක ශ්‍රී ලංකාවේ 'ප්‍රජා ශක්ති' වැඩසටහන හඳුන්වා දෙමින් ඒ සඳහා ප්‍රවේශය ලබා ගැනීම සාධනීය තත්ත්වයක්.

මෙරට ජනගහනයෙන් 79%කට ආසන්න සංඛ්‍යාවක් ජීවත් වන්නේ ග්‍රාමීය හා වතු ආශ්‍රිත ව. එයින් 4.5%ක් වතු අංශයේ. බහුතරය ග්‍රාමීය අංශයේ ජීවත් වීම නිසා වැඩි දිළිඳු ප්‍රජාවක් සිටින්නේ එම අංශයේ බව පැහැදිලි වන කරුණක්. මේ නිසා ග්‍රාමීය ප්‍රජාව මෙහිදී ඉලක්කගත වීම සුවිශේෂයි.

දිළිඳුබව තුරන් කිරීමට ඒ ඒ කාලවකවානුවල පත් වූ විවිධ ආණ්ඩු විවිධ සහනාධාර වැඩසටහන් ක්‍රියාවට නංවා තිබෙනවා. ජනසවිය, සමෘද්ධි, අස්වැසුම එහිදී වඩාත් කතාබහට ලක් වූ සහනාධාර වැඩසටහන්. එහෙත් ඒවායේ නිසි ඵල නෙළාගෙන නැති බව පැහැදිලි කරුණක්. ඒ, එන්න එන්න ම රටේ දිළිඳු ප්‍රජාව වර්ධනය වෙමින් තිබෙන බව සංඛ්‍යා ලේඛනවලින් තහවුරු වී ඇති නිසා.

ලෝක බැංකුව පෙන්වා දී ඇති පරිදි 2019 වසරේදී 11.3%ක් වූ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව 2020 වසරේදී 12.7% දක්වාත් 2024 වසරේදී 24.5% දක්වාත් වැඩි වී තිබෙනවා. 2000 වසරේ මෙරට ආධාර මත යැපෙන පිරිස මිලියන 1.1ක් ලෙස සඳහන්. එය 2010 වසර වන විට මිලියන 1.5ක් දක්වා වර්ධනය වී ඇති අතර 2024 වසර අවසන් වන විට ආසන්න වී තිබුණේ මිලියන 1.8කට.

එයින් පැහැදිලි වන්නේ දිළිඳුබව තුරන් කිරීම යන අරමුණ පසෙක ලා මේ වැඩසටහන්වලින් වෙනත් අරමුණු ඉටු කරගෙන ඇති බවක්. ලෝක බැංකු දත්ත අනුව ශ්‍රී ලංකාවේ දුප්පතුන්ගෙන් 51%කට සමෘද්ධි සහනාධාරය ලැබී නැහැ. එසේ ම සමෘද්ධිලාභීන්ගෙන් 12%ක් සමෘද්ධි සහනාධාරය ලැබීමට නුසුදුසු, එනම් ජීවන තත්ත්වය යහපත් පවුල් බව අනාවරණය වී තිබෙනවා. එම කාරණයෙන් ම පෙනී යනවා එම වැඩසටහන්වල අසංවිධිත බව. මේ නිසා සැබෑ ලෙස ම රටේ දිළිඳුභාවය තුරන් කරන්නේ කෙසේද? යන්න සොයා බලමින්, පූර්ව වැඩසටහන්වල පැවති දුර්වලතා අධ්‍යයනය කර එම දුර්වලතා මගහරවා ගැනීමට අවධානය යොමු කරමින් මේ වැඩසටහන සකස් ව තිබීම ඉතා වැදගත්.

රටේ ජනතාව සැබවින් ම අපේක්ෂා කරන්නේ 'ප්‍රජා ශක්ති' යනු දිළිඳුබව තුරන් කිරීමේ තවත් එක් වැඩසටහනක් පමණක් නොවී එම ප්‍රජාවගේ ජීවිත සැපවත් කරන දිශානතියකට එය ගමන් කරනු ඇතැයි යන්න. එනම් සහනාධාර අනවශ්‍ය වී ඔවුන්ගේ ආදායම් ඉහළ යාමෙන් ජීවන තත්ත්වය උසස් වනු දැකීම.

මාලා මල්කාන්ති ජයමාන්නගේ

- සංස්කාරක -


දෙසතිය
පුවත් සඟරාව

දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..........
Address ..........
ID Number .......... Tel / Mobile ..........
Signature .......... Date ..........

දෙසතිය සඟරා දායකත්වය

වාර්ෂික දායකත්වය රු. 1500.00
අර්ධ වාර්ෂික දායකත්වය රු. 750.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදළ බැංකු බැරපත හා සඟරා දායකත්ව කූපන්පත 071-9303111 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

# ජර්මන්-ශ්‍රී ලංකා මිත්‍රත්වය



සංචාරක ක්ෂේත්‍රයේ නියෝජිතයන් හමු වී



ජර්මන් ජනාධිපති Frank Walter Steinmeier සමග

**චන්දන මාරසිංහ**

ශ්‍රී ලංකාව හා ජර්මනිය අතර රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පවත්වාගෙන යන්නේ වසර ගණනාවක සිට. 1953 දෙසැම්බර් 09 දින ජර්මානු ෆෙඩරල් ජනරජය සමග ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ආරම්භ වී තිබෙනවා. ඒ අනුව දෙරට අතර මිතුදම පවතින්නේ වසර 72කට ආසන්න ව.

ජනාධිපති අනුර කුමාර දිසානායක ජර්මන් ජනාධිපති Frank Walter Steinmeierගේ ආරාධනයකට අනුව ජර්මනියේ නිල සංචාරක නිරත වුණා. ඒ, 2025 ජූනි 11 සිට ජූනි 13 දින දක්වා. Berlin Brandenburg ජාත්‍යන්තර ගුවන්තොටුපොළින් ජර්මනියට ළඟා වූ ශ්‍රී ලංකා ජනාධිපතිවරයා පිළිගැනීමේ උත්සවය පැවැත්වුණේ එරට ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ජර්මනියේ Bellevue මන්දිරයේදී.

රාජ්‍ය ගෞරව සහිත ව පැවති පිළිගැනීමේ උත්සවයෙන් අනතුරු ව ජනාධිපතිවරුන් දෙදෙනා අතර ද්විපාර්ශ්වික සාකච්ඡා ඇරඹුණා. දෙරට අතර ආර්ථික හා ජාත්‍යන්තර සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම පිළිබඳ මෙන් ම වෘත්තීය පුහුණු සහ සංචාරක කර්මාන්තය යන අංශවල සහයෝගිතාව වර්ධනය කිරීම පිළිබඳ ව ද එහිදී විශේෂ අවධානය යොමු වුණා. ජර්මන් විදේශ අමාත්‍ය Johann Wadephul සමග සාකච්ඡා කළේ රජයේ ප්‍රමුඛතා මත පදනම් ව වෙළෙඳ, ඩිජිටල්, ආර්ථික, ආයෝජන හා වෘත්තිය පුහුණු අවස්ථා ආදිය පිළිබඳ ව. දෙරට සහයෝගිතාව පුළුල් කෙරෙන නව මාර්ග පිළිබඳ ව ද මෙහිදී අවධානය යොමු වුණා. ජර්මන් ආර්ථික සහයෝගිතා හා සංවර්ධන අමාත්‍ය Reem Alabali Radovan හා ජනාධිපතිවරයා අතර පැවති සාකච්ඡාවේදී කතාබහ සිදුවුණේ ගෝලීය නව ආර්ථික ප්‍රවණතා හමුවේ දෙරට මුහුණදෙන පොදු අභියෝග පිළිබඳ ව. දෙරටේ ආර්ථික සහයෝගිතාව තවදුරටත් වර්ධනය කරගන්නා ආකාරය සහ වර්ධනය කරගත හැකි ක්ෂේත්‍ර පිළිබඳ දීර්ඝ ලෙස එහිදී සාකච්ඡා කර තිබෙනවා. ද්විපාර්ශ්වික සහයෝගිතාව පිළිබඳ දීර්ඝ ඉතිහාසය සිහිපත් කළ ජනාධිපතිවරයා ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය වැනි වෘත්තීය පුහුණු ආයතන වෙනුවෙන් සහ සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රවල ප්‍රගතිය සම්බන්ධයෙන් ජර්මනිය දැක්වූ දායකත්වය පිළිබඳ සිය ස්තුතිය පළ කළා. ගෝලීය ආර්ථික ප්‍රවණතා හමුවේ යුරෝපයේ රටවල් සමග වැඩි දායකත්වයක් සහ සම්බන්ධයක් ඇතිකර ගැනීම ශ්‍රී ලංකාව වැනි රටවලට අතිශයින් වැදගත්. වෙනස් වන තත්ත්ව හමුවේ ආර්ථික මෙන් ම ජාත්‍යන්තර ආයතන සමග ගනුදෙනු කරන ආකාරය ද වෙනස් විය යුතුයි.

කැලණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යනාංශයේ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය හෂාන් විජේසිංහ එම සංචාරය පිළිබඳ දක්වන්නේ මෙවැනි අදහසක්. ඔහු; "රාජ්‍ය තාන්ත්‍රික සංචාර රටකට ඉතා ම වැදගත්. හුදෙකලාව කිසිදු රටකට පවතින්නට බැහැ. ඉන්දියාව, චීනය වැනි රටවල් සමග මෙන් ම යුරෝපය සමග සම්බන්ධතා ඇති කර




ජර්මන් ආර්ථික සහයෝගිතා හා සංවර්ධන අමාත්‍ය Reem Alabali Radovan සමග

ගැනීම අතිශය වැදගත්. ජනපතිගේ ජර්මන් සංචාරය ශක්තිමත් දේශපාලන හා ආර්ථික සම්බන්ධතාවකට පදනම දමා ඇති බව සඳහන් කළ යුත්තක්. ආයෝජකයන් ශ්‍රී ලංකාවට පැමිණෙන්නේ අවශ්‍ය සහය තිබුණොත් පමණයි. දේශපාලන ස්ථාවරත්වය මෙන් ම ආර්ථික ස්ථාවරත්වය එහිදී සලකා බැලෙනවා. දළ දේශීය නිෂ්පාදනය අනුව ඇමරිකාව හා චීනයට පසු විශාලතම ආර්ථිකය හිමිවන්නේ ජර්මනියට. යුරෝපා සංගමයේ රටවල් අතරත් විශාලතම ආර්ථිකය හිමිවන්නේ ජර්මනියට. එවැනි රටකින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ගත හැකි දායකත්වය සුවිශාලයි. එහිදී අපනයන අවස්ථා පුළුල් කර ගැනීමේ හැකියාව පවතිනවා. වෙළෙඳපොළ වර්ධනය කරගතහොත් එය ජයග්‍රහණයක්.”

සංචාරක සහ චාරිකා කර්මාන්ත සංගම් මෙන් ම බැහැර චාරිකා මෙහෙයවන්නන් සමග හමුවකට ද ජනාධිපතිවරයා එක්වුණා. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ තිරසරභාවය වෙනුවෙන් රජය ගෙන ඇති සාධනීය පියවර පිළිබඳ මෙහිදී කරුණු පැහැදිලි කර තිබෙනවා. සංචාරක පහසුකම් වැඩි කිරීම, ප්‍රවර්ධන වැඩපිළිවෙළ සහ සංචාරකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් රජය ගෙන ඇති පියවර ගැන ද ජනාධිපතිවරයා කරුණු පැහැදිලි කළා. තිරසර සංචාරක ක්‍රමවේද ඔස්සේ ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් බවට පත් ව තිබෙනවා. මෙරට ආර්ථිකයට ද ඉහළ දායකත්වයක් ලබාදීමට ඊට හැකියාව පවතිනවා. ඒ සඳහා සංචාරක ක්ෂේත්‍රය විවිධාංගීකරණය මෙන් ම මෙතෙක් සංචාරක ආකර්ෂණයට ලක් නොවූ ප්‍රදේශ පිළිබඳ සොයා බැලීම වැදගත්. චිත්‍රපට සංචාරක ක්ෂේත්‍රය වැනි අංශ දියුණු කිරීම ද එහිදී මූලික වනවා. වඩාත් වැදගත් වන්නේ ජාත්‍යන්තර මට්ටමෙන් ශ්‍රී ලංකාව ගැන හා ආකර්ෂණීය සංචාරක ස්ථාන ගැන දැනුවත් කිරීමේ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධාන කිරීම. ඒ ඔස්සේ යුරෝපා කලාපයේ සංචාරකයන් වැඩි වශයෙන් ගෙන්වා ගන්නට පුළුවන්. එය සංචාරක අංශයේ ආදායම් වැඩිකර ගැනීමට ද ඉතා වැදගත්. සංචාරක කර්මාන්තයේ මානව සම්පත් සංවර්ධනය, සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීම, පාරිසරික සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සහ පරිසරය ආරක්ෂා කර ගැනීම ඇතුළු

ජර්මනියෙන් ශ්‍රී ලංකාවට එන සංචාරකයන්ගේ වර්ධනයක් පවතිනවා. එය තවදුරටත් වැඩි කර ගත යුතුයි. ජර්මන් සංචාරකයන් මුදල් වියදම් කරනවා. එය රටේ ආර්ථිකයට යහපත් අවස්ථාවක්. සෘජු විදේශ ආයෝජන අවස්ථා ලබා ගත හැකිනම් එය ද ජයග්‍රහණයක්. සංචාරක කර්මාන්තය ප්‍රමුඛ කරගෙන ඇති සෘජු විදේශ ආයෝජනවලට ජර්මනිය දායක කර ගන්නට පුළුවන්. සංචාරකයන් ගෙන්වීම වැඩිකර ගැනීම සඳහා රාජ්‍යතාන්ත්‍රික ව නිලධාරීන්ට හැකියාව පවතිනවා.



ජර්මන් විදේශ අමාත්‍ය Johann Wadephul. සමග



කරුණු පිළිබඳ ජනාධිපතිවරයා අදහස් පළ කළා

ශ්‍රී ලංකාවට වැඩි ම සංචාරකයන් පිරිසක් පැමිණෙන රටවල් අතර ජර්මනිය පසු වන්නේ සිව් වැනි ස්ථානයේ. 2024 වසරේ ජර්මන් සංචාරකයන් 136,000ක් මෙරටට පැමිණ තිබෙනවා. 2025 වසරේ මැයි දක්වා සංචාරකයන් 69,000ක් පැමිණ තිබෙනවා. ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ පවතින නව ආයෝජන අවස්ථා පිළිබඳ ව ද ජනාධිපතිවරයා පෙන්වා දුන්නා.

දෙරට අතර පවතින සංචාරක කර්මාන්තයේ විභවතා සම්බන්ධයෙන් අදහස් දක්වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හෂාන් විජේසිංහ; "ජර්මනියෙන් ශ්‍රී ලංකාවට එන සංචාරකයන්ගේ වර්ධනයක් පවතිනවා. එය තවදුරටත් වැඩි කර ගත යුතුයි. ජර්මන් සංචාරකයන් මුදල් වියදම් කරනවා. එය රටේ ආර්ථිකයට යහපත් අවස්ථාවක්. සෘජු විදේශ ආයෝජන අවස්ථා ලබා ගත හැකිනම් එය ද ජයග්‍රහණයක්. සංචාරක කර්මාන්තය ප්‍රමුඛ කරගෙන ඇති සෘජු විදේශ ආයෝජනවලට ජර්මනිය දායක කර ගන්නට පුළුවන්. සංචාරකයන් ගෙන්වීම වැඩිකර ගැනීම සඳහා රාජ්‍යතාන්ත්‍රික ව නිලධාරින්ට හැකියාව පවතිනවා. ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා සංචාරකයන්ට ලබා දිය හැකි දේ ගැන අවබෝධය ලබා දිය යුතුයි. අධ්‍යාපන අවස්ථා විශේෂයෙන් ශිෂ්‍යත්ව ලබාදීමට ද අවධානය යොමු කළ හැකියි. මෙලෙස සම්බන්ධතා තහවුරු කර ගැනීමෙන් ජර්මනිය ඉලක්ක කර අපනයනය වර්ධනය කර ගැනීමේ හැකියාව පවතිනවා."

ජර්මනියේ වාණිජ හා කර්මාන්ත සංගම් මූලස්ථානයේ පැවති ව්‍යාපාරික සංසදයේ ප්‍රධාන දේශනය සිදු කරමින් ශ්‍රී ලංකා ජනාධිපතිවරයා මෙරට ආර්ථික පරිවර්තනය, ආයෝජන අවස්ථා, දෙරට අතර නව වෙළෙඳ සම්බන්ධතා ගොඩනැගීමට ඇති අවස්ථා ආදිය පිළිබඳ අවධානය යොමු කරමින් අදහස් පළ කළේ වත්මන් ගෝලීය ආර්ථික ප්‍රවණතා හමුවේ ශ්‍රී ලංකාව ගෙන ඇති සාධනීය පියවර සහ ආර්ථික අභියෝග ජය ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ ව පැහැදිලි කරමින්. ශ්‍රී ලංකාවේ අනාගතය හැඩගැස්වීමේ ආර්ථික ප්‍රතිසංස්කරණ හා ආයෝජන අවස්ථා පිළිබඳ ව ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති අර්ජුන හේරත් කරුණු ඉදිරිපත් කළා. Siemens energy, Continental ag, GTA වැනි ඉහළ මට්ටමේ ජර්මන් සමාගම් ද ව්‍යාපාරික සංසදයේදී සිය අදහස් ඉදිරිපත් කළේ සංචාරක ව්‍යාපාරය, සැපයුම් හා ප්‍රවාහනය, වෘත්තීය පුහුණුව, තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් ආර්ථිකය ආදිය සම්බන්ධයෙන්.

ජර්මන් අධ්‍යයන හුවමාරු, ජර්මන් වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය ඇතුළු ආයතන ශ්‍රී ලංකාව සමග සබඳතා පවත්වන්නේ විවිධ අයුරින්. දිගුකාලීන සංවර්ධන සහයෝගිතාව සහ ද්විපාර්ශ්වික වැඩසටහන් ඔස්සේ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ව ද අවධානය යොමු වී තිබීම ඉතා වැදගත්. ජර්මනිය හා ශ්‍රී ලංකාව සමුද්‍රීය ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ ඉන්දු පැසිපික් කලාපය පිළිබඳ ජර්මන් රජයේ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ යටතේ. මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය වැනි අංශවලදී සිවිල් සමාජ ව්‍යාපෘති ගැන දෙරට අවධානය යොමු කර තිබෙනවා. ශ්‍රී ලංකා ජර්මන් ව්‍යාපාරික කවුන්සලය ඔස්සේ ආර්ථික පුනරුදය සඳහා වැඩි අවස්ථා ලබා ගත හැකි වීම සුවිශේෂ කරුණක්. මේ කාරණා නිසි ලෙස කළමනාකරණය කර ගතහොත් ශ්‍රී ලංකාවට වැඩි වරප්‍රසාද හිමිකර ගැනීමේ හැකියාව පවතිනවා. එනම් ද්විපාර්ශ්වික සාකච්ඡා වැදගත් වන්නේ නිවැරදි ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වීමෙන්.


ව්‍යාපාරික සංසදයේ හමුව



# ශත්තොත් වැඩ වරදී

**ඉරේෂා මධුරකාවිනී**

සෑම වසරක ම ජුනි මස 12 දිනට යෙදෙන ළමා ශ්‍රමිකත්වයට එරෙහි ජාත්‍යන්තර දිනයේ මෙවර තේමාව වූයේ 'සුරක්ෂිත නිරෝගී පරපුරක්' යන්න. මේ ලිපිය පළ වන්නේ ඒ නිමිත්තෙන්.

වයස අවුරුදු 16ට අඩු ළමයින් සිගමනේ යෙදවීම, වෙළෙඳාම්වල යෙදවීම සහ වයස අවුරුදු 16-18 අතර ළමයින් ගෘහ සේවය ඇතුළු අනතුරුදායක රැකියාවල යෙදවීම ජූලි මස 01 දින සිට සපුරා තහනම්. ඒ සඳහා දැනට පවතින නීතිමය විධිවිධාන දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමට නොබෝද (25) කැබිනට් අනුමැතිය හිමි වුණා. කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ් පවසන්නේ සියලු ම දරුවන්ගේ ජීවත්වීමේ අයිතිය, ළමා වියේ අයිතිය, අධ්‍යාපන අයිතිය ලබා දීම සඳහා ඔවුන්ට සුරක්ෂිත හෙටක් සැකසීම වෙනුවෙන් මේ යෝජනාව ඉදිරිපත් කළ බව.

රජයේ අරමුණ වී ඇත්තේ වීදියේ සිඟමන් යදින, වෙළෙඳාමේ යෙදෙන සහ වෙනත් අනාරක්ෂිත රැකියා ක්ෂේත්‍රවල යෙදෙන දරුවන් වෙනුවෙන් තාවකාලික පරිත්‍යාග ලබා දීම වෙනුවට ඔවුන්ගේ අධ්‍යාපන අයිතිවාසිකම් සහ සමාජ සුරක්ෂිතභාවය පිළිබඳ අයිතිවාසිකම් තහවුරු කිරීම. ජූලි මස 01 දින සිට ඕනෑ ම ස්ථානයක දරුවන් සිඟමනේ යෙදෙනවා දුටුවහොත් අන්තරායාකාරී රැකියාවල, ජංගම වෙළෙඳාමේ යෙදෙනවානම් ඊට එරෙහි ව ක්‍රියාත්මක වන්නට ඕනෑ ම පුරවැසියකුට අයිතියක් තිබෙනවා.

අධ්‍යාපනය ලැබිය යුතු වයසේ දරුවන් වීදිවල සිඟමනේ යෙදීම සහ අන්තරායකර රැකියාවල යෙදවීම සම්බන්ධයෙන් මෙරට පවතින්නේ ශක්තිමත් නීති පද්ධතියක්. 2022 අංක 39 දරන ළමයින් හා තරුණ තැනැත්තන් (සංශෝධන) පනතට අනුව 18ට අඩු සියලු ම දරුවන් ළමයින් ලෙස සලකන අතර වයස අවුරුදු 16 දක්වා දරුවකු අනිවාර්ය අධ්‍යාපනය ලැබිය යුතු වයස ලෙසයි සැලකෙන්නේ. 16ට අඩු දරුවකු පාසල් අධ්‍යාපනයට යොමු නොවනවානම් ඒ සඳහා විරුද්ධ වීමට නීතිමය ප්‍රතිපාදන පවතිනවා.

2024 වර්ෂයේ දත්ත අනාවරණය කරන්නේ රජය, ස්වේච්ඡා සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන දීප ව්‍යාප්ත ව පවත්වාගෙන යන ළමා සංවර්ධන මධ්‍යස්ථාන 356ක ළමයින් 9191ක් පමණ නේවාසික ව රැකවරණය ලබමින් සිටින බව. දරුවන් සුරක්ෂිත කිරීමේ වත්මන් රජයේ වැඩපිළිවෙළ යටතේ 2025 අයවැයෙන් ද මෙවැනි දරුවන් වෙනුවෙන් සැලකිය යුතු මුදලක් වෙන් කෙරුණා. එහිදී ආයතනික රැකවරණය හා භාරකාරත්වයේ සිටින ළමයින් සහ වීදි ළමයින් සඳහා මාසික ව රුපියල් 5000ක දීමනාවක් ලබා දීමට වෙන් කළ මුදල රුපියල් මිලියන 1000ක්. ඒ අනුව රුපියල් 5000ක ජීවන වියදම් දීමනාවෙන් රුපියල් 3000ක් භාරකාරිත්වය යටතේ සැලසිය යුතු අධ්‍යාපන, සෞඛ්‍ය සහ අනෙකුත් සුභ සාධන වියදම් වෙනුවෙන් ළමයා රැඳී සිටින සංවර්ධන මධ්‍යස්ථානයට හෝ භාරකාරිත්වය දරන්නාට ලබා දීමත් ඉතිරි රුපියල් 2000ක මුදල දරුවාගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ ගිණුමක මාසික ව තැන්පත් කිරීමත් සඳහා කාන්තා හා ළමා කටයුතු ඇමතිවරිය ඉදිරිපත් කළ යෝජනාවටත් කැබිනට් අනුමැතිය හිමිවුණා.

සියලු ම දරුවන්ගේ යහපැවැත්ම හා සංවර්ධනය තහවුරු කිරීම සඳහා මෙරට ක්‍රියාත්මක වන්නේ ආයතන රැසක්. මේ යටතේ දරුවකු ආයතනගත කිරීමට වඩා දරුවකුට විකල්ප රැකවරණයට අවශ්‍ය පසුබිම සකස් කිරීම සඳහා ක්‍රියාත්මක විය හැකි යාන්ත්‍රණයක් සකස් කිරීමයි වත්මන් රජයේ අරමුණ. මේ සඳහා බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක විය හැකි නිලධාරින් රැසක් සිටියදී දරුවන් තවමත් මහ මඟට වැටෙන්නේ ඇයි? යන කාරණය ඇමතිවරිය ප්‍රශ්න කරනවා. ඒ අනුව දැනට දරුවන් සම්බන්ධ ව ක්‍රියා කළ හැකි ග්‍රාම නිලධාරි, පරිවාස නිලධාරි, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්, මුල් ළමාවිය සංවර්ධන නිලධාරින්, පවුල් සෞඛ්‍ය නිලධාරින්, සමාජ සේවා නිලධාරින්, කාන්තා සංවර්ධන නිලධාරින්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාදේශීය නිලධාරින්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ දරුවන් පිළිබඳ සොයා බලන නිලධාරින් සහ අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ ප්‍රාදේශීය නිලධාරින් සම්බන්ධ කරගෙන බිම් මට්ටමේ සිට ඒකාබද්ධ යාන්ත්‍රණයකින් දරුවන් සුරක්ෂිත කිරිමේ වැඩපිළවෙළ ක්‍රියාත්මක කරන බවයි ඇය සඳහන් කරන්නේ. විශේෂයෙන් බිම් මට්ටමේ සිටින නිලධාරින් සමග සම්බන්ධ වී ප්‍රාදේශීය මට්ටමෙන්, ග්‍රාමීය මට්ටමෙන් මේ වැඩපිළිවෙළ සක්‍රිය කර

අවදානම්සහගත දරුවන් හඳුනා ගැනීමයි මෙහිදී සිදු වන්නේ. එම ඒකාබද්ධ යාන්ත්‍රණ වැඩපිළවෙළ මේ වන විටත් ආරම්භ කර අවසන්.

විශේෂයෙන් සිඟමනේ යෙදෙන, භාණ්ඩ අලෙවි කරන, අන්තරායකර රැකියාවල නිරත වන  දරුවන් හඳුනා ගත් විට ඒ සඳහා 1998 අංක 29 දරන දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනතේ iii වැනි වගන්තියෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව පවතිනවා. ඒ අනුව ජූලි මස 01 දින සිට පවතින නීති රාමුව ඔස්සේ දරුවන් සුරක්ෂිත කිරීමේ ක්‍රියාවලියට අනුව නීතිය දැඩි ව ක්‍රියාත්මක වන බව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යවරිය අවධාරණය කරනවා.

ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතට අනුව ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ නියුක්ත කිරීමේ පනතේ ප්‍රතිපාදන කඩ කරමින් යම් ළමයකු සේවයේ යෙදවුවහොත් එය ළමා අපචාරයක්. මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති ප්‍රීති ඉනෝකා රාජපක්ෂ පවසන්නේ අපචාරක්‍රියා බහුල ව සිදු වුවත් ඒවා වාර්තා වීම 5%ක්වත් ඉක්මා නොයන බව. අදහස් දක්වන සභාපති ප්‍රීති ඉනෝකා රාජපක්ෂ; "ළමා අපචාරක්‍රියා පිළිබඳ සිදුවීම් වාර්තා වීම අවම නිසා අප වින්දිතයන් වෙනුවෙන් ළමා හිතකාමී වැඩපිළිවෙළක් සකස් කර තිබෙනවා. 1929 ළමා උපකාරක දුරකතන සේවාව ඔස්සේ ඕනෑ ම දරුවකුට හෝ ඔවුන්ගේ භාරකරුවකුට හෝ තමන්ගේ නමින්, නිර්නාමික ව පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නට පුළුවන්. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණ වාචික පැමිණිල්ලක් වුවත් ඉදිරිපත් කළ හැකියි. පැමිණිල්ලක් නොමැති ව සමාජ මාධ්‍යයේ  සැලකිය යුතු සිද්ධියක් වාර්තා වුවහොත් ඒ සම්බන්ධයෙන් වුවත් විමර්ශනයන් සිදු කිරීමට අප සූදානම්."

පරිවාස දෙපාර්තමේන්තුව දරුවන් සුරක්ෂිත කිරීමේ වැඩපිළිවෙළට සම්බන්ධ වන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 400ක පමණ නිලධාරින්ගේ දයකත්වය ලබා ගනිමින්. යම් කිසි පවුලක වින්දිතභාවයට පත් විය හැකි දරුවකු සිටිනවානම් එයට ඉක්මන් ප්‍රතිචාර දැක්වීම මේ නිලධාරින්ගේ කාර්යයක්. දරුවකු වින්දිතභාවයට පත් වීමට පෙර හඳුනා ගැනීම ඉතා වැදගත්. මෙවැනි දරුවන් වෙනුවෙන් පවුල පාදක කරගත් රක්ෂණ ක්‍රමයක් ද හඳුන්වා දී තිබෙනවා.

මෙහිදී සිදු වන්නේ හඳුනා ගන්නා දැඩි අවදානම් සහගත දරුවන්ගේ අවදනම තක්සේරු කර එම පවුලට අවශ්‍ය පරිදි මූල්‍යමය සහන හෝ උපදේශන ලබා දීම. පවුල තුළ ම දරුවා සුරක්ෂිත කිරීමටයි පරිවාස දෙපාර්තමේන්තුව පියවර ගන්නේ. එසේ නොමැතිනම් පමණක් ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට හෝ රාජ්‍ය ආයතනයකට යොමු කරන බව නිර්මලී පෙරේරා අවධාරණය කරන කාරණයක්.

ළමා ශ්‍රමය සම්බන්ධයෙන් රජයේ ආයතනයක් ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමට බලතල හිමි වන්නේ කම්කරු දෙපාර්තමේන්තුවට. 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනතට 2021 වර්ෂයේදී සිදු කරන ලද සංශෝධන අනුව සේවයේ යෙදවීමේ අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ දැමුණා. කම්කරු කොමසාරිස් (ශ්‍රම ප්‍රමිති) එන්. ආර්. රණවක පවසන්නේ වයස අවුරුදු 18ට අඩු තැනැත්තන් සේවයේ යෙදවීමේදී අදාළ කරගත යුතු අනතුරුදායක රැකියා ලැයිස්තුවක් 2021 නොවැම්බර් 18 දින සිට සංශෝධනය කර ඇති බව. ඔහු පවසන පරිදි  අනතුරුදායක රැකියා ලැයිස්තුවේ රැකියා 71ක් මේ වන විට නීතිය හමුවේ බලාත්මක වී අවසන්.

**අධ්‍යාපනය ලැබිය යුතු වයසේ දරුවන් වීදිවල සිඟමනේ යෙදීම සහ අන්තරායකර රැකියාවල යෙදවීම සම්බන්ධයෙන් මෙරට පවතින්නේ ශක්තිමත් නීති පද්ධතියක්. 2022 අංක 39 දරන ළමයින් හා තරුණ තැනැත්තන් (සංශෝධන) පනතට අනුව 18ට අඩු සියලු ම දරුවන් ළමයින් ලෙස සලකන අතර වයස අවුරුදු 16 දක්වා දරුවකු අනිවාර්ය අධ්‍යාපනය ලැබිය යුතු වයස ලෙසයි සැලකෙන්නේ. 16ට අඩු දරුවකු පාසල් අධ්‍යාපනයට යොමු නොවනවානම් ඒ සඳහා විරුද්ධ වීමට නීතිමය ප්‍රතිපාදන පවතිනවා.**

මෙහිදී අනතුරුදායක රැකියා හඳුනා ගැනීමට පාදක කර ගන්නේ කිසියම් ළමයකුගේ, තරුණ තැනැත්තකුගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට හා සදාචාරයට හානිදායක වන රැකියා. ඒ යටතේ පළමු වැනි අනතුරුදායක රැකියාව ලෙස 2021දී කළ සංශෝධනයෙන් ගෘහ සේවය ඇතුළත් කර තිබෙනවා. ඒ අනුව අවුරුදු 18ට අඩු කිසිවකු ගෘහ සේවයේ යොදවන්නට බැහැ. SPAහි වැඩ කිරීම, මානසික යහපැවැත්මට හානිදායක වන පරිගණක හෝ ඉලෙක්ට්‍රොනික උපාංගවලට අදාළ කාර්ය, ළමයාගේ සෞඛ්‍යයට ආරක්ෂාවට හා සදාචාරයට හානිවන ක්ෂේත්‍ර රැකියා සම්බන්ධ ව වර්තමානයට ගැළපෙන ලෙස කළ තවත් සංශෝධන. මේ රැකියා හඳුනා ගැනිමට පාදක වී ඇත්තේ අන්තර්ජාතික කම්කරු ප්‍රඥප්තියේ සම්මුති අංක 182. ඒ අනුව මේ වන විට දරුවන් සුරක්ෂිත කිරිමේ කාර්යය වෙනුවෙන් ශක්තිමත් නීති පද්ධතියක් මෙරට ක්‍රියාත්මක වන බවයි එන්. ආර්. රණවක අවධාරණය කරන්නේ.

එම උපරිම සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව, පරිවාස දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පොලිසිය ඒකාබද්ධ ව ක්‍රියා කරන අතර ඕනෑ ම පැමිණිල්ලක් සම්බන්ධ ව 1929 ළමා උපකාරක දුරකතන අංකයට අමතර ව ඕනෑ ම කම්කරු කාර්යාලයකට හෝ කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිලි කළමනාකරණ අංශයට දුරකතනයෙන් වුව ද දැනුම් දිය හැකියි.

මෙලෙස වීදියේ සිඟමන් යැදීම, වෙළෙඳාම, අන්තරායකාරී රැකියාවල යෙදෙන හෝ වෙනත් කවර හෝ ආකාරයකින් අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන් පිළිබඳ තොරතුරු පොලිස් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශයේ 109 හදිසි ඇමතුම් සේවය වෙත දිවයිනේ ඕනෑ ම පොලිස් ස්ථානයකින් හෝ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිලධාරින් වෙත දැනුම් දීමෙන් ඔවුන්ගේ අනාගතය වඩාත් සුරක්ෂිත කිරීමට පියවර ගත හැකියි.




# විකාශනය මාධ්‍යය සහ සංක්‍රාන්ති යුගයක මාධ්‍යවේදය

**කපිල එම්. ගමගේ**

ශ්‍රී ලංකාවේ විද්‍යුත් විකාශකයන්ගේ සංසදය (Sri Lanka Broadcaster's Guild) විසින් සංවිධානය කරන ලද 2025 ශ්‍රී ලංකා විද්‍යුත් විකාශන සම්මන්ත්‍රණය නොබෝදා කොළඹදී පැවැත්වුණා. එහි මූලික තේමාව වූයේ "ඩිජිටල් ලෝකය සඳහා විද්‍යුත් විකාශන ගැන නැවත සිතා බැලීමක්" යන්න. මෙහි ප්‍රධාන දේශනය සිදු කළේ ඉන්දුනීසියාවේ ඉස්ලාමික විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදනය පිළිබඳ මහාචාර්ය මස්ඩුකී. ඔහු විශේෂයෙන් අග්නිදිග ආසියාවේ විද්‍යුත් මාධ්‍ය කෙරෙහි බලපාන දේශපාලනය, තාක්ෂණය හා ඉදිරි අනාගතය යන ප්‍රධාන කාරණා 3ක් පිළිබඳ සිය අවධානය යොමු කළා. දේශපාලන ව්‍යුහය පිළිබඳ අග්නිදිග ආසියානු දළ විශ්ලේෂණයේදී ඔහු සඳහන් කළේ බොහෝ රටවල ක්‍රියාත්මක වන්නේ අධිකාරීවාදී දේශපාලන ආකෘති බව. ඒවාට අමතර ව ඇතැම් රටවල රාජාණ්ඩු ක්‍රමයක් ද තව ම ක්‍රියාත්මක වන බවත් ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහ හැකිළී ඇති බවත් ඔහු සඳහන් කළා. එම නිසා එවැනි රටවල මාධ්‍ය හැසිරවීමේදී නිදහස සීමා කෙරෙන අතර නව ඩිජිටල් තාක්ෂණික සන්නිවේදනට ද පැන නැගෙන්නේ යම් සීමා.

අග්නිදිග ආසියාවේ සහ ගෝලීය සන්දර්භයේ මාධ්‍ය සහ අන්තර්ජාල නිදහස පිළිබඳ ව කතා කිරීමේදී දක්නට ලැබෙන සුවිශේෂ කාරණයක් වන්නේ අග්නිදිග ආසියානු කලාපයේ රටවල දියුණු සන්නිවේදන තාක්ෂණයක් භාවිත වුව ද ප්‍රජාතන්ත්‍රවාදී ව ඔවුන් වඩාත් දරිද්‍රතාවෙන් පසුවන බව. එය ඒ ඒ රාජ්‍ය දැන සිදු කරන්නක්. එහෙත් ගෝලීය වශයෙන් ගත් කල මේ දියුණු තාක්ෂණය ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් හා පුළුල් කිරීම උදෙසා භාවිත වනවා. නූතනයේ දේශපාලන සන්නිවේදනයට භාවිත කෙරෙන මාධ්‍යකරණයේ දෙමුහුන් ආකෘති කෙරෙහි මෙහිදී අවධානය යොමු කිරීම වැදගත්. මාධ්‍යකරණයේ දෙමුහුන් ආකෘතිය යනු දේශපාලන ක්ෂේත්‍රයේ සාම්ප්‍රදායික සහ ඩිජිටල් සන්නිවේදන ක්‍රම මිශ්‍ර කිරීම. එයට පැරණි මාධ්‍ය (රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්) සහ නව මාධ්‍ය (සමාජ මාධ්‍ය වේදිකා, වෙබ් අඩවි, බ්ලොග්, පොඩ්කාස්ට් ආදිය) යන දෙක ම භාවිත කිරීම මෙන් ම දේශපාලන අදහස්, ව්‍යාපාර සහ ක්‍රියා වටා මහජනතාව සම්බන්ධ කර ගැනීමට බලපෑම් කිරීම සහ බළමුළු ගැන්වීම ඇතුළත් කෙරෙනවා.

දෙමුහුන් දේශපාලන සන්නිවේදනයේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් දක්නට පුළුවන්. සාම්ප්‍රදායික මාධ්‍ය සහ ඩිජිටල් මාධ්‍ය ඒකාබද්ධ කිරීම (රූපවාහිනී කතාවක් පසුව ෆේස්බුක් හෝ යූ ටියුබ් ඔස්සේ එහි කොටස් වශයෙන් ප්‍රවර්ධනය), සාම්ප්‍රදායික ඒක-මාර්ගික විකාශනයට වඩා සම්පූර්ණයෙන් ම වෙනස් ද්වි-මාර්ග සන්නිවේදනය (සමාජ මාධ්‍ය), පරිශීලක-ජනනය කළ අන්තර්ගතය (මීම්ස්, වීඩියෝ සහ බ්ලොග් නිර්මාණය), ඇල්ගොරිතම් විස්තාරණය (TikTok, x (ට්විටර්) සහ instagram වැනි වේදිකා ඔස්සේ දේශපාලන අන්තර්ගතවල විස්තාරණය වැඩි කර දීම), පුද්ගලීකරණය සහ ක්ෂුද්‍ර ඉලක්ක කිරීම (දත්ත විශ්ලේෂණයෙන් ජනවිකාස හෝ මාර්ගගත හැසිරීම් මත පදනම් ව කුඩා නිශ්චිත කණ්ඩායම් වෙත ඉලක්කගත ව පණිවිඩ සකස් කිරීමට පරිශීලකයන්ට ඉඩ සලසා දීම), ජාලගත පොදු ක්ෂේත්‍රය, දුස් තොරතුරු සහ හැසිරවීමේ අවදානම් (ව්‍යාජ පුවත් පැතිරීම, ප්‍රචාරණය හෝ බොට් සහ ට්‍රොල් මගින් හැසිරවීම සඳහා පහසුකම් සැලසීම) එවැනි ලක්ෂණ. නූතනයේ මේ තාක්ෂණික වෙනස්කම් මගහැර යාමට සාම්ප්‍රදායික විකාශන මාධ්‍යවලට හැකියාවක් නැහැ. ඒවා සමග වඩාත් උපක්‍රමශීලී ව හා ප්‍රඥාගෝචර ආකාරයෙන් වැඩ කිරීම සඳහා නව මාවත් විවෘත කර ගැනීමයි අවශ්‍ය වන්නේ.

නූතන විකාශන මාධ්‍ය සාම්ප්‍රදායික සිට ඩිජිටල් සහ AI විකාශනය දක්වා වෙනස්කම් රැසකට බඳුන් වී තිබෙනවා. සාම්ප්‍රදායික විකාශනයෙන් ඩිජිටල් සහ AI බලයෙන් ක්‍රියාත්මක වන විකාශනයට මාරුවීම යටතේ ඇති වී තිබෙන්නේ අන්තර්ගතය නිෂ්පාදනය, බෙදා හරින සහ පරිභෝජනය කරන ආකාරයෙහි සැලකිය යුතු වෙනස්කම්.

සම්ප්‍රේෂණය සහ බෙදා හරින ආකාරය තාක්ෂණික ව සම්පූර්ණයෙන් ම වෙනස් වී තිබෙනවා. එය පරිවර්තනය වී තිබෙන්නේ සාම්ප්‍රදායික සංඛ්‍යාත විකාශනයේ සිට එය ඩිජිටල් සහ AI විකාශනය දක්වා. ඇනලොග් සංඥා (AM, FM, [1]HF, UHF)වල සිට ඩිජිටල් සංඥා (DT, DAB, ප්‍රවාහය) දක්වා එය වෙනස් වනවා. මේ නිසා සිදුවන සුවිශේෂ

කාරණය වන්නේ සන්නිවේදනය හුදෙක් සාම්ප්‍රදායක මාධ්‍යවල මෙන් භූගෝලීය ව සීමා නොවී අන්තර්ජාලය සහ චන්ද්‍රිකා ඔස්සේ ගෝලීය ප්‍රවේශයක් දක්වා විශ්ව ව්‍යාප්තියක් සිදුවීම.

අන්තර්ගත නිර්මාණයේදී අතින් පිටපත්කරණය, සංස්කරණය සහ නිෂ්පාදනය පුද්ගල කේන්ද්‍රීය ව සිදුකිරීම වෙනුවට AI සහයක පිටපත් රචනය, හඬ කැවීම් සහ සංස්කරණය සිදු කෙරෙනවා.

ඒක මාර්ගික ක්‍රියාකාරකම වෙනුවට අන්තර්මාර්ගික ප්‍රේක්ෂක ප්‍රතික්‍රියා සිදුවීම මෙහිදී දක්නට පුළුවන්. ද්වි-මාර්ග සන්නිවේදනය, තත්‍ය කාලීන අන්තර්ක්‍රියා ආදී බහුවිධ ක්‍රම මෙහිදී දැකිය හැකියි. සීමිත ග්‍රාහක ප්‍රතිපෝෂණය වෙනුවට AI විශ්ලේෂණ කළ ප්‍රතිපෝෂණ, හැඟීම් විශ්ලේෂණය මෙහිදී සිදු වනවා.

ඩිජිටල් වේදිකා සහ ප්‍රවේශ්‍යතාවේ තීරණාත්මක වෙනසක් විද්‍යුත් විකාශන මාධ්‍ය කර්මාන්තයේ සිදු වී තිබෙනවා. සාම්ප්‍රදායික රේඩියෝ සහ රූපවාහිනී කට්ටල වෙනුවට සුහුරු දුරකතන, ටැබ්, ස්මාර්ට් ටීවී, VR උපාංග ඒ තැන්වලට ස්ථානගත වී තිබෙනු දක්නට පුළුවන්. මේ නිසා ස්ථාවර වැඩසටහන් කාලසටහන ඕනෑ ම වේලාවක, ඕනෑ ම තැනක සිට අන්තර්ගතවලට ප්‍රවේශවීමට ග්‍රාහකයාට හැකි වී තිබෙනවා.

විකාශන මාධ්‍ය කර්මාන්තයේ තීරණාත්මක අංශයක් වන මුදල් ඉපැයීම සඳහා භාවිත කළ ක්‍රමෝපායවල ද තීරණාත්මක වෙනසක් දැකිය හැකියි. සාම්ප්‍රදායික මාධ්‍ය මුදල් ඉපැයූ දැන්වීම්, ගුවන් කාල විකිණීම, බලපත්‍ර ගාස්තු වෙනුවට අනුග්‍රාහකත්ව ක්‍රමලේඛන දැන්වීම්, AI පාදක අන්තර්ගත මුදල් ඉපැයීම, දායකත්ව ආකෘති මත ඉපැයීම ආදිය වර්තමානයේ ප්‍රබල වී තිබෙනවා.

කෘත්‍රිම බුද්ධිය ජනනය කරන ලද ප්‍රවෘත්ති සාරාංශ සහ අතථ්‍ය අවකාශීය ප්‍රවෘත්ති ඉදිරිපත් කරන්නන් ප්‍රතිස්ථාපනය මෙහිදී සිදු වන්නක්. මෙයින් මානව පක්ෂග්‍රාහීත්වය අවම කිරීමට හැකියාව ලැබෙනවා. ප්‍රවෘත්ති චක්‍ර තථ්‍යකාලීන ව සිදුකිරීම පහසු වන අතර ම පැය 24 ම කෘත්‍රිම බුද්ධියෙන් සුරක්ෂිත ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමට හැකියාව ඇතිවනවා.

අභියෝගවලට මුහුණදීමේදී සාම්ප්‍රදායික මාධ්‍ය තාක්ෂණික සීමා, ඉහළ පිරිවැය, දත්ත රහස්‍යතා ගැටලු, වැරදි තොරතුරු අවදානම් ආදී කාරණාවලට බරපතළ ලෙස මුහුණදෙන අතර නව ඩිජිටල් හා කෘත්‍රිම බුද්ධියෙන් ඒවා ජය ගැනීමේ අවස්ථාව උදා වී තිබෙනවා.

ප්‍රවෘත්ති කාමර හැකිළෙමින්, වැරදි තොරතුරු සංසරණය වෙමින්, වාරණය සහ ආර්ථික අස්ථාවරත්වය ගොඩනැගෙමින්, විද්‍යුත් මාධ්‍ය කලාව ගැඹුරු පරිවර්තනයකට භාජනය වෙමින් පවතින යුගයක් මේ. එහෙත් මේ අභියෝග මධ්‍යයේ, ජනමාධ්‍ය කලාව ප්‍රගුණ කිරීමේ නව ක්‍රම මතුවෙමින් පවතිනවා. එයට අනුවර්තනය











වීම පමණක් නොව ඔරොත්තු දීමේ හැකියාව සහ අනාගතය සඳහා අලුත් බලාපොරොත්තුවක් ද එමගින් ලබාගත හැකියි.

පළමු ව ඩිජිටල්කරණය සහ ප්‍රේක්ෂක කේන්ද්‍රීය ආකෘතිවලට අවතීර්ණ වීම මෙහිදී වැදගත්. මාධ්‍යකරුවන් පොඩ්කාස්ට් සහ ප්‍රවෘත්ති පත්‍රවල සිට යූ ටියුබ් සහ ටික්ටොක් දක්වා ඩිජිටල් වේදිකා වැළඳ ගනිමින් ප්‍රේක්ෂකයන් වෙත සෘජු ව ම ළඟා වීමට සහ සම්බන්ධ වීමට ක්‍රියාකරන බව පැහැදිලි කාරණයක්.

විසඳුම් ජනමාධ්‍යවේදය හෙවත් ගැටලු කෙරෙහි පමණක් අවධානය යොමු කරනවා වෙනුවට මාධ්‍යකරුවන් අනුගමනය කරමින් සිටින්නේ විසඳුම් ජනමාධ්‍යවේදය. එය මිනිසුන් සමාජ ගැටලුවලට ප්‍රතිචාර දක්වන ආකාරය තීව්‍ර කරන්නක්. මේ ප්‍රවේශය මාධ්‍ය කෙරෙහි මහජන විශ්වාසය යථා තත්ත්වයට පත් කරන අතර වෙනසක් කළ හැකි බව පෙන්වීමෙන් සිවිල් සහභාගිත්වය වඩාත් දිරිමත් කරනවා.

සහයෝගිතා ජනමාධ්‍යවේදය ක්‍රියාත්මක කිරීමෙන් මාධ්‍යකරුවන් තොරතුරු ලබා ගැනීමේදී හුදෙක් දේශීය මූලාශ්‍රවලට පමණක් නතු නොවී ප්‍රවෘත්ති කාමරවල සිරවී සිටින දේශීය දේශ සීමා අතික්‍රමණය කිරීමට මෙහිදී සිදුවනවා. මාධ්‍යකරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ගෝලීය සංවිධාන හා ජාල ඔස්සේ ක්‍රියා කිරීමට හැකියාව ලැබීමෙන් තොරතුරුවල බලපෑම්සහගත බව වැඩි කළ හැකියි.

දත්ත විශ්ලේෂණයේදී සහ කෘත්‍රිම බුද්ධිය සහය ඇති වාර්තාකරණයෙන් මාධ්‍යකරුවන්ට සංකීර්ණ දත්ත කට්ටල විශ්ලේෂණය කිරීමට, ප්‍රවණතා හඳුනා ගැනීමට සහ සැඟවුණු කතා අනාවරණය කිරීමට හැකියාව ලබා දෙන අතර කෘත්‍රිම බුද්ධිය සහ යන්ත්‍ර භාවිතයෙන් ජනමාධ්‍යකරුවන්ට අවස්ථාව ලැබෙන්නේ නව ඉගෙනීමකට.

ප්‍රජා පාදක ජනමාධ්‍ය කලාවට වැඩි අවස්ථාවක් ලැබෙන මෙහිදී මෙතෙක් මගහැරී සිටි ප්‍රදේශ හා පුරවැසියන් ඇතුළත් කරගැනීමට පහසුවීම විශේෂිත කරුණක්.

ආරක්ෂාව, සහයෝගිතාව සහ මානසික සෞඛ්‍යය වෙනුවෙන් නව මාධ්‍යකරුවන්ගේ ජාල නිර්මාණය වෙමින් පවතිනවා. මේ සාමූහික සහයෝගය, විශේෂයෙන් ගැටුම් කලාප හෝ පීඩාකාරී පාලන තන්ත්‍රවල මාධ්‍යකරුවන්ට වැඩිදියුණු කර දෙන්නේ සිය වෘත්තියෙහි ඔරොත්තු දීමේ හැකියාව.

(2025 ජූනි 25 දින පැවති ශ්‍රී ලංකා විද්‍යුත් විකාශකයන්ගේගේ සම්මන්ත්‍රණයේ පැවති දේශන ඇසුරින්)

# සුපිළිපන් සමාජයකට මග

අල්ලස සහ දූෂණය පිටුදැකීම නීතිගරුක, සදාචාරවත් සමාජයක ප්‍රධාන ලක්ෂණයක්. ඒ සඳහා රටක නීති පද්ධතිය නිසි පරිදි සංවිධානගත වීම වැදගත්. 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත හඳුන්වා දීමෙන් සමාජයේ අල්ලස හා දූෂණය පිටුදැකීම සම්බන්ධයෙන් නෛතිකමය රාමුව තවදුරටත් ශක්තිමත් වී තිබෙනවා. මේ, ඒ පිළිබඳ කතාබහක්.

**ප්‍රශ්නය: අල්ලස සහ දූෂණය නීති ප්‍රකාර ව හඳුනා ගැනෙන්නේ කෙසේද?**

පිළිතුර: 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතට අනුව අල්ලසක් යන්නෙන් අදහස් වන්නේ යම්කිසි ක්‍රියාවක් කිරීමට හෝ නොකිරීමට යම් කෙනකුට තුටු පඬුරක් පිරිනැමීම, අයැදීම හෝ භාර ගැනීමක්. එහි 111 වගන්තියේ සඳහන් වන ආකාරයට චේතනාන්විත ව හෝ දැනුවත්භාවය ඇති ව වැරදි හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු කර ඉන් රජයට පාඩුවක් සිදු වන්නේනම් හෝ, නීති විරෝධී හෝ වැරදි සහගත ලාභයක් ලබන්නේනම් හෝ, තමන්ට හෝ වෙනත් අයකුට වාසි සහගතමය තත්ත්වයක් ඇති කර ගන්නේනම් එම ක්‍රියාව වැරදි සහගත බව හෝ, වෙනත් අයකුට අවාසි සහගත වන බව දන්නේනම් එම තැනැත්තා තමන්ගේ ධුරය දරමින් එම ක්‍රියා සිදු කරන්නේනම් හෝ එය දූෂණයක් බවට පත් වෙනවා. පනතට අනුව වැරදිසහගත ක්‍රියාවක් සිදු කිරීම ම පමණක් නොව අනුදැනුමක් සහිත ව ඊට එරෙහි නොවී නිශ්ශබ්ද ව සිටීමත් වැරදිකරුවකු වීමට හේතුවක්.

**ප්‍රශ්නය: දූෂණ විරෝධී පනතක් රටකට අවශ්‍ය වන්නේ/ වැදගත් වන්නේ කුමන නිසාද?**

පිළිතුර: ඇතැම් රටවල දූෂණය, අල්ලස සාමාන්‍යකරණය වී තිබෙනවා. රාජ්‍ය පාලනයට සහ දේශපාලනයට සම්බන්ධ නායකයන් සහ නිලධාරින් ප්‍රසිද්ධියේ අල්ලස් ගන්නවා. ඔවුන් දූෂණයේ කොටස්කරුවන් බවට පත් ව අවසන්. ශ්‍රී ලංකාවේ පවා මෙවැනි තත්ත්ව පසුගිය



ජනාධිපති නීතිඥ
**උපුල් කුමාරප්පෙරුම**

**වත්මන් රජය විසින් හඳුන්වා දෙන ලද Clean Sri Lanka වැඩසටහනෙන් අපේක්ෂා කරන්නේ පරිසරයේ පමණක් නොව මේ සමාජ දේහය ම වසාගෙන තිබෙන කිලිටි සම්පූර්ණයෙන් ඉවත් කිරීම. මේ පනතෙන් ඒ සඳහා දැනුවත්භාවය ලබා දෙනවා යහපත් හා ශිෂ්ටසම්පන්න සමාජය ගොඩ නැඟීමට. ඒ අනුව සමාජය වංචාවෙන්, දූෂණයෙන් ඉවත් වී සුපිළිපන් සමාජයක් බවට පත් කිරීමේ හැකියාව මේ පනත ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙනු ඇති.**

කාලයේ අපට දකින්නට, අසන්නට ලැබුණා. මෙහි උච්චතම අවස්ථාවක් ලෙස හිටපු ජනාධිපතිවරයකුගේ සමීපතම නිලධාරියකු කොළඹ සුඛෝපභෝගී හෝටලයක රථවාහන නැවතුම් ස්ථානයකදී අල්ලස් ගැනීමටකට හසුවීම පෙන්වා දෙන්නට පුළුවන්. ඒ අනුව අපට පෙනී යනවා අල්ලස සහ දූෂණය කෙතරම්දුරකට මේ සමාජ දේහයේ ව්‍යාප්ත වී තිබෙනවා? යන්න. ලෝකයේ අනෙකුත් රටවල් සමග තරගකාරී ව ගමන් කළ යුතු සංවර්ධන කාර්යය ප්‍රමාද වීමටත් එය ප්‍රධාන හේතුවක්.

මේ පනතේ බලපෑම ශ්‍රී ලංකාවේ ඕනෑ ම ස්ථානයකටත් ශ්‍රී ලංකා සීමාවේ පවතින ගුවන් කලාපයටත් බල පැවැත්වෙනවා. ඒ අනුව ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානයක්, නැවක්, බෝට්ටුවක් තුළ සිදු වන එවැනි ක්‍රියාවකටත් බලපෑම් කිරීමට පුළුවන්. ශ්‍රී ලංකාවේ බල සීමාවෙන් පිටත ශ්‍රී ලංකාවට අයිති සියලු ම පාර්ශ්වකරුවන්, ආයතන කෙරෙහි මෙහි බලපෑම තිබෙනවා. එම නිසා මේ පනත පවතින්නේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වුවත් දූෂණයට එරෙහි ව විශ්වයට ම බලාත්මක වන පරිදි ක්‍රියාත්මක කළ හැකි මට්ටමක.

**ප්‍රශ්නය: දූෂණ විරෝධී පනතෙන් ආවරණය කෙරෙන වපසරිය කුමක්ද?**

පිළිතුර: අල්ලස හා දූෂණය සම්බන්ධ විමර්ශනවලදී එතෙක් පැවතුණු අවකාශයට වඩා පුළුල් අවකාශයක් ලබා දීමට 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත හඳුන්වා දීමෙන් හැකි ව තිබෙනවා. අල්ලස සහ දූෂණය වැළැක්වීමෙන් සමාජය යහපත් තැනකට ගෙන ඒමත් සමාජ දේහය යහපත් සිවිල් සමාජයක් බවට නවීකරණය කරන්නේ, දූෂණය වළක්වා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම තහවුරු කරන්නේ කෙසේද? යන්න පිළිබඳවත් මෙහි අවධානය යොමු කෙරෙනවා. රාජ්‍ය හා පෞද්ගලික අංශවල පාරදෘශ්‍යභාවය පවත්වා ගැනීමත් පාලනයේදී

පිළිපන්භාවය හා වගවීම පවත්වාගෙන යාමත් මහජන විශ්වාසය ගොඩනැගෙන ආකාරයෙන් රාජ්‍ය දේහය ශක්තිමත් කිරීමට සහ දූෂණයට විරෝධී ව මහජන සහභාගිත්වය වර්ධනය කිරීම හා සංවිධානය කිරීමත් මෙහි අපේක්ෂිත කාරණා. ඒවාට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පනත ඔස්සේ පියවර ගනු ඇති.

**ප්‍රශ්නය: දූෂණ විරෝධී පනතේ අන්තර්ගතය පිළිබඳ ව කෙටියෙන් හා සංක්ෂිප්ත ව හඳුනා ගැනීමක් සිදු කළහොත්?**

පිළිතුර: 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ iii වැනි කොටසේ විනිශ්චයකාරවරුන්ට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, පළාත් සභා මන්ත්‍රීවරුන්ට, නගර සභා මන්ත්‍රීවරුන්ට, පොලිසියට, රාජ්‍ය නිලධාරීන්ට, පුද්ගලික අංශයට, විදේශිකයන්ට, ව්‍යාපාරවලට, ක්‍රීඩා ඉසව්වලට යනාදී වශයෙන් විශාල කාණ්ඩ ගණනාවක් ඉදිරිපත් කරමින් සිදුවන අල්ලස් හා දූෂණ පනතෙන් වැරදි බවට පත් කර තිබෙනවා. මා කලින් සඳහන් කළ ආකාරයට අල්ලස සහ දූෂණයෙන් තොර සමාජයක් බවට ඉහළට එසවීමේ අරමුණින් ක්‍රියාත්මක වීමට මේ පනතෙන් ස්වාධීන කොමිෂන් සභාවක්, අධ්‍යක්ෂ ජනරාල්වරයෙක්, විමර්ශන ඒකකයක් පත් කෙරෙනවා. වත්කම් බැරකම් ප්‍රකාශනයට මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියක් හඳුන්වා දීමත් සිදු වෙනවා. මෙහි තවත් වැදගත්කමක් වන්නේ දූෂණ විරෝධී පනතේ දක්වා ඇති වැරදි මුල් අවස්ථාවේදී ඇප ලබා නොදිය හැකි වැරදි බවට සඳහන් කිරීම. එමෙන් ම තමන්ගේ කලත්‍රයාට එරෙහි ව පවා සාක්ෂි දීමට මේ පනතේ හැකියාව තිබෙනවා.

දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ ඇතැම් විධිවිධාන සහ වෙනත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මත, ප්‍රමිති සහ ප්‍රශස්ත පරිච සියල්ල ආවරණය කරන පරිද්දෙන් මේ පනත

> නීති විරෝධී හෝ වැරදි සහගත ලාභයක් ලබන්නේනම් හෝ, තමන්ට හෝ වෙනත් අයකුට වාසි සහගතමය තත්ත්වයක් ඇති කර ගන්නේනම් එම ක්‍රියාව වැරදි සහගත බව හෝ, වෙනත් අයකුට අවාසි සහගත වන බව දන්නේනම් එම තැනැත්තා තමන්ගේ ධුරය දරමින් එම ක්‍රියා සිදු කරන්නේනම් හෝ එය දූෂණයක් බවට පත් වෙනවා. පනතට අනුව වැරදිසහගත ක්‍රියාවක් සිදු කිරීම ම පමණක් නොව අනුදැනුමක් සහිත ව ඊට එරෙහි නොවී නිශ්ශබ්ද ව සිටීමත් වැරදිකරුවකු වීමට හේතුවක්.

සකස් කිරීම වැදගත්. සමස්තයක් වශයෙන් ගත් විට අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා මේ නීතිය ඉතාමත් සංවිධිතාකාරයට සකස් කර තිබෙනවා.

**ප්‍රශ්නය: - දූෂණ විරෝධී පනත සම්බන්ධයෙන් ජනතාවගේ දැනුවත් වීම හා සමාජ කතිකාව කුමන මට්ටමක ද පවතින්නේ?**

පිළිතුර: සාමාන්‍ය ජන ජීවිතයේ නීතිය ඉගැන්වීමක් කිසි විටෙක දකින්නට නැහැ. එම නිසා සෑම පුද්ගලයකුට ම නීතිය සම්බන්ධයෙන් සමාන දැනුමක් තිබෙන බව සිතිය නොහැකියි. එහෙත් ජනතාව නීතිය ගැන දැනගත යුතුයි. නීතිය සම්බන්ධයෙන් අවදි වීමක් තිබිය යුතුයි. එසේ නොවන විටෙක එය රටකට අවාසිසහගත තත්ත්වයක් බවට පත් වෙනවා. ඒ, මෙරට නීතියේදී සාධාරණ සැකයකින් තොර ව නඩුවක් ඔප්පු කළ යුතු වෙනවා යමකු වරදකරුවකු කිරීමටනම්. එහිදී අධිකරණ මනස එම කාරණය සම්බන්ධයෙන් 100%ක් නිරවද්‍ය ව ක්‍රියාත්මක වීම අවශ්‍ය වෙනවා. එහෙත් යමකු යම්කිසි වරදක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් විට එම අත්අඩංගුවට ගත් චෝදනාවේ කාරණාවට අනුව මහජනතාව නීතිය හරිහැටි නොදැනීම නිසා නොයෙකුත් නිගමනය කිරීම්, අර්ථකතන ලබා දීම්, කියැවීම්, තීරණ කල්තියා සිදු කිරීම සහ සමාජ මාධ්‍යවල නඩු සම්බන්ධයෙන් පෞද්ගලික මත පළ කිරීම් නීතිය ක්‍රියාත්මක කිරීමේදී අනිසි ලෙස බලපාන්නට පුළුවන්. මෙය නීතිය පිළිබඳ ජනතාවගේ පවතින දැනුවත්භාවය පිළිබඳ සාකච්ඡා කිරීමේදී ප්‍රධාන ලෙස සැලකිලිමත් විය යුතු කාරණාවක්. එසේ ම සමාජ කතිකාව පිළිබඳ පොදුවේ සැලකීමේදී මහජනතාව අල්ලස සහ දූෂණයට විරුද්ධයි.

**ප්‍රශ්නය: රජයේ ඉදිරි දැක්ම කරා ගමන් කිරීමට දූෂණ විරෝධී පනතෙන් ලැබෙන පිටිවහල කුමක්ද?**

පිළිතුර: වත්මන් රජය විසින් හඳුන්වා දෙන ලද Clean Sri Lanka වැඩසටහනෙන් අපේක්ෂා කරන්නේ පරිසරයේ පමණක් නොව මේ සමාජ දේහය ම වසාගෙන තිබෙන කිලිටි සම්පූර්ණයෙන් ඉවත් කිරීම. මේ පනතෙන් ඒ සඳහා දැනුවත්භාවය ලබා දෙනවා යහපත් හා ශිෂ්ටසම්පන්න සමාජය ගොඩ නැගීමට. ඒ අනුව සමාජය වංචාවෙන්, දූෂණයෙන් ඉවත් වී සුපිළිපන් සමාජයක් බවට පත් කිරීමේ හැකියාව මේ පනත ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙනු ඇති.

සාකච්ඡාව හා සටහන
**බිනූ දිලාරා ගමගේ**



# සතුන් ගණනය

නිරෝෂි දොඹගහගේ

මෙරට ආහාර බෝග වගාවලට සිදුවන වන සත්ත්ව හානි අවම කිරීම සඳහා නිර්දේශ සකස් කිරීමේ කමිටු වාර්තාව නොබෝද එළිදැක්වුණා. මේ කමිටුව ස්ථාපිත කරන ලද්දේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින්. 'කෘෂිකාර්මික බෝග සඳහා හානි සිදු කරන වන ජීවීන් පිළිබඳ ජාතික සංගණනය' 2025 මාර්තු මස 15 දින දීප ව්‍යාප්ත ව පැවැත්වුණේ මේ කමිටුවෙහි තීරණයක් ලෙස. කමිටු වාර්තාව අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 340ක රිලවා, වඳුරා, මොනරා සහ දඬුලේනා ලෙස සංගණනයට ලක් වූ මුළු සතුන් ගණන 13,897,515ක්.

මේ සංගණන ප්‍රතිඵල සත්‍යායනයේදී වඳුරන් හා රිලවුන් සම්බන්ධ ව මෙරට ප්‍රජාව ලබාදී ඇති තොරතුරුවල සත්‍යතාව 50%ක මට්ටමක පවතින බවයි කමිටු වාර්තාවෙහි දැක්වෙන්නේ. අදාළ සත්ත්ව කාණ්ඩයේ පැතිරීම, අවදානම් කලාප හඳුනාගත හැකි ලෙස ප්‍රදේශ අනුව සිතියම්ගත කර ඇත්තේ මේ සත්‍යායනයෙන් අනතුරු ව.

බෝග වගාවලට හානි කරන සතුන්ගේ ගහනය සහ එම වන සතුන් ඇති කරන උවදුරු පාලනය සඳහා භාවිත කළ හැකි උපක්‍රම පිළිබඳ ගොවියන්, පරිසරවේදීන් සහ විද්වතුන් ඇතුළු සියලු ම පුරවැසියන්ගෙන් අදහස් හා යෝජනා කැඳවීමක් ද කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් සිදු කරනු ලැබුවා. ඒ, සියලු පාර්ශ්වල අදහස් විමසා බලා මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට. එම පාර්ශ්ව ලබා දී ඇති යෝජනා මේ වන විටත් ප්‍රමුඛතාව අනුව පෙළ ගස්වා විශ්ලේෂණය කර ඇති බව එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන) ආර්.ඩී. චිත්‍රනයනා පවසනවා.


විදුලි වැට, ජෛව වැට, සූර්ය බල වැට, එල්ලෙන වැට, මී මැසි හඬ සහිත වැට යනාදී ලෙස ආරක්ෂක වැට යෙදීම, වන සත්ත්ව මාර්ග ඇති කිරීම හා ඒවා සංරක්ෂණය මේ ගැටලුවට වැඩි පිරිසක් විසඳුම් ලෙස කර තිබෙන යෝජනා. මීළඟට ප්‍රමුඛතාව ලැබී ඇත්තේ උපත් පාලනය හා වන්ධ්‍යකරණයට. තෙවැනි ව සතුන්ට අවශ්‍ය ආහාර හා ජලය සැපයීම (සතිපොළ ආර්ථික මධ්‍යස්ථානවලින් ඉවතලන ආහාර සතුන්ට ලබා දීම ආදී).


ඉඩම් කැබලි කිරීම පාලනය, බලෙන් ආක්‍රමණය කරගත් බිම් නැවත අත්පත් කර ගැනීමෙන් සත්ත්ව වාස භූමි සංරක්ෂණය, වන බිම් වැඩි කිරීම, ඉඩම් කළමනාකරණය, වනාන්තරවල සිදුවන නීති විරෝධී ක්‍රියා වැළැක්වීම, අධි ආරක්ෂිත කලාප පිහිටුවීම, තෘණ භූමි ඇති කිරීම හා වන විනාශය වැළැක්වීම වැනි යෝජනා ද ඊට ඇතුළත්. සතුන් මැරීම, දඩයම් කිරීම, මස් පරිභෝජනය, මස් ප්‍රවාහනය යනාදී කාරණා සහ වන විනාශය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වන අණපනත් සංශෝධනය, නව නීති සම්පාදනය වැනි යෝජනාත් මෙලෙස එම පාර්ශ්ව ඉදිරිපත් කර තිබෙනවා.


අඩු මුදලට හෝ බලපත්‍ර සහිත ව වායු රයිපල් ලබාදීම, ප්‍රාදේශීය බෝග ආරක්ෂණ කමිටු පිහිටුවීම, ආරක්ෂක අංශවල රජයේ බලය පැවරූ නිලධාරීන් ග්‍රාමාරක්ෂකයන්ගේ දායකත්වයෙන් පාලනයක් සහිත ව සතුන් මැරීම මෙන් ම ආලෝකය, ලේසර් පරාවර්තක, ශබ්දය, චලන සංඛ්‍යාත, සංගීතය වැනි සන්නිවේදක භාවිතය යනාදිය ප්‍රමුඛතාව අනුව පෙළ ගැස්විය හැකි තවත් යෝජනා.


සියලු කරුණු සලකා බලා මේ සම්බන්ධයෙන් ඉදිරි විසඳුම් තීරණය කිරීමට ජනාධිපති ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් ද 'වන සතුන්ගෙන් සිදුවන වගා හානි නිසා ජන ජීවිතයට සිදුවන හානි කළමනාකරණය සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව' පත් කර තිබෙනවා. මෙය සමන්විත වන්නේ ජනාධිපති කාර්යාලය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශ්වවිද්‍යාල, ත්‍රිවිධ හමුදාව නියෝජනය කරන සාමාජිකයන් 20 දෙනකුගෙන්. වන සතුන්ගෙන් වගාවලට සිදුවන හානි කළමනාකරණය සම්බන්ධයෙන් කඩිනම් විසඳුමකට යාමේ කඩිනම් අවශ්‍යතාව දැනටමත් මේ කමිටුව සමාලෝචනය කර තිබෙනවා. කෙටිකාලීන, මධ්‍යකාලීන, දිගුකාලීන ලෙස තිරසර විසඳුමක් සහිත ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත්තේ ඒ අනුව. එම ක්‍රියාකාරී සැලැස්ම ඉතා කෙටි කලකින් සකස් කෙරෙනු ඇති බවයි අතිරේක ලේකම් හා ජාතික ක්‍රියාකාරී මෙහෙයුම් කමිටුවේ කැඳවුම්කරු ආර්.ඩී. චිත්‍රනයනා පවසන්නේ.

මේ ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජික කොළඹ විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය සම්පත් සෙනෙවිරත්න අදහස් දක්වන පරිදි වන සතුන්ගෙන් වගා හානි සිදුවීමේ ගැටලුව වර්තමානයට පමණක් සීමා වූවක් නොවෙයි. මිනිසා පරිසරය සමග ගැටීම ගොවිතැනට හුරුවූ මුල් කාලයේ සිට













ම ආරම්භ වූවක්. එම ගැටුම ධනාත්මක මෙන් ම විටෙක සෘණාත්මකයි. වගාවට අවැසි වන ලෙස පරිසරය සූදානම් කර ගැනීමට පස සාරවත් කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ගවලින් ශාක හා සතුන්ට හිතකර පරිසරයක් ඒ අවට ගොඩනැගීමෙන් පරිසරයට ධනාත්මක බලපෑමක් සිදුවෙනවා. මේ නිසා සතුන්ගේ මෙන් ම ශාකවල ආක්‍රමණවලට ගොවි බිම් ලක් වීම සාමාන්‍ය තත්ත්වයක්. එබැවින් අතීතයේ පටන් ම ගොවියා එම සතුන් හා ශාක සම්බන්ධයෙන් යම් පාලනයක් සිදු කළා.

වර්තමානයේදී මේ ගැටලුව බරපතළ වී තිබෙන්නේ කැළෑ ඉඩම් ගොවියන් සහ ව්‍යාපාරිකයන් අනවසරයෙන් අත්පත් කර ගැනීමට උත්සාහ දැරීම මත වනාන්තර විනාශ කිරීමෙන් පරිසර සමතුලිතතාව බිඳවැටීමේ ප්‍රතිඵලයක් ලෙස. රජයේ ඉඩම් බලපත්‍ර අවභාවිත කිරීමේ මේ තත්ත්වය වියළි කලාපයේ වැඩි වශයෙන් දක්නට ලැබෙනවා. ඇතැම් ප්‍රදේශවල මේ ක්‍රියාවලියට දේශපාලනඥයන් හා රාජ්‍ය නිලධාරින්ගේ මැදිහත්වීමත් තිබෙනවා. වන සතුන්ට වාසස්ථාන අහිමි වී තිබෙන්නේ මේ කාරණා නිසා. එනම් එවැනි මානව ක්‍රියා නිසා වාසස්ථාන ඛණ්ඩනය වී තිබෙනවා. සතුන් ආහාර වෙනුවෙන් හෝ අනෙකුත් සීමිත අවශ්‍යතා වෙනුවෙන් වගා බිම්වලට කඩා වදින තත්ත්වයක් උද්ගත වී




තිබෙන්නේ මේ නිසා. මෙවැනි පසුබිමක සතුන් විශාල සංඛ්‍යාවක් ගොවියන් අතින් ඝාතනයට ලක්වනවා. ඒ අනුව අනීතික නිලධාරිවාදය, අනීතික ව්‍යාපාරික ප්‍රජාව, අනවශ්‍ය දේශපාලන බලපෑම් සහ ගොවි ජනතාවගේ නොසැලකිල්ල යන කරුණු මෙරට වන සතුන්ගෙන් වගා හානි සිදුවීමේ ගැටලුව උග්‍ර වීම කෙරෙහි බලපා තිබෙන බව නිරීක්ෂණය කළ හැකියි.

මෙයට කෙටිකාලීන ව ගත හැකි ක්‍රියාමාර්ග දෙයාකාර වන බවයි මහාචාර්ය සම්පත් සෙනෙවිරත්න පවසන්නේ. වගාවලට හානි කරන පළිබෝධ විශේෂ ශ්‍රී ලංකාවේ සම ව පැතිරී නැහැ. එක් එක් ප්‍රදේශවල පැතිරී ඇත්තේ වෙනස් පළිබෝධ. රටේ බව බෝග ව්‍යාප්තියත් සමාන නැහැ. මේ නිසා ඒ ඒ පළාත්වල බෝග ව්‍යාප්තිය සහ පළිබෝධ විශේෂ අතර ඇති සබඳතාව මෙහිදී හඳුනාගත යුතු වනවා.

අදහස් දක්වන මහාචාර්ය සම්පත් සෙනෙවිරත්න; "පළමු ව රිලවා, වඳුරා, අලියා වැනි වන සතුන්ට ආහාර ලබාදීම ජනතාව සම්පූර්ණයෙන් ම නවතා දැමිය යුතුයි. රතිඤ්ඤා යනාදිය භාවිත කරමින් සතුන් වගා බිම්වලින් පලවා හැරීම කළ යුත්තක්. අනීතික ලෙස අත්පත් කරගෙන තිබෙන ඉඩම් නැවත සතුන්ගේ භාවිතය වෙනුවෙන් වෙන් කළ යුතුයි. තවත් පියවරක් වන්නේ සත්ත්ව ගහන පාලනය වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම. මේ මොහොතේ අප සිටින්නේ ගැටලුවට මුහුණ දී තිබෙන කලාප හඳුනා ගැනීමේ අදියරේ. ඕස්ට්‍රේලියාව කැන්ගරුවන් මරා දැමීම, ඇමරිකාව මුවන් මැරීම යනාදී ලෝකයේ වෙනත් රටවල සිදුවීම් පූර්වාදර්ශ ලෙස ගෙන සතුන් මරා දමා ගහනය පාලනය අපේ සංස්කෘතියට අනුකූල වන්නේ නැහැ. එය ක්‍රියාත්මක වනවානම් ක්‍රියාත්මක විය යුත්තේ අවසාන විකල්පය ලෙස."

ස්වාභාවික සම්පත් හා වන ජීවීන් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම උරුමයක්. රටේ සංචාරක කර්මාන්තයෙහි අරටුව ලෙස ක්‍රියා කරන්නේ මේ උරුමය. රටේ ජනතාවගෙන් ලක්ෂ දෙකක පමණ පවුල් සෘජු ව ම තමාගේ ජීවිකාව සරි කර ගන්නේ සංචාරක ව්‍යාපාරයෙන්. වන සතුන් වගා හානි කිරීම ගොවියන්ට ගැටලුවක් වුවත් සංචාරක කර්මාන්තයේ නියැළෙන්නන්, පරිසරවේදින්, පරිසර සමතුලිතතාව සහ රටේ උරුමය සලකා බැලූ කල වන ජීවීන්ට ලැබෙන්නේ ප්‍රමුඛස්ථානයක්. මේ නිසා මේ ගැටලුව දෙස අප බැලිය යුත්තේ මධ්‍යස්ථ ව.

# ඊශ්‍රායල ඉරාන ආක්‍රමණය සහ ලෝක සාමය



**රමිඳු පෙරේරා**

ඊශ්‍රායලය විසින් 2025 ජුනි මස 13 දින අනපේක්ෂිත ලෙස ඉරානයට එල්ල කරනු ලැබූ ප්‍රහාරයත් සමග ඇති වූ යුදමය තත්ත්වය මේ වනවිට යම් තරමකට සමනය වී තිබෙනවා. මේ ගැටුම තීව්‍ර වූයේ ජුනි 21 දින ඇමරිකා එක්සත් ජනපදය විසින් ඉරානයේ න්‍යෂ්ටික යටිතල පහසුකම් ව්‍යුහ ඉලක්ක කොටගෙන සිදු කරනු ලැබූ ප්‍රහාරයත් සමග.

ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රහාරවලට එකට එක කිරීමක් ලෙස ඉරානය අසල්වැසි කටාර් රාජ්‍යයේ පිහිටුවා තිබෙන එක්සත් ජනපදයේ හමුදා කඳවුරකට මිසයිල ප්‍රහාරයක් දියත් කළා. මේ වන විට ගැටුම නතර වී තිබුණත් මේ රටවල් අතර විශේෂයෙන් කලාපීය වශයෙන් ඊශ්‍රායලය සහ ඉරානය අතරත් ගෝලීය වශයෙන් එක්සත් ජනපදය සහ ඉරානය අතරත් දැඩි පසමිතුරුතාවක් පවතින පසුබිමක නැවත ගැටුම් ඇති වේ ද? යන්න පිළිබඳ නිශ්චිත සහතිකයක් ලබා දිය නොහැකියි.

ඉරානයට ඊශ්‍රායලය පහර දීම සිදු කළේ ඉරානය න්‍යෂ්ටික ආයුධ අත්පත් කරගැනීමට සූදානම් බවට පවසමින්. ඉරානයේ න්‍යෂ්ටික වැඩපිළිවෙළට විශාල ඉතිහාසයක් තිබෙනවා. එරට ආණ්ඩුව ප්‍රකාශ කරන්නේ තමන් න්‍යෂ්ටික බලශක්තිය සංවර්ධනය කරන්නේ සාමකාමී අරමුණු සඳහා බව. එහෙත් න්‍යෂ්ටික වැඩපිළිවෙළ ආරම්භ කළ කාලයේ සිට ම එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර හවුලේ කොටස් ඊට විරුද්ධත්වය පළ කළා. මේ අනුව ඉරානයට එරෙහි ව කලින් කලට සම්බාධක පැනවීම ද සිදු වුණා.

2015 වර්ෂයේදී ඉරානයේ න්‍යෂ්ටික බලශක්ති වැඩපිළිවෙළ සම්බන්ධ ව යම් එකඟතාවකට පැමිණීමට පුළුවන්කම ලැබුණා. එහි ප්‍රතිඵල ලෙස න්‍යෂ්ටික බලශක්ති සංවර්ධනය යම් සීමාවක පවත්වා ගැනීමට ඉරානය එකඟ වුණා. මීට හිලව්ව ලෙස එක්සත් ජනපදය අනුමැතිය පළ කළේ ඉරානය මත වූ සම්බාධක ලිහිල් කිරීමට.

2016 වර්ෂයේදී ට්‍රම්ප් ජනාධිපතිවරයා බලයට පත්වීමෙන් පසුව මේ එකඟතාවෙන් ඒකපාර්ශ්වීය ලෙස ඉවත්වීමට එක්සත් ජනපදය ක්‍රියා කළා. ඉරානය චෝදනා කරන්නේ 2015 එකඟතා රාමුවේ තමන් ක්‍රියා කළ බවත් තම රටේ න්‍යෂ්ටික පාදක ව්‍යුහවලට නොබෝද කළ ප්‍රහාරය මේ නිසා පැහැදිලි ආක්‍රමණික යුද්ධයක් ස්වරූපය ගන්නා බවත්.

ඊශ්‍රායලය, ඉරානය හා එක්සත් ජනපදය යන රටවල් ත්‍රිත්වය අතර ඇති ව තිබෙන මේ ගැටුම න්‍යෂ්ටික ආයුධ සම්බන්ධ ප්‍රශ්නයක් ලෙස මුලින් දිස් වුවත් එහි මූල ඊට වඩා ගැඹුරුයි. මැද පෙරදිග යනු එහි තිබෙන තෙල් සම්පත නිසා උපායමාර්ගික ලෙස ලෝක බලවතුන්ට වැදගත් කලාපයක්. මේ නිසා විශේෂයෙන් බටහිර හවුලේ රටවල් එම කලාපය සිය ආධිපත්‍යයික සීමාවේ තබා ගැනීමට නිතර ම උත්සාහ කළ බව නොරහසක්. මේ කලාපයේ ඇමරිකානු විරෝධී ආණ්ඩු ඇති වීම වැළැක්වීම එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණක්.

මැද පෙරදිග කලාපයේ බොහෝ රටවල ආණ්ඩු එක්සත් ජනපදයට හිතෛෂී පිළිවෙතක නියුක්ත ව සිටිනවා. මේ බොහෝ රටවල් රාජාණ්ඩු. සෞදි අරාබිය, කටාරය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය බඳු රටවල් බටහිර හවුල සමග සමෝධානයක පසුවනවා. ඉරානය මේ මොහොතේ ඉටු කරමින් සිටින භූමිකාව වැදගත් වන්නේ මෙවැනි පසුබිමක. ඉරානයේ සුවිශේෂත්වය නම් 1979 ඉස්ලාමීය විප්ලවය සිදු වූ යුගයේ සිට ඇමරිකාව සම්බන්ධ විවේචනාත්මක ප්‍රතිපත්තියක් නඩත්තු කිරීම. මේ නිසා ඉරානය එක්සත් ජනපදයේ දැඩි විරෝධයට ලක් ව තිබෙන රටක් බවට පත් ව තිබෙනවා.

අනෙක් අතට ඊශ්‍රායලය යනු මැද පෙරදිග කලාපයේ එක්සත් ජනපදයේ ප්‍රබලතම සහයක රාජ්‍යය. ඓතිහාසික පලස්තීන රාජ්‍යය දෙකඩ කොට 1940 ගණන්වල බටහිර හවුලේ රටවල



අනුග්‍රහය සහිත ව නිර්මාණය කළ ඊශ්‍රායල රාජ්‍යය ආරම්භයේ සිට ම බටහිර හවුලේ ආධිපත්‍යය සඳහා උපකාර කරන කොලනියක් ලෙස ක්‍රියා කළා. මීට ප්‍රතිඋපකාර ලෙස ප්‍රබල මිලිටරි බලයක් ලෙස වර්ධනය වන්නට ඊශ්‍රායලයට උදවු ලැබී තිබෙනවා. නොබෝදා ඉරානයට ඊශ්‍රායලය පහර දුන් විට එක්සත් ජනපදය වහා මැදිහත්වීමෙන් ද පෙන්නුම් කරන්නේ බටහිර හවුල විශේෂයෙන් එක්සත් ජනපදය හා ඊශ්‍රායලය අතර තිබෙන සුවිශේෂ සම්බන්ධතාවේ ස්වරූපය.

ඉරානයට ඊශ්‍රායලය විරුද්ධත්වය දක්වන්නේ හුදෙක් බටහිර හවුල ඉරාන ආණ්ඩුවට විරුද්ධ නිසා පමණක් නොවෙයි. ඉරානය හමුදා බලයක් ලෙස ගොඩනැගීම ඊශ්‍රායලය කලාපයේ පවත්වාගෙන යන අධිකාරියට අභියෝග යක්. ලෝකය අබියස ප්‍රකාශ නොකළත් ඊශ්‍රායලය සතු ව න්‍යෂ්ටික ආයුධ පවතින බව සැලකෙනවා. ඉරානය න්‍යෂ්ටික බලවතකු බවට පත්වීම යනු කලාපයේ බලතුලනය මූලධාර්මික ලෙස වෙනස්වීමට හේතුවක්.

එමෙන් ම පලස්තීනයේ ක්‍රියාත්මක ඊශ්‍රායල විරෝධී හමාස් සංවිධානයට ප්‍රමුඛතම සහයෝගය ලැබෙන්නේ ඉරානය වෙතින්. ඊශ්‍රායලය විසින් ගාසා තීරයේ සිදු කරනු ලබන අතිදැවැන්ත මනුෂ්‍ය සංහාරය අබියස බොහෝ අරාබි රටවල් තීරණාත්මක යමක් සිදු නොකොට සිටින විට හමාස් සංවිධානය වෙත ද්‍රව්‍යමය හා මිලිටරි ආධාර ලබදෙමින් අඛණ්ඩ ව පෙනී සිටියේ ඉරානය. එසේ ම මැද පෙරදිග කලාපයේ තමන්ට හිතවත් මිලිෂියා කණ්ඩායම් ගණනාවක් ඉරානය නිර්මාණය කොට තිබෙනවා. ලෙබනනයේ හිස්බුල්ලා සංවිධානය සහ යේමනයේ අන්සර් අල්ලා නොහොත් හූති කැරලි සංවිධානය මේ අතර ප්‍රමුඛ වන්නක්. මේ මිලිෂියා කණ්ඩායම් විවිධ ආකාරවලට ඊශ්‍රායල විරෝධී මෙහෙයුම්වලට සම්බන්ධ වී තිබෙනවා.

මේ අනුව අපට පෙනෙන්නේ ත්‍රිකෝණාකාර ගැටුමේ ගෝලීය පාර්ශ්වයක්; එනම් ඉරානය මෙල්ල



කිරීමට එක්සත් ජනපදයට තිබෙන වුවමනාව මෙන් ම කලාපීය පාර්ශවයක්; එනම් ඉරානය බලවත් වීමට ඊශ්‍රායලය දක්වන විරෝධය ද පවතින බව.

මේ ගැටුම ලෝක ප්‍රජාව අබියස වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කොට තිබෙනවා. එනම් අන්තර්ජාතික නීතිය සහ අන්තර්ජාතික පර්යාය කෙතරම්දුරට සාර්ථක ද යන ප්‍රශ්නය. අන්තර්ජාතික නීතිය යනුවෙන් යමක් පසුගිය සියවසේ වර්ධනය වූයේ රටවල් අතර ගැටුම් ප්‍රචණ්ඩ ස්වරූපයක් ගැනීම වළක්වනු පිණිස. විශේෂයෙන් මිලියන ගණනාවක් මිය ගිය දෙවැනි ලෝක යුද්ධයට පසුව, එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවන ලද්දේ ලෝක සාමය සඳහා. ආක්‍රමණික යුද්ධ තහනම් කරන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය, බලය යෙදවීමෙන් තොර ව රටවල් අතර ප්‍රශ්න විසඳා ගැනීම සඳහා විවිධ වූ යාන්ත්‍රණ සම්පාදනය කොට තිබෙනවා.

මේ සියල්ල නොතකා ඒකපාර්ශ්වීය ලෙස ඊශ්‍රායලය සහ එක්සත් ජනපදය විසින් ඉරානය ආක්‍රමණය කරනු ලැබීමෙන් අපට පෙනී යන්නේ අන්තර්ජාතික නීතිය බල රහිත වන ප්‍රධානතම හේතුව එම නීතියට යටත් නොවන අධි-බලවතුන්ගේ පැවැත්ම බව. එක්සත් ජනපදය වැනි රටක් අන්තර්ජාතික නීතිය කඩ කළ විට ඒ සම්බන්ධ ප්‍රතිවිපාක නැහැ. එම රටට සම්බාධක දැමිය හැකි රටවල් නැහැ. අනෙක් අතට නිෂේධ බලය නිසා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය බඳු පර්ෂදයකදී වුව ද මෙබඳු බලවතකුට එරෙහි ව ගත හැකි ක්‍රියාමාර්ගයක් නැහැ.

ලෝකවාසී ජනතාවට සාමය සහ සංවර්ධනය අවශ්‍ය ව තිබුණත් බලකාමී අරමුණුවලින් ප්‍රේරණය වූ එක්සත් ජනපදය සහ එහි හිතෛෂී ඊශ්‍රායලය බඳු රටවල් විසින් සිදුකරගෙන යනු ලබන අත්තනෝමතික, ඒකපාර්ශ්වීය ආක්‍රමණික හැසිරීම එම අවශ්‍යතාවට පටහැණි අතකට පිහිටනවා. ඊශ්‍රායල-එක්සත් ජනපද ඒකාබද්ධ ආක්‍රමණය හමුවේ එක්සත් ජාතීන්ගේ සංවිධානය කර කියා ගත නොහැකි තත්වයකට පත් වූ ආකාරයෙන් පෙන්නුම් කරන්නේ ලෝක සාමයට හා මිනිසාගේ ප්‍රගතියට මේ මොහොතේ බලවත් ම තර්ජනය එල්ල කරන සංරචකය අධිරාජ්‍යවාදී රටවල බල තණ්හාව සහ යුදකාමී න්‍යාය පත්‍රය බව.

# Axiom 4



**නිහාල් පීරිස්**

නො බෝද ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි අභ්‍යවකාශයට දුරකතන ඇමතුමක් ලබා දුන්නා. එහිදී ඔහු කතා කළේ පෘථිවියේ සිට කි.මී. 400ක් පමණ ඈත අභ්‍යවකාශයේ සිටි පුද්ගලයකුට. ඔහුගේ නම ශුභාංශු ෂුක්ලා.

ඉන්දියානු ජාතික අජටාකාශගාමියකු වන ඔහු ඒ වන විට සිටියේ ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය නමින් හැඳින්වෙන අභ්‍යවකාශ විද්‍යාගාරයේ. කි.මී. 400ක් ඉහළ අභ්‍යවකාශයේ රඳවා ඇති මේ විද්‍යාගාරය පැයට කි.මී. 28,000ක වේගයකින් පෘථිවිය වටා ගමන් කරමින් තිබෙන්නක්.

අභ්‍යවකාශයේදී මුලින්ම දැනුණු දේ ගැන අගමැතිවරයා විමසූ අවස්ථාවේ ෂුක්ලා දුන්නේ අපූරු පිළිතුරක්. අභ්‍යවකාශයේ සිට බලන විට රටවල් අතර දේශ සීමා කිසිවක් නොපෙනෙන බවත් මහ පොළොව ම එකම යායක් ලෙස එකට බැඳී සිටින ආකාරයක් දිස්වන බවත් ඔහු සඳහන් කළා. ෂුක්ලා තවදුරටත් සඳහන් කළේ ඉන්දියාව ඉතා ගම්භීර ආකාරයෙන් පෙනෙන බව.

ශුභාංශු ෂුක්ලා ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානට ගිය ගමන ඓතිහාසික ගමනක් ලෙස හැඳින්විය හැකියි. ඒ, මේ අභ්‍යවකාශ විද්‍යාගාරය වෙත යාමට වාසනාව හිමි කරගත් පළමු ඉන්දියානු අජටාකාශගාමියා ඔහු වන බැවින්.

ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය යනු ඇමරිකාවේ නාසා ආයතනය, යුරෝපා අභ්‍යවකාශ ඒජන්සිය, රුසියාවේ රොස්කොස්මොස් අභ්‍යවකාශ ආයතනය, ජපානයේ JAXA ආයතනය සහ කැනඩා අභ්‍යවකාශ ඒජන්සිය යන ආයතන විසින් පවත්වාගෙන යනු ලබන්නක්. ලෝකයේ විවිධ රටවල අජටාකාශගාමීන් වරින් වර මෙහි යමින් සති ගණන්, මාස ගණන් එහි රැඳී සිටිමින් විවිධ පර්යේෂණවල නිරත වනවා.

ශුභාංශු ෂුක්ලා මේ විද්‍යාගාරයට ගිය චාරිකාව ඉන්දියාව විසින් දියත් කරන ලද අභ්‍යවකාශ චාරිකාවක් නොව ඇමරිකානු අභ්‍යවකාශ සමාගමක් වන Axiom Space නැමැති පෞද්ගලික සමාගමක් විසින් දියත් කරනු ලැබූවක්. ඔවුන් මේ ගමන නම් කර තිබුණේ 'Axiom 4' යන නමින්. ෂුක්ලා මේ ගමන ගියේ තනි ව ම නොවීමත් විශේෂත්වයක්. තවත් රටවල් තුනක අජටාකාශගාමීන් තිදෙනකු ද ඊට එක් ව සිටියා.

ඔවුන් රැගත් යානය පෘථිවියෙන් පිටත් වූයේ ජූනි 25 දින. ජූනි 26 දින එම යානය ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය වෙත ළඟා වුණා. මේ ගමන සඳහා ඉන්දියාව ශුභාංශු ෂුක්ලා සහභාගි කරවූයේ Axiom Space සමාගමට විශාල මුදලක් ගෙවීමෙන්. එය ඉන්දියානු රුපියල් බිලියන 5ක්. ශ්‍රී ලංකා මුදලින් එය රුපියල් බිලියන 17කට ආසන්න වනවා.

ඉන්දියාව මේ ගමන වෙනුවෙන් මෙතරම් මුදලක් ගෙව්වේ එය ඉන්දියාවට ඉතා වැදගත් බැවින්. තව වසර කිහිපයකින් ඉන්දියාව ඔවුන්ගේ ම අභ්‍යවකාශ යානාවලින් අජටාකාශගාමීන් අභ්‍යවකාශයට යැවීමට සැලසුම් කර තිබෙනවා. එහි පළමු චාරිකාව දියත් කිරීමට නියමිත ව ඇත්තේ 2027 වසරේ. ඉන්දියාවේ අභ්‍යවකාශ කටයුතු භාර ව සිටින ඉන්දියානු අභ්‍යවකාශ පර්යේෂණ ආයතනය මේ ගමන නම් කර ඇත්තේ 'ගගන්යාන් 4' නමින්. මේ ගමනට අජටාකාශගාමීන් තුන් දෙනකු සහභාගි වනු ඇති අතර ෂුක්ලා ද ඒ අතර වනවා. ඔහු මේ කණ්ඩායමේ නායකත්වය දරන්නට බොහෝදුරට ඉඩ ඇති.

මේ චාරිකාවේදී අජටාකාශගාමීන් පෘථිවියේ සිට කි.මී. 400ක් පමණ ඉහළට ගමන් කිරීමට නියමිත අතර ඉන්පසු ඔවුන් දින 7ක් අභ්‍යවකාශයේ රැඳී සිටිනු ඇතැයි සඳහන්.

Axiom 4 චාරිකාවෙන් ෂුක්ලා අත්කර ගන්නා දැනුම සහ පුහුණුව ගගන්යාන් 4 චාරිකාවේදී බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇති බව කිව යුතු නැහැ. ෂුක්ලා සහ ඔහු සමග ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයට ගිය තුන් දෙනා සති




දෙකක කාලයක් එහි රැඳී සිටිමින් වැදගත් පර්යේෂණ 60කට ආසන්න සංඛ්‍යාවක් පැවැත්වීමට නියමිත ව තිබෙනවා. ඒ අතරින් පර්යේෂණ හතක් පවත්වන්නේ ඉන්දියානු අභ්‍යවකාශ පර්යේෂණ මධ්‍යස්ථානය වෙනුවෙන්. එය ද Axiom 4 චාරිකාවෙන් ඉන්දියාවට ලැබෙන ප්‍රතිලාභයක්.

ඉන්දියාව 2035 වනවිට තමන්ගේ ම අභ්‍යවකාශ විද්‍යාගාරයක් පිහිටුවීමටයි බලාපොරොත්තුව. එය ද පෘථිවියේ සිට කි.මී. 400ක් පමණ ඉහළින් පිහිටුවීමට සැලසුම් කර තිබෙන්නක්. ඉන්දියාව මෙය නම් කිරීමට යන්නේ Bharatiya Antariksha Station යන නමින්. මෙවර චාරිකාවෙන් ෂුක්ලාටත් ඉන්දියාවටත් ලැබෙන අත්දැකීම් මේ විද්‍යාගාරය පිහිටුවීමේදී ද ප්‍රයෝජනවත් වනු ඇති.

ශුභාංශු ෂුක්ලා සමග මේ ගමනට එක් වූ සෙසු අජටාකාශගාමීන් තිදෙනා වන්නේ පෙගි විට්සන්, ස්ලාවොස් උස්නාන්ස්කි-විස්නියෙව්ස්කි, ටිබෝර් කාපු යන තිදෙනා. විට්සන් ඇමරිකාවේ නාසා ආයතනයට සම්බන්ධ ඉතා පළපුරුදු අජටාකාශගාමිනියක්. ස්ලාවොස් පෝලන්ත ජාතික අජටාකාශගාමියකු වන අතර ටිබෝර් හංගේරියානු ජාතිකයෙක්.

මේ කණ්ඩායමේ නායකත්වය දැරුවේ විට්සන්. Axiom 4 චාරිකාවේදී යානයේ නියමුවා ලෙස ක්‍රියා කළේ ෂුක්ලා. එය ද ඉන්දියාවට ආඩම්බර විය හැකි කාරණයක්. ෂුක්ලා ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය වෙත ගොස් දෙදිනකට පසු පෘථිවියේ සිට ඔහු සමග කතා කළ අගමැති නරේන්ද්‍ර මෝදි මුලින් ම ඔහුට සිය සුබ පැතුම් පිරිනැමුවා. "අද ඔබ සිටින්නේ ඔබේ මව්බිමේ සිට ඉතා ම දුරින්. ඒ වුණත් සෑම ඉන්දියානුවකුගේ ම හදවතට ඔබ ඉතා ම සමීපයි" යනුවෙන් අගමැතිවරයා ඔහුට පවසා තිබෙනවා. මෝදි සහ ෂුක්ලා අතර ඇති වූ සංවාදය ඉතා හෘදයාංගම සංවාදයක් වුණා.

මෙහිදී ෂුක්ලා සඳහන් කළේ මේ ගමන තමා තනි ව පැමිණි ගමනක් නොවන බව. මෙය රට ම එක් ව පැමිණි ගමනක් බව ඔහු පැවසුවා. අගමැති මෝදි ෂුක්ලාගේ සෞඛ්‍ය තත්ත්වය ගැනත් විමසා සිටියා. ඉතා ස්තුති පූර්වක ව ෂුක්ලා පැවසුවේ තමා හොඳ සුවෙන් පසුවන බව. ඉන්දියානු ආහාරපාන තම සහෝදර අජටාකාශගාමීන් සමග බෙදා ගත්තා දැයි ද මෝදි ෂුක්ලාගෙන් ඇසුවා.

කැරට්වලින් සහ මුංඇටවලින් සාදන ලද රසවත් අතුරුපසක් තමා රැගෙන ආ බවත් සියලුදෙනා එය ඉතා ආසාවෙන් රස විඳි බවත් ෂුක්ලා පැවසුවා. මෙවැනි ආහාර තවත් රස විඳීමට ඉන්දියාවට පැමිණිය යුතු බව ඔවුන් පැවසුවේ යැයි ද ඔහු අගමැතිවරයා සමග කියා සිටියා.

අභ්‍යවකාශයේදී මුලින් ම දැනුණු දේ ගැන අගමැතිවරයා විමසූ අවස්ථාවේ ෂුක්ලා දුන්නේ අපූරු පිළිතුරක්. අභ්‍යවකාශයේ සිට බලන විට රටවල් අතර දේශ සීමා කිසිවක් නොපෙනෙන බවත් මහ පොළොව ම එකම යායක් ලෙස එකට බැඳී සිටින ආකාරයක් දිස්වන බවත් ඔහු සඳහන් කළා. ෂුක්ලා තවදුරටත් සඳහන් කළේ ඉන්දියාව ඉතා ගම්භීර ආකාරයෙන් පෙනෙන බව. එය සිතියම්වල පෙනෙනවාට වඩා විශාල ව දිස්වන බවක් ද ඔහු ප්‍රකාශ කළා. අගමැතිවරයා විනාඩි 18කට ආසන්න කාලයක් ෂුක්ලා සමග කතා කරමින් සිටි









# ලෝක සැරිසර

සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි



## ක්‍රිමියානු පාලමට ප්‍රහාරයක්

යුක්රේනයේ ආරක්ෂක සේවය (SBU) 2025 ජුනි 03 දින ක්‍රිමියානු පාලමට ප්‍රහාරයක් එල්ල කළා. ප්‍රහාරය පාලමේ දිය යට ආධාරක ඉලක්ක කර ගත් අතර SBU ප්‍රකාශ කළේ පාලම ආශ්‍රිත ව සිය නියෝජිතයන් මාස කිහිපයක් තිස්සේ කැණීම් කර ඇති බව සහ තමන් TNT කිලෝග්‍රෑම් 1,100කට සමාන පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණයක් භාවිත කළ බව. මේ මෙහෙයුම SBU ප්‍රධානී වාසිල් මැලියුක් පුද්ගලික ව සැලසුම් කර සම්බන්ධීකරණය කර ඇති බව වාර්තා වනවා. ප්‍රහාරයෙන් පසු, පාලම ජුනි 04 දින උදෑසන 7:00 දක්වා තාවකාලික ව වසා දැමුව ද එය යළි සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වූ බව නිල රුසියානු මාධ්‍යයක් වාර්තා කළා.

කර්ච් සමුද්‍ර සන්ධි පාලම, කර්ච් පාලම ලෙස ද ක්‍රිමියානු පාලම හැඳින්වෙනවා. මංතීරු හතරක මාර්ගයක් සහ ද්විත්ව දුම්රිය මාර්ගයක් ලෙස එය සමන්විත වන්නේ සමාන්තර පාලම් යුගලයකින්. රුසියාවේ ක්‍රස්නෝඩර් ක්‍රයිහි ටමාන් අර්ධද්වීපය සහ ක්‍රිමියාවේ කර්ච් අර්ධද්වීපය අතර කර්ච් සමුද්‍ර සන්ධිය පුරා එය විහිදී යනවා. 2014 වසර ආරම්භයේදී ක්‍රිමියාව ඈඳා ගැනීමෙන් පසු රුසියානු සමූහාණ්ඩුව විසින් ඉදිකරන ලද මේ පාලම සඳහා වැය වී ඇත්තේ ඇමරිකානු ඩොලර් බිලියන 3.7ක්. එහි දිග කිලෝමීටර 19ක් (සැතපුම් 12) වන අතර එය යුරෝපයේ දිග ම පාලම සේ ම රුසියාව විසින් ඉදිකරන ලද දිග ම පාලම ද වනවා. මීට පෙර 2022 ඔක්තෝබර් 08 දින පාලම මත විශාල පිපිරීමක් සිදු වූ අතර 2023 ජනවාරි 06 දින සහ 2023 ජූලි 17 දින අලුයම ද මෙහි පිපිරීම් සිදු ව තිබුණා.



## පෝලන්ත ජනාධිපතිවරණය

2025 මැයි 18 දින පෝලන්තයේ ජනාධිපතිවරණය පැවැත්වුණා. එහිදි කිසිදු අපේක්ෂකයකුට බහුතර ඡන්ද ප්‍රතිශතයක් නොලැබුණු බැවින් 2025 ජුනි 01 දින පෝලන්ත ඡන්දදායකයන් දෙවැනි වරටත් ඡන්දය ප්‍රකාශ කළා. එහිදී ජාතික අනුස්මරණ ආයතනයේ දක්ෂිණාංශික ජනප්‍රියවාදී සභාපති කැරොල් නව්රොකි, වත්මන් වෝර්සෝ නගරාධිපති රෆාල් ට්‍රසාස්කොව්ස්කිට වඩා ජනප්‍රිය ඡන්දවලින් 50.89%ක් දිනා ගන්නට සමත් වුණා. 1995 ජනාධිපතිවරණයෙන් පසු වැඩි ම අපේක්ෂකයන් සංඛ්‍යාවක් ඉදිරිපත් වූ මැතිවරණය මෙය වන අතර අපේක්ෂකයන් 13 දෙනකු මෙවර ජනාධිපති ධුරය සඳහා තරග කළා.



## එංගලන්තයේ දිග ම නඩුව

92 හැවිරිදි රයිලන්ඩ් හෙඩ්ලි, 1967 වසරේදී ලුයිසා ඩූන්ගේ ඝාතනය සම්බන්ධයෙන් වරදකරු බවට පත්වුණා. එය සැලකෙන්නේ එක්සත් රාජධානියේ මෙතෙක් විසඳා ඇති දීර්ඝතම නඩුව ලෙස.



## අධිකරණයේ අමුතු මැතිවරණය

මෙක්සිකෝ අධිකරණ ශාඛාවේ සාමාජිකයන් 2,700කට වැඩි පිරිසක් තෝරා පත් කර ගැනීම සඳහා ඉතිහාසයේ පළමුවරට එරට මැතිවරණයක් පැවැත්වුණා. මෙය මෙක්සිකෝ ඉතිහාසයේ පළමු අධිකරණ මැතිවරණය සනිටුහන් කළ අතර සියලු ම ජාතික විනිසුරුවරුන් මහජන ඡන්දයෙන් තේරී පත් වූ ලොව පළමු අවස්ථාව ලෙසත් මෙය සැලකෙනවා.

ශ්‍රේෂ්ඨාධිකරණය, අධිකරණ විනය විනිශ්චය සභාව සහ ෆෙඩරල් අධිකරණයේ මැතිවරණ විනිශ්චය සභාව ඇතුළු ප්‍රධාන ෆෙඩරල් අධිකරණ නියෝජනය කරමින් පාලක පක්ෂය වන ජාතික පුනර්ජනන ව්‍යාපාරය (මොරේනා) ප්‍රමුඛ ආසන සංඛ්‍යාවක් ලබා ගත්තා.

මේ මැතිවරණය එරට ප්‍රජාතන්ත්‍රවාදී ඉතිහාසයේ අඩු ම ඡන්ද භාවිතය වන අතර එය ආසන්න වශයෙන් 13%ක්. මේ නිසා ම ජාත්‍යන්තර නිරීක්ෂකයන් මෙය අමුතු, සංකීර්ණ සහ දේශපාලන බලපෑමට ගොදුරු වී තිබිය හැකි ක්‍රියාවලියක් බවට විවේචනය කළා.




## ලොස් ඇන්ජලීස් විරෝධතා

2025 ජුනි 6 දින ආගමන හා රේගු බලාත්මක කිරීමේ (ICE) නියෝජිතයන් එක්සත් ජනපදයේ නීතිවිරෝධී සංක්‍රමණවලට සම්බන්ධ බවට චෝදනා එල්ල වන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම සඳහා නගර කිහිපයක වැටලීම් සිදු කළා. ඊට එරෙහිවයි ලොස් ඇන්ජලීස්හි විරෝධතා

ආරම්භ වුණේ. විරෝධතාකරුවන් ලොස් ඇන්ජලීස් පොලිස් දෙපාර්තමේන්තුව (LAPD) සහ ICE සමග ගැටීමෙන් පසු ඇතැම් විරෝධතා කෝලාහල බවට පත්වුවත් බොහෝ විරෝධතා සාමකාමී ව පැවතුණා.

ජුනි 7 දින පැරාමවුන්ට් සහ කොම්ප්ටන්හි වැටලීම් අතරතුර විරෝධතාකරුවන් සහ ෆෙඩරල් නීතිය ක්‍රියාත්මක කරන නියෝජිතයන් ගැටුණා. ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ඊට ප්‍රතිචාර දැක්වූයේ කැලිෆෝනියා ජාතික ආරක්ෂක බළකාය ෆෙඩරල් සහ ඒකාබද්ධ කාර්යසාධක බලකාය 51 යටතේ නගරයට ආරක්ෂක සාමාජිකයන් 2,000ක් යෙදවීමට ඉල්ලා සිටිමෙන්. ඒ හේතුවෙන් ලොස් ඇන්ජලීස්හි විරෝධතා නිව්යෝර්ක්, චිකාගෝ සහ ඩලස් වැනි අනෙකුත් එක්සත් ජනපද නගරවලට ද පැතිර ගියා.




## කාන්තා ත්‍යාගය

ලන්දේසි-ඊශ්‍රායල ලේඛිකා යායෙල් වැන්ඩර් වූඩන් ඇගේ 'ද සේෆ්කීප්' නවකතාව වෙනුවෙන් 2025-ප්‍රබන්ධ සඳහා කාන්තා ත්‍යාගය දිනා ගත්තා. එය 2024 බුකර් ත්‍යාගය සඳහා ද කෙටි ලැයිස්තුගත කරන ලද්දක්. බ්‍රිතාන්‍ය වෛද්‍යවරියක සහ ලේඛිකාවක වන රේචල් ක්ලාක් ඇගේ 'සහන සත්කාර' පිළිබඳ පොත වන 'ද ස්ටෝරි ඔෆ් අ හාර්ට්' සඳහා ප්‍රබන්ධ නොවන කෘති සඳහා වන කාන්තා ත්‍යාගය දිනා ගන්නට සමත් වුණා.




## පුංචි උසේන් බෝල්ට්

උසේන් බෝල්ට් හා සංසන්දනය කරන 17 හැවිරිදි කෙටි දුර ධාවන තරුවක් වන ගෝට් ගවුට්, ඔහුගේ ම මීටර් 200 ඕස්ට්‍රේලියානු වාර්තාව බිඳ දැමීමට සමත් වුණා. විදේශයක පැවැති පළමු තරගයේදී ම තමාගේ මීටර් 200 ඕස්ට්‍රේලියානු වාර්තාව මෙලෙස ඔහු බිඳ දැමුවේ චෙක් ජනරජයේ ඔස්ට්‍රාවාහි පැවති ගෝල්ඩන් ස්පයික් තරගාවලියේදී.


17 හැවිරිදි ඔහු 2024 වසරේ දෙසැම්බර් මාසයේදී චෙක් ජනරජයේ ඔස්ට්‍රාවාහි පැවති ගෝල්ඩන් ස්පයික් තරගයේදී තමන් බිඳ දැමූ පෙර වාර්තාවෙන් තවත් තත්පර දෙසියයක් අඩු කරමින් තත්පර 20.02ක කාලයකින් මෙවර පළමු ස්ථානයට පත්වුණා. ගෝට් කියුබාවේ රේනියර් මේනාට වඩා තරමක් පිටුපසින් තරගයට අවතීර්ණ වුවත් අවසන් තීරක රේඛාවට ළඟා වන විට ඔහු කැපී පෙනෙන දුරක් පවත්වා ගන්නට සමත්වුණා.



## ලෙනින් බිම හෙළයි

මධ්‍යම ආසියාවේ උස ම ලෙනින්ගේ ප්‍රතිමාව ලෙස සැලකෙන මීටර් 23ක් උස සෝවියට් නායක ව්ලැඩිමීර් ලෙනින්ගේ ප්‍රතිමාව කිර්ගිස්තානය විසින් බිම හෙළනු ලැබුවා. කිර්ගිස්තානය සෝවියට් සංගමයේ කොටසක් ව පැවති සමයේ ප්‍රථම වරට ඉදිකරන ලද මේ ස්මාරකය, නිහඬ ව ඉවත් කිරීමට පෙර වසර 50ක් ඕෂ් නගරයට ඉහළින් පිහිටා තිබුණා. කසකස්තානයේ අල්මාටිහි පිහිටා තිබූ එය පෙර පිහිටා තිබුණේ ව්ලැඩිමීර් ලෙනින් චතුරශ්‍රය ලෙස ද නම් කරන ලද අස්තානා චතුරශ්‍රයේ.

මධ්‍යම ආසියාවේ උස ම ලෙනින්ගේ ප්‍රතිමාව ලෙස සැලකෙන මීටර් 23ක් උස සෝවියට් නායක ව්ලැඩිමීර් ලෙනින්ගේ ප්‍රතිමාව කිර්ගිස්තානය විසින් බිම හෙළනු ලැබුවා. කිර්ගිස්තානය සෝවියට් සංගමයේ කොටසක් ව පැවති සමයේ ප්‍රථම වරට ඉදිකරන ලද මේ ස්මාරකය, නිහඬ ව ඉවත් කිරීමට පෙර වසර 50ක් ඕෂ් නගරයට ඉහළින් පිහිටා තිබුණා.




## මුල්වරට ග්‍රහලොවක්

ජේම්ස් වෙබ් අභ්‍යවකාශ දුරේක්ෂය (JWST) විසින් එහි පළමු වැනි ග්‍රහලෝකය සොයා ගනු ලැබුවා. ඒ,

සෞරග්‍රහ මණ්ඩලයෙන් ඔබ්බට දන්නා ග්‍රහලෝක විමර්ශනය කිරීමට තාරකා විද්‍යාඥයන්ට වසර තුනක් පමණ උදව් කිරීමෙන් පසුව. TWA 7b ලෙස නම් කර ඇති මේ අලුත් බාහිර ග්‍රහලෝකය, සෞරග්‍රහ මණ්ඩලයෙන් ඔබ්බට සෘජු ව ම ඡායාරූපගත කර ඇති අඩු ම ස්කන්ධය සහිත ග්‍රහලෝකය බවයි කියැවෙන්නේ. පෘථිවියේ ස්කන්ධය මෙන් 100 ගුණයක්, බ්‍රහස්පතිගේ ස්කන්ධය මෙන් 0.3 ගුණයක් පමණ වන ඇස්තමේන්තුගත ස්කන්ධයක් සහිත TWA 7b පෙර සෘජු ව ම ඡායාරූපගත කරන ලද ඕනෑ ම බාහිර ග්‍රහලෝකයකට වඩා දස ගුණයකින් සැහැල්ලු වනවා.

TWA 7b සොයා ගත්තේ පෘථිවියේ සිට ආලෝක වර්ෂ 111ක් පමණ දුරින් පිහිටි අඩු ස්කන්ධ තාරකාවක් වන CE Antilae, වටා ඇති සුන්බුන් වළලු අතරින්. CE Antilae යනු ඉතා තරුණ තාරකාවක් වන අතර එය වසර මිලියන කිහිපයක් පමණක් පැරණි යැයි ගණන් බලා තිබෙනවා.



## ඉන්දියාවෙන් නව ඔත්තු චන්ද්‍රිකාවක්

ජාතික ආරක්ෂාවට තර්ජනය වන ආකාරයෙන් විදේශීය බලවේග චන්ද්‍රිකා තාක්ෂණයෙන් ඔත්තු බැලීමේ නිරතවීම නිරීක්ෂණය සඳහා ඉන්දියාව නව චන්ද්‍රිකාවක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබෙනවා. චන්ද්‍රිකා සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කර ඇති එම ව්‍යාපෘතියේ මූලික කාර්ය මේ වන විටත් අවසන්. විදේශීය රටවල් ඔත්තු බැලීම සඳහා භාවිත කරන චන්ද්‍රිකා හඳුනා ගැනීම සඳහා මෙවැනි චන්ද්‍රිකා ජාල ඇමරිකාව, රුසියාව සහ චීනය යන රටවල ද ක්‍රියාත්මක වනවා.



## ඊජිප්තුවට අලුත් අගනුවරක්

කයිරෝ අගනුවර දැඩි වාහන තදබදය සහ ජනාකීර්ණත්වය වැළැක්වීම සඳහා එහි සිට කිලෝමීටර් 45ක පමණ දුරින් නව අගනුවරක් ඉදි කරමින් පවතිනවා. එම අගනුවර 2027 වසරේදී විවෘත කිරීමයි නියමිත. වර්ග කිලෝ මීටර් 700ක් පමණ වන මෙහි රජයේ කාර්යාල, තානාපති කාර්යාල මෙන් ම මීටර් 386ක් උස කුලුනක් ද දක්නට ලැබෙනවා. මෙය තැනීමට ඇමරිකානු ඩොලර් බිලියන 3.8ක මුදලක් වැය වන බව සඳහන්. මේ සඳහා චීන බැංකුවකින් 85%ක් එනම් ඩොලර් බිලියන 22ක් සැපයෙනවා.

2025 මැයි 18 දින පෝලන්තයේ ජනාධිපතිවරණය පැවැත්වුණා. එහිදි කිසිදු අපේක්ෂකයකුට බහුතර ඡන්ද ප්‍රතිශතයක් නොලැබුණු බැවින් 2025 ජුනි 01 දින පෝලන්ත ඡන්දදායකයන් දෙවැනි වරටත් ඡන්දය ප්‍රකාශ කළා. එහිදී ජාතික අනුස්මරණ ආයතනයේ දක්ෂිණාංශික ජනප්‍රියවාදී සභාපති කැරොල් නව්රොකි, වත්මන් වෝර්සෝ නගරාධිපති රෆාල් ට්‍රසාස්කොව්ස්කිට වඩා ජනප්‍රිය ඡන්දවලින් 50.89%ක් දිනා ගන්නට සමත් වුණා.



'සියලු තැන්හි පවතින සෑම ආකාරයක ම දුගී බව අවසන් කළ යුතු ය.' යන්න තිරසර සංවර්ධනය සඳහා එක්සත් ජාතින්ගේ 2030 න්‍යාය පත්‍රයේ පළමු ඉලක්කය. එය කරා ගමන් කිරීමට ගෝලීය ප්‍රජාව ම එක් ව සිටිනවා. ශ්‍රී ලංකාව ද ඒ සඳහා පෙළ ගැසී සිටින බව තහවුරු වන්නේ වරින් වර දුගීභාවය තුරන් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණවලට එළඹෙමින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිසා. නොබෝදා 'ප්‍රජා ශක්ති' වැඩසටහන අරඹමින් වත්මන් ආණ්ඩුව ඊට අවශ්‍ය ප්‍රවේශය ගෙන තිබෙන්නේ පෙර පැවති සූදානම තවදුරටත් ශක්තිමත් කරමින් බව පෙනී යන කරුණක්. මෙවර දෙසතිය කවරය කතාවේ කතාබහ සිදු වන්නේ ඒ පිළිබඳ විමසුමට ලක් කරමින්.

ශ්‍රී ලංකා ආර්ථිකය රාජ්‍ය මූල්‍ය සමතුලිතතාව ඇති කර ගනිමින් සහ වර්ධනය වෙමින් අඛණ්ඩ ව යථා තත්ත්වයට පත්වෙමින් තිබුණත් ගෘහස්ථ ආදායම, සේවා නියුක්තිය හා මූල්‍යමය නොවන සුභසාධනය අර්බුදයට පෙර තිබූ තත්ත්වයට වඩා ඉතාමත් පහළ අඩියක පවතින බව ලෝක බැංකුව ප්‍රකාශ කරනවා (STAYING ON TRACK, SRI LANKA, APRIL 2025). එසේ ම ගෝලීය දරිද්‍රතා මිනුම් දර්ශකය අනුව (at US$3.65 per person per day, PPP) අර්බුද සමයේ සියයට 25.6ක් වූ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව 2024 වසරේදී සියයට 24.5ක් දක්වා අඩු වුවත් එය 2019 වර්ෂයේදී වාර්තා කළ සියයට 11.3ට වඩා ඉහළ මට්ටමක තවමත් පවතින බව ලෝක බැංකුව පෙන්වා දෙනවා.



# ප්‍රජා ශක්ති

දීප්ත කුමාර බටගොඩ

දිළිඳුකම පිටු දැකීම සඳහා වන 'ප්‍රජා ශක්ති' ජාතික ව්‍යාපාරයේ සමාරම්භක සමුළුව අමතමින් ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක පැවසුවේ ශ්‍රී ලංකාවේ ඇති වූ දරුණු ආර්ථික අර්බුදයෙන් පසුව, ඒ සඳහා කිසිසේත් දායක නොවූ බහුතර ග්‍රාමීය හා වතු ජනතාව තවමත් ඉන් පීඩා විඳින බව. ආර්ථිකය යම් මට්ටමක ස්ථාවරත්වයට පත්වෙමින් වර්ධනයක් අත්පත් කරගනිමින් සිටිය ද වර්ධනයේ ප්‍රතිලාභ ග්‍රාමීය ජනතාව අතර ගලා යා යුතු බවත් දරිද්‍රතාව පිටුදැකීමටනම් සංවර්ධන ක්‍රියාවලිය සඳහා ග්‍රාමීය හා වතු ජනතාවගේ සක්‍රීය දායකත්වය ලබා ගත යුතු බවත් ඔහු ප්‍රකාශ කළා.

ලෝක බැංකුවේ සහ ජනාධිපතිවරයාගේ පැහැදිලි කිරීම් අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වයට දායක වන ප්‍රතිසංස්කරණ අඛණ්ඩ ව පවත්වා ගැනීම නිසා මේ වන විට ආර්ථිකයේ ස්ථාවර ස්වභාවයක් පෙන්නුම් කළත් තවමත් වැඩි ජනතාවක් දරිද්‍රතාවෙන් පෙළෙන බව.

## දිළිඳුබව යනු කුමක්ද?

දරිද්‍රතාව, දුප්පත්කම හා දිළිඳුබව යන්නට වෙනස් වූ අර්ථ පැවතුණ ද මේ සියල්ලට ම පොදු වූ තත්ත්වයක් වන්නේ සපුරා ගත යුතු යැයි පවතින ලෝක සම්මත තත්ත්වයක ඌනතාවකින් ඇතැම් ජනකොටස් පෙළෙන බවක්. එම නිසා මේ වචන ත්‍රිත්වය පොදුවේ දුප්පත්කම යන්න හඳුන්වා දීමට බොහෝදෙනා පෙළඹී තිබෙනවා.

දරිද්‍රතාව නොහොත් දිළිඳුබව යන්නට මෙතෙක් පැහැදිලි හා නිශ්චිත අර්ථකථනයක් නැහැ. එයට හේතුව දරිද්‍රතාව යන්න කාලානුරූපී ව, සමාජානුරූපී ව මෙන් ම වෙනත් හේතු නිසා වෙනස් වීම. බොහෝ විට මෙය පුද්ගල අවශ්‍යතා සහ ඒවා පූරණය කර ගැනීමට පවතින මූල්‍යමය ඌනතාවක් ලෙසින් බොහෝදෙනා අර්ථ දක්වනවා. එයට හේතුව වත්මන් ලෝකයේ මිනිස් අවශ්‍යතා පූරණය කර ගැනීමේ ප්‍රධානතම මෙවලම මුදල් වීම වන්නට පුළුවන්. දරිද්‍රතාව යන්නෙන් අදහස් වන්නේ මූල්‍යමය කාරණා නොවන බව පැහැදිලි වන්නේ ඒ සඳහා ඉදිරිපත් වී තිබෙන නිර්වචන විමසීමෙන්.

දරිද්‍රතාව, දුප්පත්කම හා දිළිඳුබව යන්නට වෙනස් වූ අර්ථ පැවතුණ ද මේ සියල්ලට ම පොදු වූ තත්ත්වයක් වන්නේ සපුරා ගත යුතු යැයි පවතින ලෝක සම්මත තත්ත්වයක ඌනතාවකින් ඇතැම් ජනකොටස් පෙළෙන බවක්. එම නිසා මේ වචන ත්‍රිත්වය පොදුවේ දුප්පත්කම යන්න හඳුන්වා දීමට බොහෝදෙනා පෙළඹී තිබෙනවා.

අමාර්ත්‍ය සෙන් දක්වා ඇත්තේ දරිද්‍රතාව "පුද්ගලයකුට ආත්ම අභිමානයෙන් යුතු ව ජීවිතය පවත්වාගෙන යාමට අදාළ ව තිබිය යුතු ශක්‍යතා නොමැති තත්ත්වයක්" ලෙසින්. එක්සත් ජාතීන්ගේ සංවිධානය දරිද්‍රතාව නිර්වචනය කරන්නේ ආහාර, පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම්, සෞඛ්‍ය, නවාතැන්, අධ්‍යාපනය සහ තොරතුරු ඇතුළු මූලික මිනිස් අවශ්‍යතා දැඩි ලෙස අහිමි වීමේ තත්ත්වයක් ලෙසින්. එය ආදායම සහ සේවා සඳහා වන ප්‍රවේශ වීමේ හැකියාව මෙන් ම මානව ගරුත්වය, ප්‍රතික්ෂේප කිරීම සහ සමාජයට ඵලදායී ලෙස සහභාගී වීමට ඇති නොහැකියාව ගැන ද අවධාරණය කරනවා. ලෝක බැංකුව ප්‍රකාශ කරන පරිදි දරිද්‍රතාව යනු "යහපැවැත්මේ ප්‍රකාශිත අහිමිවීම" (Poverty is pronounced deprivation in well-being).

## දිළිඳුබවේ ප්‍රභේද

මේ සියලු නිර්වචන අනුව දරිද්‍රතාව යන්න මූල්‍යමය දරිද්‍රතාව (Monetary Poverty) හා මූල්‍යමය නොවන දරිද්‍රතාව (Non-Monetary Poverty) නොහොත් බහුමාන දරිද්‍රතාව (Multi-Dimensional Poverty) ලෙසින් කොටස් දෙකකට වර්ග කරන්න පුළුවන්. බොහෝ රටවල් දරිද්‍රතාව මිනුම් කිරීමේදී භාවිත කරන්නේ මේ වර්ගීකරණය.

දරිද්‍රතාව නිරපේක්ෂ දරිද්‍රතාව (Absolute poverty) සහ සාපේක්ෂ දරිද්‍රතාව (Relative poverty) ලෙසිනුත් වර්ග කෙරෙනවා. නිරපේක්ෂ දරිද්‍රතාව යනු පුද්ගලයකු සඳහා අවශ්‍ය යැයි සම්මත


යම් පරිභෝජන තත්ත්වයක් අත්පත් කර ගැනීමේ නොහැකියාව. මෙය මිනුම් කිරීමේදී පුද්ගල අවශ්‍යතා සඳහා වන පිරිවැය ප්‍රවේශ්‍ය පදනම් කර ගන්නවා. සාපේක්ෂ දරිද්‍රතාව සංසන්දනාත්මක අවශ්‍යතා සඳහා වැදගත් වෙනවා. පුද්ගලයකුට සාපේක්ෂ ව තවත් පුද්ගලයකු හෝ රටකට සාපේක්ෂ ව තවත් රටක දරිද්‍රතාව මිනුම් කිරීමේ හා සැසඳීමේ අවස්ථාව සාපේක්ෂ දරිද්‍රතාවෙන් ලැබෙනවා. අන්ත දිළිඳුභාවය (Extreme Poverty) පුද්ගලයකුගේ මූලික අවශ්‍යතා පරිභෝජනය කිරීමේ නොහැකියාව පිළිබඳ දර්ශකයක් වන අතර එය අවශ්‍යතා සඳහා වන පිරිවැය ප්‍රවේශය පදනම් කරගෙන මිනුම් කරනවා.

## දිළිඳුබව මනින්නේ ඇයි?

දරිද්‍රතාව සඳහා පොදු නිර්වචනයක් නොමැති නිසා ම විවිධ නිර්වචන ඔස්සේ එය මිනුම් කිරීම ඉතාමත් සංකීර්ණ ක්‍රියාවලියක්. මේ නිසා බොහෝ රටවල් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා විවිධ මිනුම්දඬු භාවිත කරනවා. බොහෝ රටවල් නිරපේක්ෂ දරිද්‍රතාව මිනුම් කිරීම සඳහා යොදා ගන්නේ'මූලික අවශ්‍යතා සඳහා පවතින පිරිවැය ප්‍රවේශය (Cost of Basic Need (CBN) Approach). ලෝක බැංකුව පහළ මැදි ආදායම් කාණ්ඩයේ රටවල් සඳහා දරිද්‍රතා සීමාව ලෙසින් දක්වන්නේ එක් පුද්ගලයකු එක් දිනකට ඇමරිකානු ඩොලර් 3.65ක ආදායම් සීමාව. ඊට අඩු ආදායමක් ලබන පුද්ගලයන් හෝ පුද්ගල කාණ්ඩ දුප්පතුන් හැටියටයි සැලකෙන්නේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දරිද්‍රතා දර්ශකයක් පිළියෙල කරනු ලබන අතර එය ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාව ලෙසින් හඳුන්වනවා.

එක් අවස්ථාවකදී පුද්ගලයකු මිල දී ගැනීම සඳහා තෝරා ගත් භාණ්ඩ හා සේවා පැසක් පසු අවස්ථාවකදී මිල දී ගැනීමේ හැකියාව වෙනස්වීමට පුළුවන්. පුද්ගලයන්ගේ ආදායමත් භාණ්ඩ මල්ලේ ඇති භාණ්ඩවල මිලත් වෙනස්වීමයි එයට හේතුව. මේ නිසා දරිද්‍රතා රේඛාවේ සීමාව විචලනය වෙනවා. මේ විචලනය අවබෝධ කර ගැනීමෙන් අවදානම් පුද්ගල කාණ්ඩ හඳුනා ගැනීමට රටකට හැකියාව ලැබෙනවා. ඒ අනුව එම පිරිස් වෙත සම්පත් ගලා යාම සහ මිල දී ගැනීමේ හැකියාව ඉහළ නැංවීමෙන් ඔවුන් දරිද්‍රතා මට්ටමෙන් ඔබ්බට ගෙන ඒමේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය කිරීමට පුළුවන්. මේ නිසයි රටකට දරිද්‍රතාව මිනුම් කිරීමේ අවශ්‍යතාව ඇති වන්නේ.

ශ්‍රී ලංකාවේත් දරිද්‍රතාව මිනුම් කිරීමේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව භාවිත කරන්නේ 'මූලික අවශ්‍යතා පිරිවැය ප්‍රවේශය'. නිශ්චිත කාලයක (පදනම් වර්ෂයක්) මිනිසුන්ගේ පරිභෝජන රටාව සහ රුචිකත්වය අනුව මූලික අවශ්‍යතා වශයෙන් සැලකෙන ආහාර සහ ආහාර නොවන භාණ්ඩ රැසක් මිල දී ගැනීමේ පිරිවැය සහ ඒ සඳහා වියදම් කිරීමේ හැකියාව විමසා බලනවා. මෙහිදී අදාළ භාණ්ඩ රැස මිල දී ගැනීම සඳහා වැය වන වියදම් සීමාවයි දරිද්‍රතාව වෙන් කරන සීමාව ලෙස සලකන්නේ. කිසියම් අවස්ථාවක දරිද්‍රතාව වෙන් කරන වියදම් සීමාව නිල දරිද්‍රතා රේඛාව (Official Poverty Line) ලෙස හැඳින්වෙනවා. එම රේඛාවෙන් පහළ ආදායම් ලබන පිරිස් හඳුනා ගන්නේ මූලික අවශ්‍යතා සඳහා වියදම් කිරීම අපහසු, දරිද්‍රතාවෙන් යුක්ත කණ්ඩායම වශයෙන්. මෙය නිරපේක්ෂ දරිද්‍රතාව මනින සාමාන්‍ය පිළිගත් ක්‍රමය. ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාව 2025 අප්‍රේල් මාසය වන විට රුපියල් 16,421ක් වන අතර දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට මේ අගය මිනුම් කරනවා. ඒ අනුව 2025




මූලාශ්‍රය - ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය 2019 ප්‍රතිඵල: ජාතික සහ ළමා විශ්ලේෂණයන් (OPHI, DCS, EUROPEAN UNION, UNICEF)


අප්‍රේල් මාසයේදී ඉහළ ම අගය කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වුණා. එය රුපියල් 17,710ක්. මොණරාගල දිස්ත්‍රික්කයෙන් පහළ ම අගය වාර්තා කරන අතර එය රුපියල් 15,701ක්. නිල දරිද්‍රතා රේඛාව තීරණය කිරීමේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පුද්ගල පරිභෝජන රටාව පිළිබඳ තොරතුරු ලබාගෙන ඇත්තේ 2012/13 වර්ෂයේ පවත්වන ලද ආදායම් වියදම් සමීක්ෂණය ඇසුරින්. අර්බුද සමයෙන් පසුව ශ්‍රී ලංකාවේ පුද්ගල පරිභෝජන රටාව සැලකිය යුතු ලෙස වෙනස් වීමට ඉහළ සම්භාවිතාවක් පවතින බවයි බොහෝ දෙනකුගේ අදහස. මෙය යාවත්කාලීන කිරීම සඳහා ආදායම් වියදම් සමීක්ෂණයක් කළ යුතු ව තිබෙනවා.

එක් අවස්ථාවකදී පුද්ගලයකු මිල දී ගැනීම සඳහා තෝරා ගත් භාණ්ඩ හා සේවා පැසක් පසු අවස්ථාවකදී මිල දී ගැනීමේ හැකියාව වෙනස්වීමට පුළුවන්. පුද්ගලයන්ගේ ආදායමත් භාණ්ඩ මල්ලේ ඇති භාණ්ඩවල මිලත් වෙනස්වීමයි එයට හේතුව. මේ නිසා දරිද්‍රතා රේඛාවේ සීමාව විචලනය වෙනවා. මේ විචලනය අවබෝධ කර ගැනීමෙන් අවදානම් පුද්ගල කාණ්ඩ හඳුනා ගැනීමට රටකට හැකියාව ලැබෙනවා. ඒ අනුව එම පිරිස් වෙත සම්පත් ගලා යාම සහ මිල දී ගැනීමේ හැකියාව ඉහළ නැංවීමෙන් ඔවුන් දරිද්‍රතා මට්ටමෙන් ඔබ්බට ගෙන ඒමේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය කිරීමට පුළුවන්. මේ නිසයි රටකට දරිද්‍රතාව මිනුම් කිරීමේ අවශ්‍යතාව ඇති වන්නේ. ඒ හැර රටේ විවිධ කුටුම්භ හා කලාපවල දරිද්‍රතාව සංසන්දනය කිරීමට, කාලය සමග දරිද්‍රතාවේ ඇති ව තිබෙන වෙනස්කම් පරීක්ෂා කිරීමට, රටවල් අතර දරිද්‍රතාව සංසන්දනය කිරීමට, දරිද්‍රතාව අඩු කිරීමේ උපාය මාර්ගවල බලපෑම ඇගයීම වැනි කාරණා සඳහා දරිද්‍රතාව මිනුම් කිරීම වැදගත්. මූල්‍යමය දරිද්‍රතාවට අමතර ව අධ්‍යාපනය, සෞඛ්‍ය, ජීවන තත්ත්වය වැනි ක්ෂේත්‍ර සඳහා ප්‍රවිෂ්ට වීමේ නොහැකියාව මිනුම් කිරීමට ශ්‍රී ලංකාව 2019 වර්ෂයේදී ප්‍රථම වරට මූල්‍යමය නොවන දරිද්‍රතා දර්ශකයක් පිළියෙල කළා. එය බහුමාන දරිද්‍රතා දර්ශකය ලෙසිනුයි හඳුන්වන්නේ. එයින් ක්ෂේත්‍ර 10ක් සඳහා ප්‍රවේශ ඌනනය සලකා බැලෙනවා. එහිදී ළමයින් සම්බන්ධයෙන් ද ළමා බහුමාන දරිද්‍රතා දර්ශකයක් සකස් කර තිබීම විශේෂත්වයක්.


## දිළිඳුබව චක්‍රයක් ද?

දිළිඳු බව බොහෝ අවස්ථාවලදී චක්‍රීය ස්වභාවයක් උසුලන බව ආර්ථික විද්‍යාඥ රැග්නා නර්ක්ස් (Ragna Nerkse) පවසනවා. කිසියම් කුටුම්භයක ආදායම් ඌනතාව නිසා ඔවුන් දුප්පත් කාණ්ඩයට ඇතුළත් වන අතර ම දිළිඳුභාවයේ කඩඉම බිඳ දැමීමේ හැකියාවක් ද නැහැ. මේ නිසයි එහි චක්‍රීය ස්වභාවයක් ඇත්තේ. මෙය 'දිළිඳුබවේ දුෂ්ට චක්‍රය' ලෙසින් ද හැඳින්වෙනවා. බොහෝ ආර්ථික විද්‍යාඥයන් පෙන්වා දෙන්නේ දුප්පත් රටවල අඩු ඉතුරුම් හා අවම ප්‍රාග්ධන සැපයුම නිසා ඇති වන අඩු නිෂ්පාදනය එම රටවල අඩු ආදායමට හේතුවන බවක්. ඉහළ ඉතුරුම් හෝ ප්‍රාග්ධන සැපයුම මගින් මේ චක්‍රය බිඳ දැමීමටයි බොහෝ පිරිස් යෝජනා කරන්නේ. එහෙත් දරිද්‍රතාව පිටු දැකීමට ප්‍රාග්ධන සම්පාදනය ඉහළ දැමීම ප්‍රමාණවත් නොවන බවක් වර්තමානය වන විට පෙනී යනවා. එයින් යම්කිසි ආකාරයක අත්පත් කර ගැනීමක් පැවතිය ද විශේෂයෙන් ග්‍රාමීය අංශයේ දිළිඳුබව පිටුදැකීමට ප්‍රාග්ධන සැපයුම් ඉහළ දැමීමෙන් ම පමණක් හැකි වන්නේ නැහැ. ග්‍රාමීය දිළිඳු බව සඳහා ප්‍රාග්ධන ඌනතාවට අමතර ව හේතු රාශියක් බලපා තිබීමයි ඊට හේතුව.

දිළිඳුබවේ දුෂ්ට චක්‍රය පුද්ගලයා හා සමාජය කෙරෙහි භාවිත කළ හැකි වුවත් එයින් සාකච්ඡා කෙරෙන්නේ චක්‍රයේ පරිධිය කේන්ද්‍ර කරගෙන. වෙනත් ලෙසකින්




මූලාශ්‍රය - ලෝක බැංකුව




පවසනවානම් අඩු ආදායම් අඩු ඉතුරුම් සඳහා හේතු වන අතර අඩු ඉතුරුම් නිසා නැවත අඩු නිෂ්පාදනයකුත් ඒ නිසා ම නැවතත් අඩු ආදායම් උත්පාදනයක් සිදු වෙනවා. මේ නිසා යම් අවස්ථාවක ප්‍රාග්ධන සැපයුම් ඉහළ දැමීමෙන් රටක දුගී බවේ දුෂ්ට චක්‍රය බිඳ දැමීමට හැකි බවකුයි මෙයින් පෙන්වා දෙන්නේ. ඉන් උපකල්පනය කෙරෙනවා දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාව චක්‍රයේ පරිධිය මායිම් වන රේඛාව මත පිහිටන බවක්. එහෙත් සැබෑ වශයෙන් ම ඊට වඩා ඉහළ පිරිසක් මේ චක්‍රයේ නාභිය හා ඒ වටා සිටිනවා. ඔවුන්ගේ දරිද්‍රතාව සඳහා හේතු වන්නේ ඉතා සංකීර්ණ හා එකිනෙක බැඳුණු සාධක. එම නිසා දරිද්‍රතාව පිටුදැකීමේ ක්‍රියාවලියේදී මේ චක්‍රය මත, ඉන් ඇතුළත සිටින ජන කොටස් සහ ඉන් පිටත අවදානම් කලාපයේ සිටින ජනකොටස් පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු වෙනවා.

ග්‍රාමීය දරිද්‍රතාව සඳහා හේතු වී තිබෙන්නේ ප්‍රාග්ධන ඌනතාව පමණක් නොවෙයි. එය පුද්ගලයකුගේ හා සමාජයේ ආකල්ප සහ සංස්කෘතියේ සිට සමාජ දේශපාලන කරුණු දක්වා හේතු රාශියක සංකලනය වීමකින් සමන්විත සංකීර්ණ තත්ත්වයක දෘශ්‍යමාන ප්‍රතිඵලයක්. ඒ අනුව දුගී බවේ විෂම චක්‍රයේ නාභිය කේන්ද්‍රගත වූ හේතු විමසා බැලීම සහ ඒවාට පිළියම් යෙදීම දරිද්‍රතාව පිටුදැකීමේ ක්‍රියාවලියට ඇතුළත් විය යුතු වෙනවා. එයින් අදහස් වන්නේ පුද්ගලයකුගේ හෝ සමාජයේ පුද්ගල දරිද්‍රතාව පිළිබඳ විමසීමේදී අඩු පුද්ගල ආදායම මූල්‍යමය දරිද්‍රතාවට හේතු වන බව පෙන්වා දුන්නත් පුද්ගලයන්ගේ අඩු ආදායම සඳහා බලපාන හේතු ලෙස සාධක රාශියක් බලපාන බව. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකා බැලීමේදී යැපුම් මානසිකත්වය හා ආකල්පමය දරිද්‍රතාව, සංස්කෘතික සාධක, සම්පත් ඌනතාව, ව්‍යාපාරික හා ව්‍යවසායකත්වය පිළිබඳ දැනුමේ ඌනතාව, අවම යටිතල පහසුකම් හා පටු වෙළෙඳපොළ, අවම මූල්‍ය සාක්ෂරතාව යනාදි හේතු රාශියක් දරිද්‍රතාව සඳහා බලපානවා.

## ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව

2019 වර්ෂය වන විට ශ්‍රී ලංකාව දරිද්‍රතාව පිටුදැකීමේ ව්‍යායාමය සාර්ථක කාර්යසාධනයක් පෙන්නුම් කරමිනුයි සිටියේ. ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා දර්ශකය අනුවත් ලෝක බැංකුවේ ජාත්‍යන්තර දරිද්‍රතා දර්ශකය අනුවත් ඒ බව තහවුරු


ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය : වාරණය කළ දරිද්‍රතා අනුපාත





මූලාශ්‍රය : ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය 2019 ප්‍රතිඵල: ජාතික හා ළමා විශ්ලේෂණයන් (OPHI, DCS, EUROPEAN UNION, UNICEF)

දුගී බව අභ්‍යන්තර හා බාහිර සාධක නිසාත් අභ්‍යන්තර හා බාහිර සාධකවල ඒකාබද්ධ හා අන්තර්කරණ ක්‍රියාවලියකිනුත් ඇති විය හැකියි.

දුගී බවේ දුෂ්ට චක්‍රය




නාභිගත දරිද්‍රතා විෂම චක්‍රය




නිර්මාණය : දිල්ෂා කුමාර බටගොඩ

වෙනවා. මේ සඳහා ප්‍රධාන වශයෙන් ම බලපෑවේ නිදහස ලැබීමෙන් පසුව ශ්‍රී ලංකාව අනුගමනය කළ සුභසාධන ආර්ථික ප්‍රතිපත්තිය බවයි බොහෝ පිරිසකගේ අදහස.

හිග අය වැය ප්‍රතිපත්තිය අනුගමනය කරමින් විශාල වශයෙන් සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා අය වැයෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණයක්. අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි මූලික අවශ්‍යතා රජය නොමිලේ සපයන අතර ම දුප්පත් ජන කොටස් ඉලක්ක කරමින් මූල්‍ය හා මූර්ත සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ජීවනෝපාය මාර්ග සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සහ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා විවිධ වැඩසටහන් දිගු කාලයක් රජය අඛණ්ඩ ව සිදු කළා. ආහාර මුද්දර ක්‍රමය, පාසල් දිවා ආහාරය සැපයීම, ජනසවිය, සමෘද්ධි වැඩසටහන, ගම්උදා සංකල්පය මෙවැනි වැඩසටහන් කිහිපයක්. වර්තමානයේ ක්‍රියාත්මක වන ප්‍රධාන සුභසාධන වැඩසටහන වන්නේ 'අස්වැසුම'. එයට අමතර ව ආබාධිත පිරිස්, වැඩිහිටියන්, ළමයින් සහ ගර්භිණී කාන්තාවන් ඉලක්ක කරමින් විශේෂ වැඩසටහන් රාශියක් ද ක්‍රියාත්මක වෙනවා.

2019 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවෙන් පෙළෙන ජන කොටස, යාවත්කාලීන කරන ලද දරිද්‍රතා දර්ශකය අනුව 14.3%ක් බවයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පෙන්වා දෙන්නේ. අංශ අනුව ඉහළ ම දරිද්‍රතාව වාර්තා කරන්නේ වතු අංශය. එය වතු අංශයේ මුළු ජනගහනයෙන් 33.8%ක්. රටේ සමස්ත ජනගහනයෙන් වැඩි ම ජනකොටසක් දරිද්‍රතාවෙන් පෙළෙන්නේ ග්‍රාමීය අංශයේ.

ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාව (ඇ.ඩො. 3.65, 2017 ppp) 2019 වසරේදී 11.3%ක් වූ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව 2020 වසරේදී 12.7%ක් දක්වා කොවිඩ් 19 වසංගතය නිසා ඉහළ ගිය බව ලෝක බැංකුව පෙන්වා දී තිබුණා. ආර්ථික අර්බුදය මිනිසුන්ගේ ජීවනෝපාය ක්‍රමවලට සහ ජීවන වියදමට දැඩි ලෙස බලපෑම් කර තිබෙන බව ලෝක බැංකුව එහිදී පෙන්වා දී තිබුණා. මේ නිසා 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව 25% දක්වා දෙගුණයකින් ඉහළ යාමක් අපේක්ෂා කළ හැකි බව ද ඔවුන් පුරෝකථනය කර තිබුණා. වර්තමානය වන විට 2022 වර්ෂයට වඩා අඩු වුව ද එය අර්බුදයට පෙර තිබූ තත්ත්වයට වඩා ඉහළ බව ලෝක බැංකුව පෙන්වා දෙනවා. ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාව අනුව 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව සියයට 24.5ක්. ගෘහ කාණ්ඩ ආදායම අර්බුදයට පෙර තිබූ තත්ත්වයට වඩා තවමත් ඉතා පහළ මට්ටමක පවතින බවත් ඒ නිසා ආහාරමය අනාරක්ෂිතභාවයෙන් සහ දුප්පත්කමින් පෙළෙන ජනගහනය තවමත් ඉහළ මට්ටමක පවතින අතර අවදානම් කලාපයේ ද සැලකිය යුතු පිරිසක් සිටින බවත් ලෝක බැංකුව පෙන්වා දෙනවා. මේ අවදානම් කලාපයේ සිටින පිරිස් ඉතා සුළු කම්පනයකදී පවා දරිද්‍රතා කලාපයට යොමු වීමේ අවදානමක් පවතින බවත් ඔවුන් අවධාරණය කරන්නක්. 2024 වසරේදී මන්දපෝෂණය ඉහළ ගොස් ඇති අතර එය මානව ප්‍රාග්ධනය ගොඩනැගීමට සහ අන්තර් පරම්පරා දරිද්‍රතාව සම්ප්‍රේෂණයට ඇති විය හැකි දිගුකාලීන බලපෑම් පිළිබඳ කනස්සල්ලට හේතුවක්. 2021 වසර සහ 2024 වසර අතර ආහාර මිල දෙගුණයකටත් වඩා වැඩි වීම නිසා තම ආහාර වේල වෙනස් කිරීම හා පෝෂ්‍යදායී ආහාර පරිභෝජනය අඩු කර ඇති බවත් ඒ හේතුවෙන් මේ කාලයේ මන්දපෝෂණය සියයට 12.2 සිට සියයට 17 දක්වා (වයස අවුරුදු 5ට අඩු ළමයින් අතර අඩු බර) ඉහළ ගොස් තිබෙන බවත් ලෝක බැංකුව පෙන්වා දෙනවා.

## අර්බුදයෙන් පසු දරිද්‍රතාව

පුද්ගලයකුගේ හෝ කුටුම්භයක හෝ දරිද්‍රතාව ඉහළ යාමට ආදායම සහ පරිභෝජන වියදම ප්‍රධාන වශයෙන් ම හේතු වන්නක්. මේවා එකිනෙක බද්ධවයි ක්‍රියාත්මක වන්නේ. ආදායම ස්ථාවර ව තිබියදී පරිභෝජනය කරන භාණ්ඩවල මිල ඉහළ යාමෙනුත් වියදම ස්ථාවර ව තිබියදී ආදායම පහළ යාමෙනුත් මේ කාරණා ද්විත්වය ම ක්‍රියාත්මක වීමෙනුත් දරිද්‍රතාව ඉහළ යාමේ හැකියාව තිබෙනවා. කොවිඩ් 19 වසංගත සමයේදී පුද්ගල ආදායම් මට්ටම සැලකිය යුතු ලෙසින් පහළ වැටුණේ රට වසා දැමීම හේතුවෙන්. ඒ සමග ම විදේශ සංචිත හිඟය නිසා ඇතිවූ ආර්ථික අර්බුදය සමාජ අර්බුදයක් දක්වා ව්‍යාප්ත වීමෙන් රටේ උද්ධමනකාරී තත්ත්වයක් සමග ම භාණ්ඩ හිඟයක් ද ඇති වුණා. මේ තත්ත්වය හේතු වුණේ කුටුම්භ ආදායම් මාර්ග අවම කිරීමටත් රැකියා විරහිතභාවය ඇතිවීමටත්. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පෙන්වා දෙන පරිදි ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල පරිභෝජන වියදම 2025 මැයි මාසය වන විට රුපියල් 16,421ක්. යාවත්කාලීන කරන ලද දරිද්‍රතා රේඛාවට අනුව මෙය 2019 වර්ෂයේදී රුපියල් 6,966ක් ලෙසිනුයි වාර්තා වුණේ. 2024 ජනවාරි මාසයේදී මෙය රුපියල් 17,014ක් ලෙසින් පැවතුණු අතර වර්තමානය වන විට යම් පහළ යාමක් වාර්තා කරන බව පෙනී යනවා.

ලෝක බැංකුව පෙන්වා දෙන පරිදි රැකියා සඳහා විදේශගත වීම අර්බුදයට පෙර පැවතියාට සාපේක්ෂ ව 2024 වර්ෂය වන විට ද ඉතා ඉහළ මට්ටමක තිබෙනවා.

2024 වර්ෂයේ මුළු ජනගහනයෙන් දරිද්‍රතා කොටස 25%ක් තරම් වුවත් දරිද්‍රතා රේඛාවට ඉහළින්, අවදානම් කලාපයේ සිටින ජනගහනය 2019 වර්ෂයට සාපේක්ෂ ව තවමත් ඉහළ මට්ටමක පවතිනවා. මේ අවදානම් කලාපයේ සිටින්නේ 10%ක් තරම් බවයි ලෝක බැංකුව පවසන්නේ. මේ පිරිස ඉතා සුළු ආදායම් කම්පනයකදී හෝ පරිභෝජන වියදම් ඉහළ යාමකදී දරිද්‍රතා ගෝලය තුළට පිවිසීමේ හැකියාව තිබෙනවා. මේ නිසා දරිද්‍රතාව පිටුදැකීමේ සැලසුම්වල මෙවැනි අවදානම් පිරිස් කෙරෙහි ද අවධානය යොමු කළ යුතු වෙනවා.

2018 හා 2019 වසරවලදී විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ මිලියන 1.5ක් පමණ වූ ලියාපදිංචිවූවන්ගේ සංඛ්‍යාව 2024 වසර වන විට මිලියන 2 ඉක්මවා තිබෙනවා.

2024 වර්ෂයේ මුළු ජනගහනයෙන් දරිද්‍රතා කොටස 25%ක් තරම් වුවත් දරිද්‍රතා රේඛාවට ඉහළින්, අවදානම් කලාපයේ සිටින ජනගහනය 2019 වර්ෂයට සාපේක්ෂ ව තවමත් ඉහළ මට්ටමක පවතිනවා. මේ අවදානම් කලාපයේ සිටින්නේ 10%ක් තරම් බවයි ලෝක බැංකුව පවසන්නේ. මේ පිරිස ඉතා සුළු ආදායම් කම්පනයකදී හෝ පරිභෝජන වියදම් ඉහළ යාමකදී දරිද්‍රතා ගෝලය තුළට පිවිසීමේ හැකියාව තිබෙනවා. මේ නිසා දරිද්‍රතාව පිටුදැකීමේ සැලසුම්වල මෙවැනි අවදානම් පිරිස් කෙරෙහි ද අවධානය යොමු කළ යුතු වෙනවා.

මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් පසුව රටේ දිළිඳු බව ඉහළ ගොස් තිබෙන බව. කොවිඩ් 19 වසංගත සමයේ ලෝකයේ බොහෝ රටවල දරිද්‍රතාව මේ ආකාරයෙන් ඉහළ ගිය බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ගාමිණී වීරසිංහ පවසනවා. ඔහු පවසන පරිදි මේ තත්ත්වය ඇති වූයේ රටවල් වසා තැබීම හා කර්මාන්ත කඩා වැටීම නිසා. වසංගත තත්ත්වය අවසන් වීමෙන් පසුව බොහෝ රටවල් සාමාන්‍ය තත්ත්වය පත් වුණා. ශ්‍රී ලංකාවට එය එතරම් පහසු කාර්යයක් නොවුණේ අර්බුදයට හේතුව වසංගත තත්ත්වය ම පමණක් නොව ආර්ථික කළමනාකරණයේ අතීත දුර්වලතා ද අර්බුදයට හේතු වූ නිසා.

කොවිඩ් 19 වසංගතය හා ආර්ථික අර්බුදය පැවති කාලයේ රටේ කර්මාන්ත විශාල සංඛ්‍යාවක් වැසී ගියා. අධි උද්ධමනකාරී තත්ත්වය නිසා කර්මාන්තවල ඒකක පිරිවැය ද ඉහළ ගිය අතර පිරිවැය අඩු කිරීමේ විකල්ප ක්‍රමයක් වශයෙන් අවම සේවක සංඛ්‍යාවකින් කර්මාන්ත පවත්වාගෙන යාමට කර්මාන්ත හිමියන් පෙළඹුණා. මේ නිසා බොහෝ පිරිස්වලට රැකියා අහිමි වීම වූ අතර එයින් කුටුම්භවල ආදායම ද අඩු වුණා. මේ තත්ත්වය රටේ දරිද්‍රතාව ඉහළ යාමට සෘජු ව ම බලපෑම් කළා.

මහාචාර්ය ගාමිණී වීරසිංහ පවසන්නේ 2019 වසර වන විට ශ්‍රී ලංකාව වාර්තා කරන ලද අඩු දරිද්‍රතාවේ යම් යම් ගැටලුකාරී තත්ත්ව තිබූ බව. එය රජය සුභ සාධන සංකල්පය අඛණ්ඩ ව පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් බවත් සැබෑ ලෙසින් ම පුද්ගලයන්ගේ ආර්ථික ශක්තියේ ඇති වූ සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙසින් ඇති වූ තත්ත්වයක් ම

නොවන බවත් ඔහු ප්‍රකාශ කරනවා. රජය දුප්පතුන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන වැඩසටහන් හා ඒ වෙනුවෙන් දරන පිරිවැය සහ ප්‍රතිලාභීන් පිළිබඳ සංඛ්‍යාලේඛන තිබුණත් රජයේ මෙවැනි වැඩසටහන් නිසා ආර්ථික ශක්තිය ඇති කර ගත් පිරිස්වල සංඛ්‍යාලේඛන තිබෙනවාද? යන්න ඔහු ප්‍රශ්න කරනවා. එම නිසා රාජ්‍ය වැඩසටහන් ඉලක්කගත විය යුතු අතර ම ඒවා ක්‍රියාත්මක විය යුත්තේ ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වන තුරු පහසුකාරකයක් වශයෙන් බව ඔහු පෙන්වා දෙනවා. දරිද්‍රතාව පිටුදැකීම සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහන්වලදී දරිද්‍රතාව ඇති වීමට හේතු වූ කරුණු ගැඹුරින් විමසා ඒ සඳහා පිළියම් යෙදිය යුතු බව ද ඔහු අවධාරණය කරනවා.

## ග්‍රාමීය දරිද්‍රතාව

දරිද්‍රතා විශ්ලේෂණ මධ්‍යස්ථානය (cepa) 2013 වර්ෂයේදී ප්‍රකාශ කර තිබුණේ ඒ වන විට නාගරික, ග්‍රාමීය හා වතු අංශවල දරිද්‍රතාවේ ක්‍රමික අඩු වීමක් පෙන්නුම් කළ ද දරිද්‍රතාව යන්න තවදුරටත් ග්‍රාමීය ප්‍රපංචයක් වශයෙන් පවතින බව. 2025 වසරේදී ග්‍රාමීය දරිද්‍රතාව පිටුදැකීම සඳහා ජාතික ව්‍යාපාරය වන 'ප්‍රජා ශක්ති' වැඩසටහනේ සමාරම්භක උලෙළ අමතමින් ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ප්‍රකාශ කළේ වර්තමානයේ දරිද්‍රතාවෙන් බහුතර ජන කොටසක් සිටින්නේ ග්‍රාමීය අංශයේ බව. අර්බුදයෙන් පසුව රට යම් ස්ථාවර ස්වභාවයක් පෙන්නුම් කළ ද ග්‍රාමීය ජනතාවගේ ආහාර මිල දී ගැනීම, සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම, අධ්‍යාපනික පහසුකම් ආදිය විශාල බිඳ වැටීමකට පත් ව තිබෙන බවත් එම නිසා ග්‍රාමීය ජනතාවගේ දුප්පත්කම තුරන් කිරීම හා ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ පහළ ආදායම් ලබන ග්‍රාමීය ජනතාවට ගලා යාමට සැලැස්වීම රජයේ ප්‍රමුඛතම කාර්යයක් ලෙස සලකන බවත් ජනාධිපතිවරයා ප්‍රකාශ කළා.

ශ්‍රී ලංකාවේ ජනතාවගෙන් බහුතරයක් ජීවත් වන්නේ ග්‍රාමීය හා වතු අංශයේ. එය සියයට 78ක් පමණ වන අතර සියයට 4.5ක් පමණ වතු අංශයේ ජීවත් වෙනවා. දරිද්‍රතාවෙන් පෙළෙන බහුතරය ජීවත් වන්නේ ද ග්‍රාමීය හා වතු අංශයේ බව තහවුරු වන්නක්. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2019 වර්ෂයේදී සිදු කළ ගණනය කිරීම් අනුව ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතාවෙන් පීඩා විඳින වැඩි ම ජන අනුපාතයක් සිටින්නේ වතු අංශයේ. ඊට පසුව පිළිවෙළින් ග්‍රාමීය නාගරික අංශ සිටිනවා. බහුමාන දරිද්‍රතාවේ පැතිර පවත්නා හෝ ජනගහන දරිද්‍රතා අනුපාතය නාගරික අංශයේ සියයට 4.4ක් ද ග්‍රාමීය අංශයේ සියයට 16.6ක් ද වතු අංශයේ සියයට 51.3 ක් ද වෙනවා (ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශයේ ප්‍රතිඵල-2019). කෙසේ වුවත් ජනගහනයෙන් බහුතරය ග්‍රාමීය අංශයේ ජීවත් වීම නිසා දිළින්දන්ගෙන් බහුතරය ජීවත් වන්නේ ද ග්‍රාමීය අංශයේ.

කාන්තාවන් ගෘහ මූලිකයා වන අවස්ථාවල දරිද්‍රතාවෙන් පෙළීමේ ඉහළ සම්භාවිතාවක් ග්‍රාමීය අංශයේ තිබෙනවා. ජීව විද්‍යාත්මක සහ සංස්කෘතික හා සමාජීය බාධක හේතුවෙන් කාන්තාවන්ගේ ශ්‍රම බල සහභාගිත්වය ඉතා පහළ මට්ටමකයි පවතින්නේ. එය මුළු කාන්තාවන්ගෙන් සියයට 33ක් පමණ වෙනවා. මේ තත්ත්වය ද ග්‍රාමීය දිළිඳු බව කෙරෙහි කිසියම් ආකාරයක බලපෑමක් ඇති කරනවා. ගෘහ සහ පවුලේ යැපෙන්නන්ගේ වගකීම බොහෝ විට පැවරී ඇත්තේ කාන්තාවට. මේ නිසා රැකියාවකට යොමු වීමේදී වැඩිහිටියන් සහ ළමයින් සඳහා පවතින රැකවරණ මධ්‍යස්ථානවල අවශ්‍යතාව ඇතැමුන් මතු කරනවා. අනෙක් අතට කාන්තා ශ්‍රමය මිල කිරීමේදී පුරුෂයාට සාපේක්ෂ ව කාන්තා ශ්‍රමය අවතක්සේරුවට ලක්වීම තවමත් ග්‍රාමීය අංශයේ පවතින ආකල්පමය ගැටලුවක්. ඇතැම් රැකියා සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ වෙනස්කොට සැලකීම හේතුවෙන් අවස්ථා හිමි වන්නේ නැහැ. තවමත් ශ්‍රී ලංකාවේ ස්ත්‍රී හා පුරුෂ වශයෙන් පමණක් පුද්ගලයන් හඳුනා ගැනීමත් එයට වෙනස් වූ තත්ත්වවලදී සමාජභාවය ප්‍රතික්ෂේප කිරීම හා නිග්‍රහ කිරීමත් නිසා ඇතැම් තුන් වැනි පාර්ශ්වයකට (Third Gender) අවස්ථා අහිමි වෙනවා. බොහෝ විට මෙවැනි පුද්ගලයන් ගමෙන් නගරයට සංක්‍රමණය වීමත් ලිංගික ශ්‍රමිකයන් වශයෙන් ක්‍රියා කිරීමත් දකින්නට පුළුවන්.

> දුප්පතුන් සඳහා ක්‍රියාත්මක වූ වැඩසටහන්වල තිබූ තවත් දුර්වලතාවක් වූයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන දුප්පතුන් සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහන් හා ව්‍යාපෘතිවල අන්තර් සම්බන්ධතාවක් හෝ ඒකාබද්ධතාවක් නොතිබීම. බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක වූයේ පුද්ගලයාගේ ආර්ථික ශක්තිය ඉහළ දැමීමට අවශ්‍ය පහසුකාරක සැපයීමකට වඩා දෛනික ජීවිතයේ පරිභෝජන අවශ්‍යතා සම්පූර්ණ කිරීමට. එක ම වැඩසටහන් විවිධ ආයතනවලින් ක්‍රියාත්මක කිරීම නිසා සම්පත් නාස්තියක් මෙන් ම ග්‍රාමීය සමාජයේ යැපුම් මානසිකත්වයක් ඇති ව තිබෙනවා.

ග්‍රාමීය දරිද්‍රතාව පිටුදැකීම සඳහා නිදහසින් පසු මෙරට සෑම ආණ්ඩුවක් ම විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති දියත් කර තිබෙනවා. මේවා යම් සාර්ථකත්වයක් පෙන්නුම් කළත් ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම සඳහා පුද්ගලයන්ගේ ආර්ථික ශක්තියේ තිරසර පැවැත්ම කෙරෙහි බලපා තිබෙන්නේ අඩුවෙන්. එම නිසා රජයේ සහනාධාර වැඩසටහන් සඳහා එක ම පුද්ගල කණ්ඩායමක් අඛණ්ඩ ව ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබා තිබෙනවා. මේ වැඩසටහන් දේශපාලනීකරණය වීමත් මේවායේ සාර්ථකත්වය අවම වීමට බලපා තිබෙනවා. සමෘද්ධි සහනාධාර වැඩසටහනෙන් සහනාධාර ලැබූ විශාල පිරිසක් සැබෑ වශයෙන් ම සහනාධාර ලැබීමට සුදුසු නොවන පුද්ගලයන් බව ජාත්‍යන්තර ආයතන පෙන්වා දී තිබුණා. ලෝක බැංකුව පවසන පරිදි දුප්පතුන්ගෙන් සියයට 51කට ම සමෘද්ධි සහනාධාරය ලැබී නොතිබුණු අතර සමෘද්ධිලාභීන්ගෙන් සියයට 12ක් සමෘද්ධි සහනාධාරය ලැබීමට නුසුදුසු පවුල්. එම නිසා පසුව ඉලක්කගත ලෙසින් නිශ්චිත ව ම දුප්පතුන් ලෙසින් හඳුනා ගන්නා පිරිස් සඳහා 'අස්වැසුම' වැඩසටහන ක්‍රියාත්මක කළ ද වැඩසටහන ආරම්භයේ දුප්පතුන් හඳුනා ගැනීමේ යම් යම් ගැටලු මතු වූ බව බොහෝ දෙනාගේ සාකච්ඡාවට භාජනය වුණා. වර්තමානයේ දරිද්‍රතාව පිටුදැකීම සඳහා වන සියලු වැඩසටහන් එක ම පුද්ගලයාට අඛණ්ඩ ව සහනාධාර මත යැපීමට සිදු නොවන ආකාරයේ ක්‍රියාත්මක වීමක් වත්මන් රජය අපේක්ෂා කරනවා.

දුප්පතුන් සඳහා ක්‍රියාත්මක වූ වැඩසටහන්වල තිබූ තවත් දුර්වලතාවක් වූයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන දුප්පතුන් සඳහා

ක්‍රියාත්මක කරන වැඩසටහන් හා ව්‍යාපෘතිවල අන්තර් සම්බන්ධතාවක් හෝ ඒකාබද්ධතාවක් නොතිබීම. බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක වූයේ පුද්ගලයාගේ ආර්ථික ශක්තිය ඉහළ දැමීමට අවශ්‍ය පහසුකාරක සැපයීමකට වඩා දෛනික ජීවිතයේ පරිභෝජන අවශ්‍යතා සම්පූර්ණ කිරීමට. එක ම වැඩසටහන් විවිධ ආයතනවලින් ක්‍රියාත්මක කිරීම නිසා සම්පත් නාස්තියක් මෙන් ම ග්‍රාමීය සමාජයේ යැපුම් මානසිකත්වයක් ඇති ව තිබෙනවා.

## ග්‍රාමීය දරිද්‍රතාව පිටුදැකීමටනම්

ඕනෑ ම සමාජයක, ඕනෑ ම ආකාරයක දරිද්‍රතාවක් පිටුදැකීම සඳහා මූලික ව සපුරා ගත යුතු ප්‍රවේශ දෙකක් තිබෙනවා. ඉන් පළමුවැන්න දරිද්‍රතාව නිවැරදි ව නිර්වචනය කර ගැනීම. දෙවැන්න එම නිර්වචනය අනුව දරිද්‍රතාවෙන් පෙළෙන ජන කොටස් පුද්ගලයන් වශයෙනුත් ආංශික වශයෙනුත් හඳුනා ගැනීම සඳහා නිර්ණායක සකසා ගැනීම.

එම නිර්ණායක අනුව දරිද්‍රතාවෙන් පෙළෙන ජන කොටස, අවදානම් කලාපයේ සිටින ජන කොටස සහ අවදානම් කලාපයෙන් පිටත සිටින ජන කොටස වෙන්කර හඳුනා ගැනීම කළ යුතුයි. පූර්වයෙන් විස්තර කළ පරිදි දරිද්‍රතාවේ දුෂ්ට චක්‍රයේ පරිධිය මත ක්‍රියාත්මක වන ප්‍රාග්ධන ඌනතාව, චක්‍රයේ නාභිය තුළ සහ චක්‍රයේ ඕනෑ ම ස්ථානයක ක්‍රියාත්මක වෙමින් තිබෙන පුද්ගලයන්ගේ හෝ සමාජ කොටසේ දරිද්‍රතාවට හේතු වූ සාධක හඳුනා ගැනීම වැදගත්. මන්ද දරිද්‍රතාවෙන් ගොඩ ඒමට, එනම් දරිද්‍රතාවේ දුෂ්ට චක්‍රයේ සිරවී සිටින ජනතාව ඉන් පිටතට ගැනීමටනම් එයට හේතු වූ සාධක සියල්ල විනාශ කළ යුතු වෙනවා. ඉන්පසුවයි ඔවුන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීම ආරම්භ කළ යුත්තේ. මේ සියල්ල සඳහා පුද්ගලයකු හෝ සමාජයක් හෝ යම් භූගෝලීය ප්‍රදේශයක් සම්බන්ධයෙන් 'ශදුඅත විශ්ලේශණයක්' (SWOT ANALYSIS) කළ හැකියි. මෙයින් දරිද්‍රතාවට හේතු මෙන් ම එය පිටුදැකීමට පවතින ශක්ති සහ අවස්ථා හඳුනා ගන්නට පුළුවන්.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාවගේ දරිද්‍රතාව සඳහා බොහෝ විට හේතු වී තිබෙන්නේ යැපුම් මානසිකත්වය හා සෘණාත්මක ආකල්ප, සංස්කෘතික සාධක, ප්‍රාග්ධන ඌනතාව හා අඩු මූල්‍ය සාක්ෂරතාව, අවම යටිතල පහසුකම් හා පටු වෙළෙඳපොළ අවස්ථා, නුපුහුණු ශ්‍රමය ආදී තත්ත්ව. බාහිර කම්පන නිසා මූර්ත ආදායමේ ඇතිවන වෙනස්වීම් ද නාභිගත දරිද්‍රතා චක්‍රයේ 'දරිද්‍රතා සීමා වක්‍රය' පිටතට තල්ලු කිරීමට සමත් වෙනවා. මේ නිසා ඉහළ උද්ධමනකාරී තත්ත්වයකදී දරිද්‍රතා සීමාව සලකුණු වන වක්‍රය වඩාත් ඈතට තල්ලුවීමෙන් දරිද්‍රතා ජන කොටස ඉහළ යාමට හැකියාව තිබෙනවා. මෙහිදී අවදානම් කලාපයේ සිටින පිරිස ද දරිද්‍රතා කලාපයට පැමිණෙනු ඇති අතර දරිද්‍රතා කලාපයේ සිටින පිරිස් අන්ත දුගීභාවයට පත්වීමේ අවදානමක් තිබෙනවා. ග්‍රාමීය සමාජයේ දරිද්‍රතාව පිටුදැකීම සඳහා ක්‍රියාත්මක කරන සංවර්ධන සැලසුම් ඉහළ සිට පහළට ගලා යනවාට වඩා පහළ සිට ඉහළට ගලා යාම වඩා තිරසර විය හැකි බවට විද්වත් පිරිස් අදහස් දක්වන්නේ මේ නිසා.

කිසිම අවස්ථාවක දරිද්‍රතාව ශුන්‍ය තත්ත්වයක් කරා ගමන් කරන්නේ නැහැ. එයට හේතුව දරිද්‍රතාව යන්න සංකීර්ණ තත්ත්වවලින් සමන්විත කාලීන ව වෙනස් වූ නිර්වචන ඔස්සේ මිනුම් කරන සංකල්පයක් වීමත් සෑම අවස්ථාවක ම සමාජ ආරක්ෂණය ලැබිය යුතු විශේෂිත පිරිස් ලෝකයේ සෑම ස්ථානයක ම සිටීමත් නිසා. එසේ වුවත් සංවර්ධන ක්‍රියාවලියට සක්‍රිය ව දායකවීමේ කායික හා මානසික හැකියාව තිබෙන ඕනෑ ම පුද්ගලයකුට හෝ සමාජයකට ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමෙන් දරිද්‍රතාවෙන් ඔබ්බට පැමිණීමට පූර්ණ හැකියාව තිබෙනවා. රජයකින් විය යුත්තේ ඒ සඳහා පරිසරය හා පහසුකාරක සැපයීම. වත්මන් රජය 'ප්‍රජා ශක්ති' වැඩසටහන ක්‍රියාත්මක කර තිබෙන්නේ, පූර්වයෙන් පවසන ලද ග්‍රාමීය සහ වතු අංශයේ සියලු ආකාරයේ දරිද්‍රතාව පිටුදැකීමටත් ග්‍රාමීය සංවර්ධනය සඳහා ග්‍රාමීය ජනතාවගේ සක්‍රිය දායකත්වය ලබා ගනිමින් සමස්ත සංවර්ධනයේ ප්‍රතිලාභ ඔවුන් වෙත ගලා යාමට සැලැස්වීමේ අරමුණිනුත්.

---

# ග්‍රාමීය සංවර්ධනයෙන් තොර සමස්ත සංවර්ධනයක් නැහැ




ආචාර්ය
**උපාලි පන්නිලගේ**
අමාත්‍ය
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
සභාපති
'ප්‍රජා ශක්ති' ජාතික මෙහෙයුම් කමිටුව


වත්මන් රජයේ සංවර්ධන වැඩපිළිවෙළෙහි Clean Sri Lanka, ඩිජිටල්කරණ හා ග්‍රාමීය දිළිඳුභාවය තුරන් කිරීමේ වැඩසටහන ලෙසින් ප්‍රධාන තේමා තුනක් අන්තර්ගත වනවා. ඉන් වැඩසටහන් දෙකක් ක්‍රියාත්මකයි. ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමේ ජාතික වැඩසටහන ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ව තිබෙනවා.

ශ්‍රී ලංකාවේ බහුතරයක් ජීවත් වන්නේ ග්‍රාමීය අංශයේ නිසා ම දිළිඳු ප්‍රජාවගෙන් බහුතරයක් ජීවත් වන්නේ ද ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිත ව. වතු ආශ්‍රිත ව ජීවත්වන ජනතාව ද එයට ඇතුළත්. මේ නිසා සංවර්ධන වැඩසටහනකදී ග්‍රාමීය සංවර්ධනයෙන් තොර සමස්ත සංවර්ධනයක් ගැන කතා කරන්නට අපට බැහැ. ඒ නිසයි වත්මන් රජය තම සංවර්ධන වැඩපිළිවෙළේ ප්‍රධාන තේමාවක් වශයෙන් ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීම තෝරාගෙන තිබෙන්නේ.

ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීමේ ප්‍රධාන වැඩසටහන එසේත් නැතිනම් ජාතික ව්‍යාපාරය වර්තමාන රජය මේ වන විට සැලසුම් කර අවසන්. එය 'ප්‍රජා ශක්ති' නමින් නොබෝද ඇරඹුණා. මේ වැඩසටහනේ අරමුණු කිහිපයක් තිබෙනවා. ග්‍රාමීය සංවර්ධනය හා ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ හා අන්තර්කරණීය (integrated and inclusive) සංවිධාන ව්‍යුහයක් හඳුන්වා දීම මේ වැඩසටහනේ පළමු වැනි අරමුණ. දිළිඳුකම තුරන් කිරීම සඳහා ප්‍රජාසහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක් හඳුන්වා දීම මෙහි දෙවැනි අරමුණ වනවා. මෙහිදී සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ඒවා ඇගයීමේ ක්‍රියාවලියට ප්‍රජාවගේ සක්‍රිය දායකත්වය ලබා ගැනෙනවා. ප්‍රජා ශක්ති වැඩසටහනේ තුන් වැනි

අරමුණ වන්නේ ගම පොහොසත් කිරීම. එහිදී ඒ ඒ ග්‍රාමයට සුවිශේෂ වූ සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීමත් ක්‍රියාත්මක කිරීමත් සිදු වනවා. ඒ ඒ ග්‍රාමයේ පවතින සම්පත් ප්‍රයෝජනයට ගනිමින් සහ අවශ්‍ය අවස්ථාවලදී බාහිර සම්පත් අවශ්‍යතා ද ලබා ගනිමින් ගමට ම සුවිශේෂි වූ සංවර්ධන ක්‍රියාවලියක් ඇති කිරීම ගම පොහොසත් කිරීමේ ක්‍රියාවලියට ඇතුළත්. ප්‍රජා ශක්ති වැඩසටහන ක්‍රියාත්මක වන්නේ මේ ප්‍රධාන අරමුණු ත්‍රිත්වය ඉටු කර ගැනීමේ වැඩපිළිවෙළක් ලෙස.

ග්‍රාමීය සංවර්ධනය හා දිළිඳු බව තුරන් කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ හා අන්තර්කරණීය සංවිධාන ව්‍යුහයක් ඇති කිරීමේදී පවතින සංවිධාන ව්‍යුහයට ම ඇතුළත් වන පරිදි හඳුන්වා දෙනවා තවත් සංවිධාන ව්‍යුහ තුනක්. දැනටමත් ශ්‍රී ලංකාවේ සංවර්ධන වැඩසටහන් මෙහෙයවීමට හා ඇගයීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පවතිනවා. දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පවතින මේ කමිටු රාජ්‍ය නිලධාරින් හා දේශපාලන අධිකාරිය ඒකාබද්ධ ව ක්‍රියාත්මක වන, පවතින සංවිධාන ව්‍යුහයේ අවස්ථාවක්.

හඳුන්වාදෙන නව සංවිධාන ව්‍යුහය ඔස්සේ මේ ක්‍රියාවලිය තවදුරටත් පහළ ස්ථරයට ගලා යනවා. එහිදී ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් හඳුන්වා දෙන්නේ 'ප්‍රජා සංවර්ධන සභාව'. ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරි කොට්ඨාස ගණන 14008ක්. මේ සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයක ම මෙවැනි ප්‍රජා සංවර්ධන සභාවක් පිහිටුවනවා. එම සභාව විසින් අදාළ ප්‍රදේශය සඳහා ආරම්භක සංවර්ධන සැලැස්මක් (Village Development Plan) සකස් කරනු ලබනවා. මෙහිදී ගමේ සංවර්ධන සැලසුම තීරණය කරනුයේ ග්‍රාම නිලධාරි වසමේ රාජ්‍ය නිලධාරින් සමග එකතු වී ගමේ ම ජනතාව විසින්. සභාවේ ජනතා නියෝජනය සැලකීමේදී ප්‍රදේශයේ ජනගහන සංයුතියේ විවිධ විෂමතා නියෝජනය වන පරිදි අන්තර්කරණීය සංවිධානයක් ලෙසිනුයි මේ සභාව නිර්මාණය වන්නේ. ග්‍රාම නිලධාරි කොට්ඨාසයක පවතින සම්පත් සියල්ල පිළිබඳ සලකා බලා තම ප්‍රදේශයට ගැළපෙන සංවර්ධන යෝජනා සකස් කිරීමේ බලය හා වගකීම ලැබෙන්නේ මේ 'ප්‍රජා සංවර්ධන සභාව'ට. එම සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක වීමේදී ඒවා මෙහෙයවීම සහ ඇගයීම් ක්‍රියාවලිය ද පැවරෙන්නේ මේ සභාවට. මේ නිසා ගමේ සංවර්ධන ක්‍රියාවලිය කෙලෙසක විය යුතු ද යන්න තීරණය කිරීමටත් එම සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමටත් ඍජු දායකත්වය සැපයීමට ග්‍රාමීය ජනතාවට අවස්ථාව ලැබෙනවා. මේ සඳහා අවශ්‍ය ධාරිතා ඉහළ නැංවීම වැනි කාරණාවලදී අවශ්‍ය පුහුණුවීම් සහ අනෙකුත් පහසුකම් සැලසීම රජයේ පාර්ශ්වයෙන් සිදු වනවා.

මේ සංවර්ධන කාර්ය සම්බන්ධීකරණය සඳහා හඳුන්වා දෙන ජාතික මට්ටමේ මෙහෙයුම් කමිටුව සමන්විත වනවා

ග්‍රාමීය සංවර්ධනය හා දිළිඳු බව තුරන් කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ හා අන්තර්කරණීය සංවිධාන ව්‍යුහයක් ඇති කිරීමේදී පවතින සංවිධාන ව්‍යුහයට ම ඇතුළත් වන පරිදි හඳුන්වා දෙනවා තවත් සංවිධාන ව්‍යුහ තුනක්. දැනටමත් ශ්‍රී ලංකාවේ සංවර්ධන වැඩසටහන් මෙහෙයවීමට හා ඇගයීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පවතිනවා. දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පවතින මේ කමිටු රාජ්‍ය නිලධාරින් හා දේශපාලන අධිකාරිය ඒකාබද්ධ ව ක්‍රියාත්මක වන, පවතින සංවිධාන ව්‍යුහයේ අවස්ථාවක්.

වැඩසටහන් සඳහා ඍජු ව ම සම්බන්ධ වන රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන් සහ පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්ගෙන්. මේ මෙහෙයුම් කමිටුව අදාළ සැලසුම් සහ ඒවායේ ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය නිරන්තර විමසීමකට ලක් කරනවා.

'ප්‍රජා ශක්ති ජාතික ප්‍රතිපත්ති සභාව' නමින් ජාතික සභාවක් පිහිටුවීමට ද නියමිතයි. ඒ, ජනාධිපතිවරයාගේ සභාපතිත්වයෙන් සහ අමාත්‍යාංශ 09ක අමාත්‍යවරුන් සෙසු සාමාජිකයන් ලෙස පත් කරමින්. මෙයින් සිදු කරන්නේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

මේ අකාරයට පවතින සංවිධාන ව්‍යුහයේ ම නව ඒකාබද්ධ හා අන්තර්කරණ සංවිධාන ව්‍යුහ තුනක් හඳුන්වා දීමෙන් රජය අපේක්ෂා කරන්නේ ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලිය ඔස්සේ ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීමත් ඒවා ක්‍රියාත්මක කිරීමට හා ඇගයීමට ග්‍රාමීය ජනතාව සමග රාජ්‍ය නිලධාරින් හා දේශපාලන අධිකාරිය ඒකාබද්ධ ව අන්තර්කරණ ක්‍රියාවලියකින් ක්‍රියා කිරීමත්. මෙහිදී ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලිය ඉහළ සිට පහළට නොව පහළ සිට ඉහළට ගෙන ඒමට අපේක්ෂා කළත් මේ වැඩසටහන හඳුන්වා දීමේදී රජය ප්‍රධාන තේමා දෙකක් හඳුනාගෙන තිබෙනවා. ඉන් පළමුවැන්න බලසතුකරණය (Empowerment). ඒ යටතේ ආර්ථිකමය බලසතුකරණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය බලසතුකරණය, කුසලතා හා ආකල්පමය බලසතුකරණය සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනවා. දෙවැනි තේමාව වන්නේ රැකවරණය නැතහොත් සමාජ ආරක්ෂණය. සමාජ රැකවරණය ලැබිය යුතු පුද්ගලයන් හඳුනාගෙන ඔවුන් සඳහා සමාජ ආරක්ෂණය ලබා දීම සඳහා අවධානය යොමු කිරීමයි මෙහි අරමුණ.





# ආකල්පමය බලසතුකරණය වැදගත්

අර්බුදයට පෙර පැවති තත්ත්වයට වඩා අර්බුදයත් සමග ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව විශාල වශයෙන් ඉහළ ගිය බව සත්‍යයක්. එහෙත් එය ශ්‍රී ලංකාවේ පමණක් ඇති වූ තත්ත්වයක් නොවෙයි. සමස්ත ලෝකයේ ම දරිද්‍රතාව බරපතළ ගැටලුවක් ව පවතිනවා. මේ නිසා දුප්පත්කම යන්න ජාත්‍යන්තර සංවිධාන හා සෑම රටක් ම පාහේ අවධානය යොමු කර තිබෙන කරුණක්. 20 වැනි ශතවර්ෂයේ අග වන විට ලෝක දරිද්‍රතාවත් ඉහළ මට්ටමකයි තිබුණේ. ලෝක ජනගහනයෙන් බිලියන 1.8ක් පමණ දරිද්‍රතාවෙන් පීඩා වින්දා. මේ නිසා ගෝලීය වශයෙන් දරිද්‍රතාව කෙරෙහි පවතින අවධානය ද ඉහළ ගියා. ඒ නිසා ම දිළිඳුකම පිටුදැකීම සඳහා ලෝක ප්‍රජාව ක්‍රියාත්මක වනවා. ගෝලීය සංවිධාන හා රටවල් සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ හා තිරසර සංවර්ධන අභිමතාර්ථවල ද ප්‍රධානතම අරමුණක් ලෙසින් සියලු ආකාරයේ දිළිඳුකම් පිටුදැකීම දක්වා තිබුණා. මේ සියලු කාරණාවල ප්‍රතිඵලයක් ලෙස ගෝලීය දරිද්‍රතාව ක්‍රමයෙන් අඩුවීමක් පෙන්නුම් කළා. එය සියයට 35-40 පමණ සිට සියයට 10 දක්වා ප්‍රමාණයකට අඩු වුණා.

නිදහසින් පසු මුල් කාලයේදී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව සියයට 25-30 වැනි තත්ත්වයකයි තිබුණේ. එසේ වුවත් අර්බුදයට පෙර 2019 වසර පමණ වන විට මෙය සියයට 4-5 මට්ටමට අඩු වුණා. ආර්ථිකයේ ඇති වූ අර්බුදකාරී තත්ත්වයෙන් පසුව මේ තත්ත්වය වෙනස් වුණා. ඇතැම් වාර්තාවල සඳහන් වුණේ දරිද්‍රතාව සියයට 20ට වඩා ඉහළ ගිය බවක්. ආදායම අඩුකම, අධ්‍යාපනය අඩුකම, යටිතල පහසුකම් අඩුකම, ආදායම් බෙදී යාමේ විෂමතාව,



මහාචාර්ය
**ගාමිණී වීරසිංහ**
අංශාධිපති
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ මුළු කුටුම්භ සංඛ්‍යාවෙන් සියයට 16ක් පමණ සමෘද්ධි සහනාධාර ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා තිබුණා. මෙවැනි විශාල දිළිඳු කටුම්භ සංඛ්‍යාවක් තිබුණත් සැබෑ වශයෙන් ම සුදුස්සන් තෝරා ගැනීමේ විනිවිදභාවයෙන් යුතු සුදුසු නිර්ණායක භාවිත කර තිබුණේ නැහැ. කුටුම්භයක ආර්ථික ශක්තිය බලගැන්වීමෙන් පසුව එම වැඩටහනින් ඉවත් ව යාමේ ක්‍රමවේදයක් ද සකස් වී තිබුණේ නැහැ.

ග්‍රාමීය ජනතාව ආන්තීකරණයට ලක්වීම, සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගැනීමේ නොහැකියාව සහ කුටුම්භයක සාමාජික සංඛ්‍යාව ඉහළ යාම වැනි කාරණා රාශියක් ශ්‍රී ලංකාවේ දිළිඳුකම ඇති වීම කෙරෙහි බලපා තිබෙනවා. දරිද්‍රතාව පිළිබඳ ලෝක බැංකුවේ අර්ථකථනය වන්නේ 'සුබීභාවයේ විහීනතාව' ලෙසින්. මෙයින් අදහස් වන්නේ මිනිසුන්ට සැපවත් ජීවිතයක් ගත කිරීමේ නොහැකි තත්ත්වයක් දිළිඳුකම යන්නෙන් අදහස් වන බව. වර්තමාන ආණ්ඩුවේ තේමාව වන්නේ 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' යන්න. මෙහි සැපවත් ජීවිතයෙන් බලාපොරොත්තු වන්නේ සුබිභාවයෙන් යුතු ව ජීවිතය ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

නිදහසින් පසු කාලයේදී ලංකාවේ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබුණා. ජනසවිය, සමෘද්ධි, අස්වැසුම වැනි වැඩසටහන් ඔස්සේ ග්‍රාමීය ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ දැමීම ඔවුන් දරිද්‍රතා රේඛාවෙන් ඔබ්බට තල්ලු කිරීම සඳහා ගත් උත්සාහයක් ලෙසයි මා දකින්නේ. එසේ වුවත් ක්ෂණික ආර්ථික කම්පනයකින් දරිද්‍රතාව විශාල ලෙස වර්ධනය වීමට ජනතාවගේ ආදායම් උත්පාදන මාර්ගවල ස්ථාවරත්වයක් නොතිබීත් අවම මට්ටමක පැවතීමත් හේතු වී ඇති බව එයින් ගම්‍ය වෙනවා. ඇති වූ ක්ෂණික කම්පනයේදී මේ පිරිස්වල ආදායම විශාල ලෙස කඩා වැටුණා. ග්‍රාමීය අංශයේ ජනතාවගේ ජීවනෝපාය ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තය ආශ්‍රිත ව හා ක්ෂුද්‍ර හා සුළු පරිමාණ කර්මාන්ත ආශ්‍රිතවයි පවතින්නේ. මේ නිසා

දරිද්‍රතාව තුරන් කිරීමේ වැඩපිළිවෙළකදී ආදායම් උත්පාදන මාර්ග පමණක් නොව ඒවායේ තිරසරභාවය පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු වෙනවා. දරිද්‍රතාවෙන් පීඩා විඳින ජනතාව නිවැරදි ව හඳුනා ගැනීමත් ඔවුන් මුහුණදෙන ගැටලු නිවැරදි ව හඳුනා ගැනීම සහ ඔවුන් ඉලක්ක කර මේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් අතිශයින් ම වැදගත්. එසේ නොවන විට දරිද්‍රතාව තුරන් කිරීම සඳහා දුප්පත් ජනතාව වෙත ගලා යායුතු ප්‍රතිලාභ ගලා නොයාමෙන් ආර්ථිකයේ ඇතිවන ක්ෂණික කම්පනයකදී මෙවැනි ආකාරයේ දරිද්‍රතාවේ ඉහළ යාමක් අත්දැකීමට පුළුවන්.

වත්මන් රජය ග්‍රාමීය දරිද්‍රතාව පිටු දැකීම සඳහා 'ප්‍රජා ශක්ති' නමින් වැඩසටහනක් හඳුන්වා දී තිබෙනවා. මෙයට පෙර එවැනි වැඩසටහනක් තිබුණා 'සමෘද්ධි වැඩසටහන' නමින්. මේ යටතේ ශ්‍රී ලංකාවේ මුළු කුටුම්භ සංඛ්‍යාවෙන් සියයට 16ක් පමණ සමෘද්ධි සහනාධාර ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා තිබුණා. මෙවැනි විශාල දිළිඳු කටුම්භ සංඛ්‍යාවක් තිබුණත් සැබෑ වශයෙන් ම සුදුස්සන් තෝරා ගැනීමේ විනිවිදභාවයෙන් යුතු සුදුසු නිර්ණායක භාවිත කර තිබුණේ නැහැ. කුටුම්භයක ආර්ථික ශක්තිය බලගැන්වීමෙන් පසුව එම වැඩටහනින් ඉවත් ව යාමේ ක්‍රමවේදයක් ද සකස් වී තිබුණේ නැහැ. මේ නිසා බොහෝ පිරිස් අඛණ්ඩ ව සහනාධාර මත යැපීමට පෙළඹීමක් දක්නට ලැබුණා. දරිද්‍රතාව පිටුදැකීමේ වැඩසටහනකදී විය යුත්තේ යම් කාලයකදී දරිද්‍රතා සීමාවෙන් ඉහළට තල්ලු කර දරිද්‍රතාව පිටුදැකීමේ වැඩසටහනින් ඔවුන් ඉවත් කිරීම. එහෙත් සමෘද්ධි වැඩසටහනේ එවැනි ආකාරයේ පිටවීමට යාන්ත්‍රණයක් පැවතියේ නැහැ. දුප්පත් ජනතාව වෙත සමෘද්ධි වැඩසටහනෙන් ලබා දුන් ප්‍රතිලාභ හේතුවෙන් ඔවුන්ගේ දුප්පත් බව තුරන් කිරීමට සැබෑ වශයෙන් ම පිටිවහලක් වූයේ ද යන්න ගැටලුවක්. බොහෝ අවස්ථාවල සිදු වූයේ ලැබෙන සහනාධාරය භාවිත කර පරිභෝජන අවශ්‍යතා සපුරා ගැනීම පමණයි. දිළිඳුබව තුරන් කිරීමේ වැඩසටහනකදී එසේ විය යුතු නැහැ. සැබෑ වශයෙන් ම විය යුත්තේ ඔවුන්ගේ ආදායම් ජනනය කරන අවස්ථා, ඉතුරුම් හා ආයෝජන අවස්ථා පිළිබඳ යම් කිසි අවධානයක් යොමු කිරීම. දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන්වලදී ඒවා පක්ෂ දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් භාවිත කිරීමක් ද දකින්නට පුළුවන්. මෙවැනි හේතු නිසයි දරිද්‍රතාව පිටුදැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක වුණත් ඇතැම් අවස්ථාවල සංඛ්‍යාලේඛනවලින් දරිද්‍රතාව අඩු වූ බව පෙන්වුවත් දරිද්‍රතාවේ තිරසර අඩු වීමක් ශ්‍රී ලංකාවේ පෙන්නුම් නොකළේ. මේ නිසා ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ තිරසර අඩුවීමක් අපේක්ෂා කරන වැඩසටහනක අවශ්‍යතාව ඇති ව තිබුණා. ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීම සඳහා 'ප්‍රජා ශක්ති' ජාතික ව්‍යාපාරය බිහි වන්නේ එම අවශ්‍යතාවේ අවකාශය නිසා බවයි මා විශ්වාස කරන්නේ.

ප්‍රජා ශක්ති වැඩසටහනේ ඒකාබද්ධ හා අන්තර්කරණ වැඩපිළිවෙළක් සමග සංවර්ධනය සඳහා ප්‍රජාවගේ සහභාගිත්වය ද අපේක්ෂා කරනවා. ග්‍රාමීය සංවර්ධනයේදී ප්‍රාදේශීය වශයෙන් සිටින රාජ්‍ය නිලධාරින් ප්‍රාදේශිය සංවර්ධන කමිටුවේදී හෝ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී ඉදිරිපත් කරන යෝජනා ග්‍රාමීය අංශයේ ක්‍රියාත්මක වුණා. එහිදී ප්‍රජා සහභාගිත්වය තිබුණේ අවම මට්ටමකින්. සංවිධාන ව්‍යුහ සහ ප්‍රජාව අතර අන්තර් සබඳතාවක් පැවතුණේ ද නැහැ. ප්‍රජා ශක්ති වැඩසටහනේ මේ තත්ත්වය පිළිබඳ අවධානය යොමු කර තිබෙනවා. ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රජාව සක්‍රිය ලෙසින් දායක කර ගැනීමට මේ වැඩසටහනෙන් අපේක්ෂා කරනවා. සත්‍ය වශයෙන් ම සංවර්ධනය සඳහා ප්‍රජා සහභාගිත්වය අලුත් කාරණයක් නොවෙයි. ආර්ථික සංවර්ධනයේදී 'සහභාගිත්ව ආර්ථික සංවර්ධනය ප්‍රවේශය' යනුවෙන් සංකල්පයක් පවතිනවා. එහෙත් ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රජා සහභාගිත්ව සංකල්පය භාවිත කිරීමෙන් ග්‍රාමීය අංශයේ පැවති ආන්තීකරණය, එසේත් නැතහොත් ග්‍රාමීය ජනතාවට පවතින ගැටලු ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලැබීම සහ ගමේ පවතින සැබෑ ගැටලු හා විභවතා නිවැරදි ව ම හඳුනා ගැනීමටත් මේ ඔස්සේ හැකියාව ලැබෙනවා.

ප්‍රජා ශක්ති වැඩසටහනේ පවතින කුසලතා බලසතුකරණයටත් වඩා ආකල්පමය බලසතුකරණය ඉතා වැදගත්. ග්‍රාමීය ජනතාව ආකල්පමය වශයෙන් ශක්තිමත් කිරීමෙන් අනෙකුත් අංශවලින් ශක්තිමත් කිරීමට අවශ්‍ය පදනම සැකසෙනවා. ප්‍රජා ශක්ති වැඩසටහන යටතේ ගමේ බිහි වෙන ප්‍රජා සංවර්ධන සභාවේදී ගමේ පවතින ගැටලු හා සංවර්ධන විභවතා රාජ්‍ය නිලධාරින් සමග එකතු වී හඳුනා ගැනීමට හා සාකච්ඡා කිරීමටත් ගම සඳහා වන ආරම්භක සංවර්ධන සැලසුම සකස් කිරීමටත් ග්‍රාමීය ජනතාවගේ ආකල්පමය බලසතුකරණය මූලික ව ම ඉටු විය යුතු කොන්දේසියක්.

ප්‍රජා ශක්ති වැඩසටහනේ පවතින කුසලතා බලසතුකරණයටත් වඩා ආකල්පමය බලසතුකරණය ඉතා වැදගත්. ග්‍රාමීය ජනතාව ආකල්පමය වශයෙන් ශක්තිමත් කිරීමෙන් අනෙකුත් අංශවලින් ශක්තිමත් කිරීමට අවශ්‍ය පදනම සැකසෙනවා. ප්‍රජා ශක්ති වැඩසටහන යටතේ ගමේ බිහි වෙන ප්‍රජා සංවර්ධන සභාවේදී ගමේ පවතින ගැටලු හා සංවර්ධන විභවතා රාජ්‍ය නිලධාරින් සමග එකතු වී හඳුනා ගැනීමට හා සාකච්ඡා කිරීමටත් ගම සඳහා වන ආරම්භක සංවර්ධන සැලසුම සකස් කිරීමටත් ග්‍රාමීය ජනතාවගේ ආකල්පමය බලසතුකරණය මූලික ව ම ඉටු විය යුතු කොන්දේසියක්.

පූර්ව වැඩසටහන්වල පැවති දුර්වලතා නිවැරදි ව හඳුනාගෙන ඒවා මගහරවා ගනිමින්, ග්‍රාමීය දිළිඳු ජනතාවගේ සැබෑ ගැටලු ද නිවැරදි ව හඳුනාගනිමින් ඔවුන් ශක්තිමත් කර, ඔවුන්ගේ දිළිඳුභාවය තිරසර ලෙසින් පිටුදැකීමට අවශ්‍ය යාන්ත්‍රණය සකස් කිරීමට ගන්නා ප්‍රයත්නයක් ලෙසිනුයි 'ප්‍රජා ශක්ති' වැඩසටහන මා දකින්නේ.



# අවදානමට පෙර සූදානම

**රංගිකා අබේසේකර**

ශ්වසන පද්ධතිය හා සම්බන්ධ වූ රෝගයක් COVID-19. එය ආසාදනය වන්නේ SARS-CoV-2 වයිරසයෙන්. විශේෂඥ වෛද්‍ය මතයට අනුව මේ වයිරසය සමාජයට ඇතුළු වූවාට පසු කාලයත් සමග එහි ජානවල විකෘති තත්ත්ව සහ වෙනස්වීම් ඇතිවෙමින් පැතිරීම සිදුවනවා. SARS-CoV-2 වෛරසයේ පැවැත්ම වෙනස් වෙනවාත් සමග ම රෝගීන්ගේ වෙනස් ම ආකාරයේ රෝග ලක්ෂණ පෙන්නුම් කිරීමට පුළුවන්. ලෝකයේ සංසරණය වූ ප්‍රමුඛතම වෛරසය වුණේ SARS-CoV-2හි Omicron (B.1.1.529) නම් උප ප්‍රභේදය. මේ දිනවල COVID- 19 රෝගය සම්බන්ධ නව කතිකාවත් සමාජයේ සුළු වශයෙන් ඇති ව තිබෙනවා. ඒ, Omicron උප ප්‍රභේදයේ අනු ප්‍රභේදයක් වන NB 1.8.1 ප්‍රභේදය හේතුවෙන්. මෙහි ගෝලීය තත්ත්වය සැලකූවිට බටහිර පැසිපික් කලාපය, අග්නිදිග ආසියානු කලාපය සහ නැගෙනහිර මධ්‍යධරණී කලාපයේ පැතිර ඇති නමුත් එය ශ්‍රී ලංකාවේ දැකගත නොහැකි තරම්.

සෑම වයිරසයක ම පැතිරීම ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් වර්ගීකරණයට ලක් කරනු ලබනවා. ඒ, ප්‍රජාව කෙතෙක් ඒ ඒ වයිරසවලින් ආරක්ෂා විය යුතු ද යන කාරණය සම්බන්ධයෙන් අවධානයට ලක් කරමින්. ඒ වර්ගීකරණයට අනුව එහි පළමුවැනි කාණ්ඩය වන්නේ අධීක්ෂණය යටතේ ඇති ප්‍රභේදය එනම් ප්‍රතිදේහ වෙනස්වීමකට භාජනය වී ඇති බව තහවුරු වීම (Variant Under Monitoring). දෙවැන්න වන්නේ යම් ප්‍රභේදයක් ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමේ හැකියාව ඇති බවට තහවුරු වන ප්‍රභේදය (Variant Of Interest). තෙවැන්න සැලකිලිමත් විය යුතු ප්‍රභේදයක් (Variant Of Concern) වන අතර එයයි බරපතළ ම තත්ත්වය ලෙස වාර්තා වන්නේ.

වර්තමානයේ කතිකාවට යොමු වන Omicron උප ප්‍රභේදයේ ම අනු ප්‍රභේදය පිළිබඳ ව අදහස් දක්වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා අංශයේ වසංගතවේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය අතුල ලියනපතිරණ; "ලෝකයේ අලුතින් සොයාගෙන ඇති NB 1.8.1 ප්‍රභේදය තව ම අධීක්ෂණය යටතේ ඇති ප්‍රභේදයක් (Variant Under Monitoring). දිගින් දිගට ම ශ්‍රී ලංකාවේ සංසරණය වුණේ Omicron උප ප්‍රභේදය. එහෙත් වර්තමානයේ එහි අනු ප්‍රභේදයක් ගෝලීය ව සංසරණය වනවා. ප්‍රතිශක්තිකරණය සඳහා ලබා දුන් එන්නත් හේතුවෙන් වයිරසය විසරණය වුවත් පෙර මෙන් ප්‍රබල බලපෑමක් ඇති කිරීමේ හැකියාවක් එයට ඇත්තේ නැහැ. ඒ හේතුව නිසා අනෙකුත් ශ්වසන


වයිරස හා සමාන ව ම තමයි මේ වයිරසය හැසිරෙන්නේ. වර්තමානයේ මේ තත්ත්වය බැරෑරුම් ලෙස නොපවතින නිසා අනවශ්‍ය ලෙස කලබල විය යුතු නැහැ".

ශ්වසනය ආශ්‍රිත රෝග ගණනාවක් තිබෙනවා. මේ සෑම රෝගයක ම උගුර අමාරුව, නාසය ඉදිමීම, කිවිසුම් යාම, හිසරදය සහ උණ වැනි රෝග ලක්ෂණය දැකගැනීමට පුළුවන්. එහෙත් ඒවා කොවිඩ් -19 රෝගයට පමණක් සීමා වූ ලක්ෂණ නොවෙයි.

විශේෂඥ වෛද්‍ය අතුල ලියනපතිරණ සඳහන් කරන ආකාරයට සෑම වසරක ම මැයි සහ ජුනි, දෙසැම්බර් සහ ජනවාරි මාසවල පවතින කාලගුණික තත්ත්වය සමග එනම් සෘතු වෙනස් වීමෙන් ශ්වසන රෝග (Seasonal Radiation) වැඩි වනවා. මේ දිනවල දැකගත හැක්කේ ඒ වර්ධනය බවත් ඒ හැර කොවිඩ් 19 රෝගය ඇතුළු ව කිසියම් ශ්වසන රෝගයක විශේෂ වර්ධනයක් දැක ගැනීමට නොහැකි බවත් ඔහු අවධාරණය කරනවා. අදහස් දක්වන විශේෂඥ වෛද්‍ය අතුල ලියනපතිරණ; "විශේෂයෙන් වරින් වර ඇති වන වයිරස් වර්ග සහ ඒවායෙහි අනු ප්‍රභේද පිළිබඳ ජාන විශ්ලේෂණයක් කරනවා. මීට පෙර මාසයේ Omicron උප ප්‍රභේදයේ ජාන පර්යේෂණයක් සිදු කළා. ශ්‍රී ලංකා වෛද්‍ය පර්යේෂණ ආයතනයට ලැබුණු කොවිඩ් 19 සාම්පල්වලින් තහවුරු කළේ දැනට මෙරට ව්‍යාප්ත ව ඇත්තේ 2023, 2024 වසරවල සංසරණය වූ Omicron උප ප්‍රභේදය බව. එහෙත් ලෝකයේ රටවල් 22ක පැතිරුණු බවට හඳුනාගෙන ඇති NB 1.8.1 අනු ප්‍රභේදය ශ්‍රී ලංකාවේ හඳුනාගෙන නැහැ".

ශ්වසන රෝග ලක්ෂණ සමග රෝහල්ගත වන රෝගින්ගෙන් ක්‍රමානුකූල ව ජාන සාම්පල ලබාගෙන ඒවා වෛද්‍ය පර්යේෂණ ආයතනය වෙත යොමු කරන බවත් පොදුවේ Influenza, Respiratory Syncytial Virus (RSV), COVID 19 වැනි ශ්වසන රෝග තිබෙනවාද යන්න එහිදී පරීක්ෂා කරන බවත් විශේෂඥ වෛද්‍ය අතුල ලියනපතිරණ සඳහන් කරන කාරණාවක්.

විශේෂයෙන් වරින් වර ඇති වන වයිරස් වර්ග සහ ඒවායෙහි අනු ප්‍රභේද පිළිබඳ ජාන විශ්ලේෂණයක් කරනවා. මීට පෙර මාසයේ Omicron උප ප්‍රභේදයේ ජාන පර්යේෂණයක් සිදු කළා. ශ්‍රී ලංකා වෛද්‍ය පර්යේෂණ ආයතනයට ලැබුණු කොවිඩ් 19 සාම්පල්වලින් තහවුරු කළේ දැනට මෙරට ව්‍යාප්ත ව ඇත්තේ 2023, 2024 වසරවල සංසරණය වූ Omicron උප ප්‍රභේදය බව. එහෙත් ලෝකයේ රටවල් 22ක පැතිරුණු බවට හඳුනාගෙන ඇති NB 1.8.1 අනු ප්‍රභේදය ශ්‍රී ලංකාවේ හඳුනාගෙන නැහැ



වෛද්‍යවරුන් අවධාරණය කරන ආකාරයට ඉන්ෆ්ලුවෙන්සා උණ රෝගය උග්‍රවීමෙන් පවා මිනිසුන් මිය යාමට පුළුවන්. දීර්ඝකාලීන නිදන්ගත රෝගවලින් පසුවන්නන්ට, ගර්භිණී මව්වරුන්ට, කුඩා දරුවන්ට සහ වයස්ගත පුද්ගලයන්ට මේ වයිරසය ශරීරගත වීමෙන් බරපතළ තත්ත්ව ඇතිවීමේ අවකාශය ඉතා වැඩියි. මේ නිසා ඔවුන් පිරිස් ගැවසෙන ස්ථානවල රැඳී නොසිටීම, නිතර මුව සහ නාසය ඇල්ලීමෙන් වැළකීම, හුමාලය ඇල්ලීම, මුව ආවරණයක් පැළඳීම වැනි ශ්වසන රෝගවලින් ආරක්ෂා වීමට පියවර ගැනීම වැදගත්.

ශ්වසන වයිරසයක් ඇතුළු වූ බව හැඟෙන ඕනෑ ම අයෙක් තත්ත්වය බරපතළ වීමට ප්‍රථම වෛද්‍ය උපදෙස් සහ ප්‍රතිකාර සඳහා යොමුවීම කළ යුත්තක්. විශේෂයෙන් විශේෂඥ වෛද්‍ය අතුල ලියනපතිරණගේ අදහසට අනුව Omicron NB 1.8.1 අනු ප්‍රභේදය ඉදිරියේදී ශීඝ්‍රයෙන් පැතිරීමට අවකාශ තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වැඩිදුරටත් පර්යේෂණ සිදුකරන බවත් Omicron උප ප්‍රභේදය 2024 වසරේ ව්‍යාප්තියට සාපේක්ෂ ව 2025 වසරේ ව්‍යාප්තිය අඩු බවත් ඔහු සඳහන් කරන කාරණාවක්.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ අඛණ්ඩ නිරීක්ෂණයට අනුව වෛරස් පරිණාමය පිළිබඳ ඔවුන් දැඩි විමසිල්ලකින් පසු වනවා. Omicron NB 1.8.1 අනු ප්‍රභේදය සංසරණය වූ අනෙකුත් ප්‍රභේද හා සසඳන විට මහජන සෞඛ්‍යයට ඇති අවදානම අඩුයි.

වසර ගණනාවක සිට ම රෝග ලක්ෂණ සම්බන්ධයෙන් දැනුවත් වීම හේතුවෙන් සෑම අයකුට ම මේ රෝගය සම්බන්ධ ව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබෙනවා. නව ප්‍රභේදයේ රෝග ව්‍යාප්තිය අද වන විට ශ්‍රී ලංකාවට විශාල වශයෙන් බලපෑම් නොකළත් පුරවැසියන් ලෙස අප නිරන්තර අවධානයෙන් සිටීමයි වැදගත් වන්නේ.



# ඉරගිනි මද්දහන

**තුසිත ජයසුන්දර**

ජීවිතය, සමාජය හා මිනිස් සබඳතා සතු සංකීර්ණ හා ගතික ලකුණු රසික නැණැස අවදි කරවන නවමු පිළිවෙත් ඔස්සේ නිරූපණයට සමත් බලසම්පන්න ම ඇසි දිසි මඟ සේ තවදුරටත් පිළිගැනෙන්නේ සිනමාව. එනමුත් සිනමාවට පසුව උපන් රූපවාහිනිය විෂයෙහි නිර්මිත මාලා නාටකය මේ වන විටත් උක්ත අරමුණු සාධනය පිණිස දරන්නේ අති මහත් තැතක්. මුල් සමයේදී සෝප් ඔපෙරා මැයෙන් කිසියම් අඩු තක්සේරුවකින් හැඳින්වූ රූපවාහිනී මාලා නාටකය මෙසේ වැඩුණු අවස්ථා වරින්වර සේ ම විටෙක නොකඩවා ද පළ කරන්නේ සැබැවින් ම සිනමාවේ පැවැත්ම හා අභිවර්ධනය අභියෝගයට ලක් කරමින්. සිරිලක තතු ද මේ වග නිරනුමාන ව ම සනිටුහන් කරනවා.

මෙය පිළිඹිබු කරලන සාධක කිහිපයක් කෙරෙහි සැලකිලිමත් වීම මෙහිලා අත්‍යන්තයෙන් ම වැදගත්. පළමුකොට ම දත හැක්කේ රූපවාහිනිය වෙනුවෙන් ම වූ සම්මාන ප්‍රදානෝත්සව කිහිපයක් ම වාර්ෂික ව පැවැත්වීම. මේවායේදී ඉහළ ම සම්මාන දිනා ගන්නා රූපවාහිනි මාලා නාටක බොහෝ විට පවසන්නේ රසික දිවි පොහොසත් කරලන මැදිහත්වීමක් සහතික කරලන්නට ඇති හැකියාව හා ඕනෑකම. රූපවාහිනි මාලා නාටක කෙරෙහි සිරිලක කලා විචාරයේ අවධානය ද යොමුවෙමින් පවතිනවා. සිනමා හා සාහිත විචාරයේ බලයට නතු ව සිටින සිරිලක කලා විචාරය මෙසේ රූපවාහිනි පිවිසුම් විෂයකොට ගැනීමේ අරුත් සරු බව ලුහුකොට දක්වන්නට බැහැ. මේ අතරට සපැමිණෙන නවතම බලපෑම වනුයේ සමාජ මාධ්‍ය ඔස්සේ එන අතිමහත් ප්‍රතිචාර ආදිය. මෙය කලා කෘති අරභයා රසික සමාජයට ඇති කියැවීම් උද්දීපනයට ලැබී ඇති මහඟු අවස්ථාවක් ද වනවා. ඒ ඒ රූපවාහිනි මාලා නාටක සතු නා නා විධ ලකුණු සමාජ මාධ්‍ය වෙතින් දත හැක්කේ විටෙක සියුම් හා දරදඬු අංග සහිත ව. මෙයින් නොසැලී රූපවාහිනි මාලා නාටක ඇගැයීම සඳහා වඩා නිරවුල් පිළිවෙත් නිර්ණය කර ගැනීම මාධ්‍ය විද්වතුන් මත ද පැටවෙන වගකීමක්.

> ‘ඉරගිනි මද්දහන’ මෙසමයේ නිර්මිත අගනා රූපවාහිනි මාලා නාටකයක් වනුයේ නිර්මාපකයාගේ සේ ම පිටපත් රචිකාවියගේ දැක්ම හා කැපවීම ද නිසා. නිසැක ව ම ‘ඉරගිනි මද්දහන’ අසීරු ව්‍යායාමයක්. නවකතාවේ දැක්ම රූපවාහිනි තිරය මත විදාරණය වන්නේ නොගැඹුරු හැඟුම්බර ලකුණු පලවා හරිමින්. ජීවිතය හා මිනිස් සබඳතා පිළිබඳ නව කියැවීමකට සුලබ මං විවර කර දෙමින්.

සතිපතා දෙකොටස බැගින් විකාශය වූ හා විකාශය කෙරෙන රූපවාහිනි මාලා නාටක කිහිපයක් ම ගෙවුණු සමයේදී සේ ම අද දවසේදීත් සිරිලක කලා රසික සමාජය ආලෝලනයට සමත් වන්නේ පෙර සඳහන් සාධක ද ඒ ඒ රූපවාහිනි නාලිකා ලබාදෙන වෙසෙස් ඉඩ හසර ද මැනැවින් ගළපාගෙන. ‘රූපවාහිනි මාලා නාටකයක් පිළිබඳ නිසි විවරණයක නිරත වන්නටනම් එය මුළුමනින් ම විකාශය විය යුතු ය’ යන අදහස ප්‍රශ්න කරන්නට රසික විචාරක පිරිස් මේ වන විට සූදානම් වන බව නොරහසක්. නිසැක ව ම සිදුවන්නේ යම් රූපවාහිනි මාලා නාටකයක විකාශය නිම වූ විගස ම ඒ හිස්තැන පුරවනු සඳහා නව නිර්මාණයක් පැමිණීම. රසික බහුතරයක් නොපමා ව මේ නව නිර්මාණය හා බැඳෙන්නට උනන්දු වනවා. විචාරක පිරිසට සිදුවන්නේ එය සලකා බලමින් ක්‍රියා කරන්නට. මෙහෙයින් විශිෂ්ටතා පළ කළ ඇතැම් නිර්මාණ සැඟ ව ගිය බව බව පිළිගන්නට සිදු වනවා. මෙය රූපවාහිනි මාලා නාටක විචාරය පිරිපහදු කිරීම ඇවැසිය යන්න අවධාරණය කිරීමක්.

සති අන්ත ගණනාවක විකාශයෙන් අනතුරු ව නොබෝද නිමා වූ ලලිත් රෝහිත එදිරිසිංහගේ ‘ඉරගිනි මද්දහන’

රූපවාහිනී මාලා නාටකය මෙහිලා සඳහන් කළ සියලු කරුණු පිළිබිඹු කරන විසල් හා සුපැහැදිලි කැඩපතක්. 'ඉර ගිනි මද්දහන' පිළිබඳ කෙරෙන කරුණු දැක්වීම් හුදෙක් ඊට පමණක් ම අදාළ නොවන බවයි අවධාරණය කළ යුත්තේ. ඇවැසි නම් මෙතැනට වෙනත් නිර්මාණයක් වුව කැඳවීමේ හැකියාව තිබෙනවා. එහෙත් කරුණු කිහිපයක් ම නිසා පෙනී යන්නේ මේ සඳහා මෙසමයේ වඩාත් ම උචිත වන්නේ 'ඉරගිනි මද්දහන'ය යන්න. මෙකරුණු අතර ඇති සමීපතා බැහැර නොකළ යුතුයි. එහෙත් විවරණයකදී මෙය බාධාවක් කර ගත යුතු නැහැ.



අද වන විට සිරිලක රූපවාහිනී නාලිකා කිහිපයක් ම හරවත් නිර්මාණ විකාශයට තරගකාරී ව අවතීර්ණ වන බව දැක ගන්නට පුළුවන්. රූපවාහිනී මාලා නාටක මෙතැනදී කැපී පෙනෙනවා. රසික ප්‍රතිචාර ද පෙරට වඩා සහේතුක වන අන්දම අවස්ථා ගණනාවකදී ම දැක ගන්නට පුළුවන්. විදග්ධ මුහුණුවරක් සේ ම විදග්ධ අන්තර්ගතයක් සමග රසික ප්‍රතිචාර සැලකිය යුතු වේගයකින් ඉදිරියට ගමන් කරන බවයි ඉන් අදහස් කෙරෙන්නේ.

රූපවාහිනී මාලා නාටක සඳහා සාහිත නිමවුම් පාදක කර ගන්නට නිර්මාපකයන් දක්වන්නේ සැලකිය යුතු කැමැත්තක්. විටෙක දත හැක්කේ මෙබඳු නිර්මාපකයකු සාහිත බලයේ යටත් වැසියකු වන අන්දම. තවත් විටෙක සාහිත බලය අභිභවා යාමේ නැඹුරුවක් ද දත හැකියි. සාහිත නිමැවුමක් එලෙසින් ම ඇසි දිසි මඟට පෙරළීමේ වෑයම් පවා දුලබ නැහැ. තවත් තැනෙකදී දිස්වන්නේ සාහිත නිමැවුමේ පළමු පෙළ අරුත් නොව නව අරුත් ම ඉස්මතු කරලීමේ ප්‍රයත්න. 'ඉරගිනි මද්දහන' නිර්මාපක ලලිත් රෝහිත එදිරිසිංහ මේ තතු පිළිබඳ අවබෝධයකින් පසුවූවකු බවයි හැඟෙන්නේ.

ලලිත් 'ඉරගිනි මද්දහන' උදෙසා තෝරා ගන්නේ මෑතදී ප්‍රකාශිත, එහෙත් සාහිත කතිකා හා විචාර ප්‍රතිචාර විෂයෙහි නොදුටු මාදිලියේ නවකතාවක්. මෙහි කතුවරිය වන තරංගා දිසානායක කලක් තිස්සේ ම රැඳී සිටින්නේ හැඟුම්බර අත්දැකීම් බෙහෙවින් ප්‍රිය කරන තුරුණු පාඨක කණ්ඩායම් සමග. සාහිත කෙත අස්වද්දනු පිණිස මේ පිරිසේ දායකත්වය හා සහභාගිත්වය අතිශයින් ම වැදගත්. සාහිත කතිකා හා විචාර ප්‍රතිචාර සතු බලය මෙතැනදී අනිසි කොන්දේසි ආදිය පනවන්නට ඉඩ තිබෙනවා. තරංගාගේ 'කඳුළු කුණාටුව' නවකතාව ද මේ අත්දැකීම ලද වග පැහැදිලියි. එසේ වුව ද තරංගා දිසානායක නොවළහා මෙයින් ජය ගන්නේ ඒ විෂය කොටගෙන රචිත රූපවාහිනී මාලා නාටක පිටපත නිසා. රූපවාහිනී නිර්මාණයේ දිගුකාලීන අත්දැකීම් සහිත ලලිත් රෝහිත එදිරිසිංහ මෙහි අගය නිසි ව වටහා ගෙන තිබූ බවයි පෙනී යන්නේ.

මේ නිසා 'ඉරගිනි මද්දහන' මෙසමයේ නිර්මිත අගනා රූපවාහිනී මාලා නාටකයක් වනුයේ නිර්මාපකයාගේ සේ ම පිටපත් රචිකාවියගේ දැක්ම හා කැපවීම ද නිසා. නිසැක ව ම 'ඉරගිනි මද්දහන' අසීරු ව්‍යායාමයක්. නවකතාවේ දැක්ම රූපවාහිනී තිරය මත විදාරණය වන්නේ නොගැඹුරු හැඟුම්බර ලකුණු පලවා හරිමින්. ජීවිතය හා මිනිස් සබඳතා පිළිබඳ නව කියැවීමකට සුලබ මං විවර කර දෙමින්. එනම් මෙහි එන චරිත, සිදුවීම් හා ඒ අතර සබඳතා නන් අයුරින් රසිකයාගේ පොදු අත්දැකීම් ද වන නිසා.

සමස්ත නිර්මාණයේ ම විශ්වාසය හා සැකය යන දෙකරුණ සැරිසරන්නේ අදිසි චරිතයක් සේ. මෙය මිනිස් සබඳතා ව්‍යාකූල කරලීමට තුඩුදෙන හේතු ද්විත්වයක් සේ හඳුනා ගන්නට පුළුවන්. පළමු පෙළ චරිත සතර පිරිමින් දෙදෙනකු හා ගැහැනුන් දෙදෙනකු විසින් නියෝජනය කරනු ලබනවා. බණ්ඩාර, මහතුන්, සමන්තා හා කාංචනා මේ සිව්දෙනා. ඔවුන් වෙසෙන තරමක පිටිසර පෙදෙසේ හැඩරුව ඔවුන්ගෙන් දුරස් නොකිරීම එක එල්ලේ ම රසික ප්‍රසාදය කෙරෙහි බලපානවා. මේ චරිත සතු අනන්‍යතා සලකුණු කෙරෙන්නේ ද ඊට සමගාමී ව. සිව්දෙනා ම තමන්ගේ ම වන පටලැවිල්ලක් සමග දිගු කලක් තිස්සේ සිට ම පොර බදනවා. නිර්මාපකයන් කිසිවිටෙකත් මේවා එකිනෙකින් ස්වායත්ත ව දක්වන්නේ නැහැ. හැම පටලැවිල්ලක් ම අනෙකාට ද බලපාන අන්දම ඔහු දක්වන්නේ අතිශයෝක්තියකින් තොර ව. මේ සියල්ලන් ම වෙසෙන්නේ කල්පිත ලොවක නොව මෙලොව ම බවයි ඉන් කියැවෙන්නේ.

නිර්මාපක ලලිත් හා පිටපත් රචිකා තරංගා නොවෙනස්වන කළු සුදු චරිත දිග හැරීමේ පිළිවෙතකින් බැහැර වන්නේ කල් ඇතුව ම. ඔවුන්ගේ අරමුණ වනුයේ කළු හා සුදු ලකුණු මුසු වූ චරිත ම ගෙනහැරපෑම. කෙනකුට මෙය අළු පැහැති චරිත ප්‍රතිනිර්මාණයක් සේ පෙනී යන්නට ද පුළුවන්. එහෙත් විටෙක කළු හා තවත් විටෙක සුදු චරිත සේ බණ්ඩාර, මහතුන්, සමන්තා හා කාංචනා නිරූපණයට ඔවුන් දක්වන කැමැත්ත අපැහැදිලි නැහැ. වෙසෙන් ම දරුවන් අරභයා ඔවුන් දක්වන නෙක ප්‍රතිචාර රසිකයා සසල කරන අයුරින් නිරූපණයේදී ඔවුන් පළ කරන ඉවසීම සැලකිය යුතු තරම්. රසිකයා හඬා වැට්ටවීමේ කැමැත්තක් ඔවුන් තුළ නොතිබූ බව නිසැකයි. ඒ වෙනුවට පළමු චරිත සතරේ ඇතුළාන්තය හෙමින් සීරුවේ හසු කර ගැනීමට ඔවුන් පියවර ගන්නවා.

මෙහිලා රූපණ කාර්යය ලබාදෙන පිටිවහල සුළුපටු නැහැ. සෙස්සන්ට වඩා සමන්තාගේ චරිතය කැපී පෙනෙන්නේ එය මේ සබඳතා සමුච්චයේ කේන්ද්‍රය ද වන නිසා. සමන්තාගේ චරිතයට ජීවය දෙමින් තරින්දි ප්‍රනාන්දු මෙයට අදාළ වගකීම ඉටු කරන්නේ තමාගේ ඇතැම් නොගැඹුරු රූපණ එහෙම පිටින් ම ඉවත් කරමින්. සමන්තා වෙතින් කියැවෙන සංකීර්ණතාව නිරූපණයට ඇය පියවර ගන්නේ රූපවාහිනී චරිත නිරූපණයේ ස්වරූපය කෙරෙහි අපමණ සැලකිල්ලක් දක්වමින්. ධනංජය සිරිවර්ධන, චමීර ලියනගේ හා සුබුද්ධි ලක්මාලි මෙසේ 'ඉරගිනි මද්දහන'ට සිය උපරිම රූපණය රැගෙන එන බව ද කිව යුතුයි.

අද වන විට සිරිලක රූපවාහිනී නාලිකා කිහිපයක් ම හරවත් නිර්මාණ විකාශයට තරගකාරී ව අවතීර්ණ වන බව දැක ගන්නට පුළුවන්. රූපවාහිනී මාලා නාටක මෙතැනදී කැපී පෙනෙනවා. රසික ප්‍රතිචාර ද පෙරට වඩා සහේතුක වන අන්දම අවස්ථා ගණනාවකදී ම දැක ගන්නට පුළුවන්. විදග්ධ මුහුණුවරක් සේ ම විදග්ධ අන්තර්ගතයක් සමග රසික ප්‍රතිචාර සැලකිය යුතු වේගයකින් ඉදිරියට ගමන් කරන බවයි ඉන් අදහස් කෙරෙන්නේ. ලලිත් රෝහිත එදිරිසිංහ වැන්නන් හා 'ඉරගිනි මද්දහන' බඳු නිර්මාණ මේ පිවිසුම හසුරුවාලීමේ පාර්ශ්ව බවට පත් වන්නේ නිතැතින්.

# විය සිදුරු ගොන්නකින් ඒබී බැළීම



කුසල් ධනංජය කුරුවිටගේ

**කපිල එම්. ගමගේ**




රොබට් ෆ්‍රොස්ට් පවසන්නේ කවිය ඇති වන්නේ චිත්තවේගීය සිතුවිල්ලක් සොයා ගත් විට හා ඒ සිතුවිල්ල වචන සොයා ගන්නා විට බව. කවියා සියුම් නිරීක්ෂයකු වන්නේ ඉහත කාරණයේදී. මානව ජීවිතයේ චිත්තවේගීය හැඟීම් දැනීම් සූක්ෂ්ම ආකාරයෙන් සොයාගත් විට ඔහුගෙන් හෝ ඇයගෙන් හෝ ඒවා කවි බවට පෙරළෙනවා. එවැනි ප්‍රකාශන සන්දර්භවල ක්ෂුද්‍ර කවිය ඉතා ප්‍රබල සන්නිවේදන ස්වරූපයක්. අත්දැකීම සාර්ව ස්වරූපයෙන් ග්‍රහණය කරගන්නවාට වඩා එහි ඇත්තේ සූක්ෂ්ම බවක්. ප්‍රතිභාපූර්ණ තරුණ කවියකු වන කුසල් ධනංජය කුරුවිටගේ සිය තුන් වැනි කාව්‍ය සංග්‍රහය වන 'කිරුළුකෝලය' ඒ සූක්ෂ්ම බවේ හා ක්ෂුද්‍ර බවේ ඉතා ප්‍රබල ප්‍රකාශන ස්වරූපයක් මතු කර දෙනවා. කුසල් සැම විට ම මානව හැඟීම් ධාරා අල්ලා ගන්නේ බිංදු මාත්‍ර ලෙසින්.

කවි 166කින් සමන්විත ඔහුගේ මේ කෘතියේ සාතිශය බහුතරයක් මෙවැනි ආකාරයේ ක්ෂුද්‍ර නිර්මාණ. ඒවා විටෙක දේශපාලන සමාජ කියවීම්. තවත් විටෙක මිනිස් සිතුවිලි ඉතා සියුම් ව කියවා ගැනීම්. ඔහු මේ විවිධාකාර අනුභූති අප වෙත ඉදිරිපත් කරමින් අප ව ම ප්‍රශ්න කරනවා. ඒවා අපේ ජීවන අත්දැකීම් සමග සමපාත වන්නේ අප තුළ සියුම් තිගැස්මක් ඇති කරමින්. විටෙක අප අපේ ම නිරුවත කණ්ණාඩියක් ඉදිරියේ ප්‍රතිබිම්බගත කිරීමක්. ඒ නිසයි ඒවා පෙරළා අප තුළ සියුම් කම්පනයක් ඇති කරන්නේ.

ඔහු ඒ සඳහා භාවිත කරන්නේ සරල භාෂාවක්. එය නාගරික සමාජ භාෂාවට බොහෝ සමීප වන්නක්. ඔහුගේ කවිය තේරුම් ගැනීමට කෝෂාර්ථ සොයා යා යුතු නැහැ. එහෙත් ඒ සරල භාෂා ප්‍රකාශනය යටින් දුවනා සුවිශේෂ ජීවන අත්දැකීමක් අඩංගු වනවා. එය සොයා ගත් සැනින් ඔහුගේ කවිය ගන්නේ වෙනත් වර්ණයක්. අනෙක් අතට ඔහු ආකෘතිවාදියෙක් නොවෙයි. ඔහු නිදහස්කාමී කවියෙක්. මේ නිසා ඇතමකුට ඔහුගේ කවි කිසියම් ආකාරයක ගද්‍යමය ස්වරූපයෙන් පෙනෙන්නට පුළුවන්. එහෙත් අපගේ කියවීමට අනුව ඔහුගේ කවියේ ප්‍රකාශන ප්‍රබලත්වය ගොඩ නැගෙන්නේ ම මේ නිදහස්කාමී ආකෘතිය ඇතුළේ.

ඇඟිලි තුඩගින්
පියයුරු තුඩු බ්‍රේල් කියවන්න
තැත් කරමි
කියා දෙයි ඒ වචන ඈ
කනට කර

(පිටුව 23)

බිමත් ව ගෙදර එමි
එපා කියද්දිත් මම
ඇරලවන්නට
පසුපසින් එයි සඳ

(පිටුව 88)

ඔහු කාව්‍යමය පින්සලකින් චිත්‍ර අඳින ශිල්පියෙක් බවට පත්වන්නේ ඉතා සීමිත වචන කිහිපයක් භාවිත කරමින්. පළමු කවියේ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවක අවස්ථා සිද්ධියක් වෙනස් වර්ණයකින් සිතුවම් කරනවා. දෙවැනි කවියේ මිනිස් හුදකලාබවේ තීව්‍රත්වය සුදු කළු වර්ණයෙන් වර්ණ ගන්වනවා. එහිදී ඔහු භාවිත කරන සංකේත ඇති කරන්නේ ප්‍රකාශන ප්‍රබලත්වයක්.

ඔහුගේ ඇතැම් කෙටි කවි විශාල දේශපාලන අරුතක් දනවන නැවුම් නිර්මාණ. ඒවා ඍජු දේශපාලන සටන් පාඨ නොවෙන්නට ද ඔහු වග බලාගන්නේ කවියේ ඕජෝ ගුණය මතු කරමින්.

මෙහෙකරු අතින්
වීදුරු බිඳුන බිම වැටේ
හාම්පුතුගේ කැඩිච්ච සිංහල
කැබලි විසිරේ

(පිටුව 16)

මේ කවියේ ඇති සමාජ පන්ති පිළිබඳ ගැටුම කියවා ගැනීම අප සියුම් ව මතු කරගත යුත්තක්.

නිදහසේ දුවන සිංහයගෙ
කකුලක් කපනු වෙනුවට
කඩුවක් අතට දෙන එක
මොන තරම් පහසුයි ද?

(පිටුව 17)

නව ලිබරල් දේශපාලනය ප්‍රතිවිරෝධ නිහඬ කරන ආකාරය ශ්‍රී ලාංකික 'සිංහ' සංකේතය ඔස්සේ කුසල් කියවන ආකාරය අපූරුයි. ලංකා දේශපාලනයේ බොහෝ සිංහ වෙස් ගත්තන් නිහඬ කළේ මේ ආකාරයෙන් නොවේ ද?.

දිරපු තැන් හදන්නට
අවසර ලැබේ නගින්නට
ඉඳහිට අයකුට
ඉණිමග උඩට

(පිටුව 19)

පන්ති දේශපාලනයේදී නිර්ධන පාන්තිකයකුට තාවකාලික ව ඉහළට නගින්නට අවසර ලැබෙන්නේ ඉහළ පාන්තික දේශපාලනයේ පැවැත්ම වෙනුවෙන් අවශ්‍ය කඩතොළු පිළිසකර කිරීම සඳහා පමණයි.

උගුලේ
තවදුරටත්
විස් නොතැබීම ගැන
දොස් කියයි
මීයෙක්

(පිටුව 28)

දේශපාලනයේදී අපට මී කතුරක වුව චීස් කැබැල්ලක් තැබෙන්නේ නම් ඉදිරි අනතුර වුවත් මතක නැහැ. කුසල්ගේ තියුණු ක්ෂුද්‍ර කවි අතර අපූරු දිගු කවි කිහිපයක් ද තිබෙනවා. ඒ අතරින් ජීවන අවකාශමය නිදහස කුඩා කොටස්වලට අප නොදැනීම ඛණ්ඩනීකරණය (Fragmentatμon) වී ඇති සැටි පවසන 'අවකාශ' නිර්මාණය සුවිශේෂයි. ඒ යටින් පවතින දේශපාලනික හේතු ද කියවා ගත් විට නිර්මාණයට ලැබෙන ත්‍රිමාණික බව අපූරුයි.

මිලාධික ඇඳුම් ඇඟලාගත හැකි
අවම අවකාශය පිටෝං රූම්මෙකකි
බස් එකේ රකුසු ඇස් මැද
පුංචි ලව් කෙළවරකි
සිනමාහලක බොක්ස් එකත්
පුංචි නිදහස් තැනකි
කුලී ගෙදරක බිත්ති අතරෙත්
බුදු කුටියකට, සුරතලෙකුට ඉඩ ඇති තැනකි
උද්‍යානයේ රැකවලුන් නොඑන
සැඟවුණු තැනක් තැබිය හැක
උද්ඝෝෂණයටත් ඒ මදිවට
පොඩි ඉඩකි
ආණ්ඩුව අප වෙනුවෙන් ම අත්හළ

(පිටුව 40)

ජීවන හුදකලාව, නොසලකා හැරීම, අත්හැරයාම යන අසම්මුතික කාරණා මානව ජීවිතය මොන තරම් ගැඹුරට බාදනය කරන්නේ ද යන අනුභූතිය රැගත් කුසල්ගේ මේ කව ජීවන රිදුමක් ඇති කරන්නක්.

ලිවීමට කිසිවක් නැතියෙන්
තීන්ත වියළී යයි
පෑනක
කියවීමට කිසිවකුත් නැතියෙන්
කාවුන් අකුරින් අකුර සොරකම් කරයි
පොතක
පැමිණීමට කිසිවකු නැතියෙන්
ගස්වැල් හැඩි කරයි බිම
උද්‍යානයක
හිඳීමට කිසිවකු නැතියෙන්
හුදකලාව රජයයි
කලාගාරයක
හැඳිනගැනීමට කිසිවෙකු නැතියෙන්
මතකයෙන් මැකී යයි මිනිසුන්
ඡායාරූපයක
පිපිරවීමට කිසිවක් නැතියෙන්
ලවණ මුසු සුළඟ උරා බී දිරයි යකඩ
කාලතුවක්කුවක
ඇසීමට කිසිවකු නැති වුවත්
කුරුල්ලෙක් ගී ගයයි
හිස් මිටියාවතට.

(පිටුව 82,83)

කුසල්ගේ කව්වල යටින් දිවෙන සියුම් ජීවන ශෝකාලාපයක් ද තිබෙනවා. ඒ මත කැවරී ඇත්තේ නොස්ටැල්ජියානු මතක, ඊයම්බරිත තනිකම, ඝන වූ හුදකලාව, ළය පෙළන හිස්කම වැනි කාරණා.

ඔබ ගැන සිතීම යනු
දිගු චාරිකාවක්
යළි එන දිනක් කිව නොහැකි
රිවියින් කර කර
චිත්‍රපටියක
ප්‍රේමාලිංගනයක් නරඹන්නා සේ
ගීතයක අන්තරා කොටසක්
යළි යළි අසන්නා සේ

ආදරයේ වියෝව ගැන යළි මෙනෙහි කිරීම යනු සංවේදී මනුස්සයකුට විඳින්නට ලැබෙන දරුණු ම දඬුවමක්. එහෙත් එය මගහැර යා නොහැක්කක්. ඒ ක්‍රියාවලිය කියන්නට කුසල් භාවිත කරන උපමා අලංකාර හරිම නූතනයි. ඒ වගේ ම නැවුම්.

මම විඳිමි
එබැවින් පවතිමි
ආදරේ අන්තරායකර කොටස
මෙය වෙන්නැති

ආදරය මොන තරම් ආශ්වාදනීය අත්දැකීමක් වුව ද අහිමි වීම යනු අනතුරක්. ඇතැම් විට යළි ප්‍රතිසාධනය (Recover) කළ නොහැක්කක්.

තමන්ට තමන් කියවිය නොහැකි
පොතක් සේ හිඳිමි
තමන්ට තමන් දැකගත නොහැකි
ඇසක් සේ වෙසෙමි
සිසිරයේ ගඟක් සේ මිදෙමි

(පිටුව 146, 147)

කුසල්ගේ කවිකම ඉතා සියුම්. ඔහු එහි ඇබ්බැහියෙක්. ඒ සියුම් කවිකම ඔහු මුවහත් කරගන්නා ආකාරය ඔහුගේ කාව්‍ය ග්‍රන්ථ තුන ම එක පෙළට තබා කියවීමෙන් වටහා ගන්න පුළුවන්. එහෙත් 'කිරුළුකෝලය' එහි පරිපාකය යැයි කියන්නට බැහැ. ඒ අන් කිසිවක් නිසා නොවෙයි, කුසල්ට තව යා හැකි දුර ඉමහත් බව පෙනෙන, දැනෙන නිසා.

# රාජ්‍ය සේවා තරග විභාග අත්වැල

# නිවාඩු ගැන ටිකක් - 02



ඉදිරිපත් කිරීම
**නාලක දිසානායක**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(පාර්ලිමේන්තු කටයුතු)
මහජන ආරක්ෂක හා
පාර්ලිමේන්තු කටයුතු
අමාත්‍යාංශය හා
අධ්‍යක්ෂ (පාලන) වැ.බ
රජයේ ප්‍රවෘත්ති
දෙපාර්තමේන්තුව

රාජ්‍ය නිලධාරීන් සඳහා නිවාඩු ලබාදීම හා ඒ සම්බන්ධයෙන් වන ආයතන විධිවිධාන ප්‍රශ්නෝත්තර ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමේ පළමු අදියර අපි පසුගිය දෙසතිය කලාපයෙන් ආරම්භ කළෙමු. මේ එහි දෙවැනි අදියරයි. ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ ප්‍රධාන වශයෙන් ම රාජ්‍ය සේවයේ නිවාඩු සම්බන්ධයෙන් වන විධිවිධාන ඇතුළත් වේ. එසේ ම ආයතන සංග්‍රහයේ xxiii වැනි පරිච්ඡේදයේ ඇතැම් ලෙඩරෝගවලින් පෙළෙන රජයේ නිලධරයන් සම්බන්ධයෙන් වන නිවාඩු, XXV වැනි පරිච්ඡේදයේ වෘත්තීය සංගම් සඳහා වන ඇතැම් නිවාඩු, xxviii වැනි පරිච්ඡේදයේ නිරෝධරෝග සම්බන්ධයෙන් වන නිවාඩු, xxxii වැනි පරිච්ඡේදයේ දේශපාලනය සම්බන්ධයෙන් වන නිවාඩු ආදී වශයෙන් නිවාඩු පිළිබඳ විධිවිධාන තවත් පරිච්ඡේදවල ඇතුළත් ය. මෑත දක්වා ම යාවත්කාලීන සියලු ම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ද මෙහිදී වැදගත්.

➢ වැටුප් රහිත මෙරට අධ්‍යයන නිවාඩු

ස්ථිර රාජ්‍ය නිලධරයකුට ආචාර්ය උපාධියක් හැර මෙරට නිශ්චිත අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට හිමිකම් තිබෙන අතර ඒ සඳහා අදාළ පාඨමාලාව දෙපාර්තමේන්තු ප්‍රධානියා අනුමත කර, පහත සඳහන් කරුණු ද සහතික කර තිබිය යුතු ය.

- නිලධරයා යෝජිත පාඨමාලාව හැදෑරීමට සමත් බව
- එය ඔහුගේ රාජකාරි ක්ෂේත්‍රයට අදාළ බව
- සිය රාජකාරි කිරීමේදී එය ඔහුට ප්‍රයෝජනවත් විය හැකි බව

කෙසේ වුව ද ශාස්ත්‍රපති උපාධියක් හෝ ඊට සමාන උපාධියක් හෝ හැදෑරීමෙන් පසු ආචාර්ය උපාධියක් හැදෑරීම සඳහා රාජ්‍ය නිලධරයන්ට මෙරට වසර 03ක් දක්වා වැටුප් රහිත අධ්‍යයන නිවාඩු දිය හැකි ය. රජයේ නිලධරයකුට අධ්‍යයන හෝ පුහුණු සඳහා දෙන වැටුප් රහිත මෙරට අධ්‍යයන නිවාඩු සම්බන්ධයෙන් අනිවාර්ය සේවයක යෙදීමට පහත සඳහන් පරිදි ගිවිසුමකට එළඹිය යුතු ය.

i. වර්ෂයකට අඩු කාලයක් සඳහා අනිවාර්ය සේවා කාලයක් නොමැත.

ii. වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක වැටුප් රහිත නිවාඩු සම්බන්ධයෙන් අනිවාර්ය සේවා කාලය, වැටුප් රහිත නිවාඩු කාලය හා සමාන කාලයක් විය යුතු ය.

iii. අනිවාර්ය සේවා කාලය ගණන් බැලිය යුත්තේ ආසන්නතම සම්පූර්ණ මාසයට ය.

➢ ප්‍රසූති නිවාඩු

ස්ථිර, තාවකාලික, අනියම් හෝ අභ්‍යාසලාභී නිලධාරිනීන්ට මෙම වගන්තිය යටතේ ප්‍රසූති නිවාඩු හිමි වේ.

- වැටුප් සහිත ප්‍රසූති නිවාඩු

❖ නිලධාරිනියකට සෑම සජීවී දරු උපතක් සඳහා ම රජයේ වැඩ කරන දින 84ක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක් හිමි වේ. දරු ප්‍රසූතිය සිදු වී සති 04ක් යාමට පෙර නිලධාරිනියට යළිත් රාජකාරියට වාර්තා කිරීමට ඉඩ නොදෙනු ඇත. මෙම වගන්තිය යටතේ නිවාඩු ලබා ගැනීම සඳහා වෛද්‍ය සහතිකයක් හෝ දරුවාගේ උප්පැන්න සහතිකය හෝ ඉදිරිපත් කළ යුතු ය.

❖ ප්‍රසූති නිවාඩු ගණන් බැලීමේදී එම නිවාඩු කාලයට රජයේ නිවාඩු, සෙනසුරාදා සහ ඉරිදා දින ඇතුළත් නොකළ යුතු ය.

❖ මෙම නිවාඩු කාලය නිලධාරිනියගේ ඉතිරි ව තිබෙන නිවාඩුවලින් අඩු නොකළ යුතු අතර මෙම නිවාඩු කාලය සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩුවක් ලෙස සැලකිය යුතු ය.

❖ උපතේදී ම මරණය සිදුවන දරු උපතකදී සහ දරු ප්‍රසූතියෙන් සති 6ක් ඉක්මවා යාමට පෙර දරුවා මරණයට පත්වන අවස්ථාවකදී දරුවාගේ මරණ සහතිකය හෝ වෛද්‍ය සහතිකය හෝ ඉදිරිපත් කළ විට විශේෂ වැටුප් සහිත නිවාඩු වශයෙන් දරු උපත සිදු වූ දින සිට සති 6 ක නිවාඩුවක් දිය යුතු ය.

- අඩ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු

❖ ඉහත සඳහන් විධිවිධාන අනුව නිවාඩු ලබා ගැනීමෙන් අනතුරු ව දරුවා රැක බලා ගැනීම වෙනුවෙන් දින 84ක අඩ වැටුප් සහිත නිවාඩුවක් හිමි වේ.

❖ අඩ වැටුප් නිවාඩු කාලපරිච්ඡේදය අතරට වැටෙන රජයේ නිවාඩු, සෙනසුරාදා සහ ඉරිදා දින අඩ වැටුප් නිවාඩු ලෙස සැලකිය යුතු ය.

• වැටුප් රහිත ප්‍රසූති නිවාඩු

❖ ඉහත අඩ වැටුප් නිවාඩු ද අවසන් වීමෙන් පසුව තවදුරටත් දරුවා රැක බලා ගැනීම සඳහා අවශ්‍ය වන්නේ නම් පමණක් වැටුප් රහිත දින 84ක නිවාඩු ලබා දිය හැකි ය.

❖ මෙම වගන්තිය යටතේ ලබා දෙන නිවාඩු ගණන් බැලීමේදී එම නිවාඩු කාලයට අයත් රජයේ නිවාඩු, සෙනසුරාදා සහ ඉරිදා දින ඊට ඇතුළත් කළ යුතු ය.

❖ මෙම නිවාඩු ලබා දීමට පෙර නිලධාරිනියට ලබාදී ඇති ණය හෝ අත්තිකාරමක මාසික වාරික නොකඩවා අය කර ගැනීම සඳහා සතුටුදායක වැඩපිළිවෙළක් යෙදීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතු ය.

- ගබ්සාවීමක් හේතුකොටගෙන වෛද්‍ය සහතිකයක් මත නිලධාරිනියට හිමි විවේක නිවාඩුවලින් අවශ්‍ය නිවාඩු ලබාගත හැකි ය.

- සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලබා ගත් කාලය අවසන් වීමෙන් අනතුරු ව අඩ වැටුප් නිවාඩු ලබා

නොගන්නේ නම් තම දරුවාට මව්කිරි දීම සඳහා සාමාන්‍යයෙන් සේවා ස්ථානයෙන් පිට වන වේලාවට

පැයකට කලින් සේවා ස්ථානයෙන් පිටත් ව යාමට ඔවුන්ට අවසර දිය යුතු ය. මෙම අවසරය දිය යුත්තේ දරුවාට වයස මාස 06ක් (හයක්) සම්පූර්ණ වනතුරු පමණි.

- තව ද නිලධාරිනියකට ගර්භිණී අවස්ථාව මාස 05ක් වූ විට රාජකාරි සඳහා සේවා ස්ථානයට පැය භාගයක් ප්‍රමාද වී පැමිණීමට ද සාමාන්‍යයෙන් සේවා ස්ථානයෙන් පිට වන වේලාවට පැය භාගයකට ප්‍රථම පිටවීමට ඉඩ ලැබේ. මෙම අනුග්‍රහය දෙනු ලබන්නේ නිලධාරිනිය ප්‍රසූති නිවාඩු ලබා ගන්නා තෙක් පමණි.

- ඉහත අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු අනුමත කරනුයේ දරුවා ජීවතුන් අතර සිටින විටදී පමණි. නිවාඩු ලබාගන්නේ දරුවා රැක බලා ගැනීමට බැවින් යම් හෙයකින් දරුවා මිය ගියහොත් එයින් දින හතකට පසුව මෙම නිවාඩු අවලංගු වේ.

- ඉහත අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු, වැටුප් වර්ධක කාර්ය සහ විශ්‍රාම වැටුප් කාර්ය සඳහා බාධාවක් නොවිය යුතු ය. වැටුප් රහිත නිවාඩු කාලයේ ඇති වන පුරප්පාඩුවලදී ද උසස්වීම් ලබා දීම සඳහා ද එම නිවාඩු කාලය අවහිරයක් සේ නොසැලකිය යුතු ය.

- තව ද, නිලධාරිනියට අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩුවල කොටසක් අවලංගු කර සේවයට වාර්තා කිරීමට කැමැත්ත දක්වන අවස්ථාවකදී දෙපාර්තමේන්තු ප්‍රධානියාට දැන්වීමෙන් එසේ කළ හැකි ය.

➢ රජයේ විභාගවලට පෙනී සිටීම සඳහා නිවාඩු

කාර්යක්ෂමතා කඩඉම් වැනි විභාගයකට පෙනී සිටීමට නියමිත නිලධරයකුට එම විභාගයට පළමු වතාවට පෙනී සිටීම වෙනුවෙන් පමණක් විභාග කාලය සඳහා රාජකාරි නිවාඩු දිය හැකි ය. ගමන් වියදම් ප්‍රතිපූර්ණයක් හෝ සංයුක්ත දීමනා ගෙවීමක් හෝ සම්බන්ධයෙන් ඔහුට හිමිකමක් නොමැත. විභාග යේ එක් එක් විෂයය සඳහා වෙන වෙන ම පෙනී සිටින විටෙකදී එවැනි එක් විෂයයක් සඳහා පළමුවරට පෙනී සිටින අවස්ථාවේදී පමණක් රාජකාරී නිවාඩු දිය හැකි ය.

➢ අනිවාර්ය නිවාඩු

යම් නිලධරයකු සිය නිලයේ රාජකාරි කරගෙන යාම පොදු යහපත පිණිස හේතු නොවේ යැයි වෛද්‍ය හෝ වෙනත් විශේෂ හේතු අනුව සලකන විටෙක පත්කිරීම් බලධරයාට පුද්ගලික ව එම නිලධරයා අනිවාර්යය නිවාඩු යැවිය හැකි ය. එම නිවාඩුව පළමු ව එම නිලධරයාගේ ඉතිරි නිවාඩු ඇත්නම් ඒවායින් අඩු කළ යුතු ය. නිලධරයාගේ ඉතිරි නිවාඩු අවසන් වූ පසුව දෙන නිවාඩු සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලෙස ගණන් ගත යුතු ය.

➢ විදේශයක සේවය සඳහා පත් කළ නිලධරයකුගේ කලත්‍රයාට වැටුප් රහිත නිවාඩු

තනතුරේ ස්ථිර කරන ලද රජයේ නිලධරයකු රාජකාරිය සඳහා විදේශයකට පත් කරනු ලැබූ විට එම නිලධරයා සමග ජීවත්වීම සඳහා ඔහුගේ කලත්‍රයාට වැටුප් රහිත නිවාඩු ලබා දෙයි.

- මෙම නිවාඩු වැටුප් වර්ධක පිළිබඳ කාර්ය සඳහා ගණන් ගත යුතු ය. මෙවැනි නිලධරයකු ආපසු දිවයිනට පැමිණි විට, හෙතෙම එසේ විදේශයකට නොගියේ නම් එළඹීමට හැකි ව තිබුණා වූ වැටුප් පියවරෙහි තැබිය යුතු ය. එතෙකුදු වුවත් එසේ කළ යුත්තේ, සාමාන්‍යයෙන් ඔහුගේ වැටුප් වර්ධකයන් ගෙවීම සඳහා නුසුදුසු බවට පත් කෙරෙන, වැටුප් රහිත නිවාඩු කාලයේ වූ වැඩ හා හැසිරීම සම්බන්ධයෙන් අහිතකර වාර්තාවක්, සාමාන්‍යයෙන් ඔහුගේ වැටුප් වර්ධක දෙන බලධරයාට ඉදිරිපත් ව නැති විට පමණක් ය.

- එවැනි වැටුප් රහිත නිවාඩු කාලයක ලබාගන්නා වැටුප් වර්ධකයන් සම්බන්ධයෙන් හිඟ මුදල් නොගෙවිය යුතු ය.

- පහත සඳහන් විධිවිධානවලට යටත් ව එවැනි නිලධරයකුගේ ජ්‍යෙෂ්ඨත්වයට මෙම වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම නිසා බලපෑමක් සිදු නොවේ.

i. මෙම වගන්තිය යටතේ වැටුප් රහිත නිවාඩු ලබා සිටින නිලධරයකු, එකී වැටුප් රහිත නිවාඩු කාලයේ ඇතිවන්නා වූ කිසියම් පුරප්පාඩුවකට උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු නොවේ.

ii. උසස් කිරීම සඳහා සුදුසුකමක් වශයෙන් බඳවා ගැනීමේ පරිපාටියෙන් අවම සේවා කාලයක් නියම කෙරේනම්, එකී අවම සේවා කාලය ගණන් ගැනීමේදී මෙම වගන්තිය යටතේ දෙන වැටුප් රහිත නිවාඩු කාලය ගණන් නොගත යුතු ය.



# ක්‍රීඩා මාධ්‍යවේදය


ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය
**අනෝමා රත්නායක**

ක්‍රීඩාව යනු ජාති, ආගම්, කුලභේද, සමාජ පන්ති සහ සංස්කෘතික සීමා ඉක්මවා ලෝක ප්‍රජාව එකට ගෙන එන බහුවිධ භාවිතාවන් අනුගත ව ඇති මාධ්‍යයක්. එය ජය, පරාජය, විනෝදාස්වාදය, විශේෂ අත්දැකීම් පමණක් නොව රටක සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතිකමය ප්‍රවාහ සඳහා බලපෑම් ඇති කරන ක්‍ෂේත්‍රයක් ද වනවා. තාක්ෂණික දියුණුව සහ වෙනස්වන පාරිභෝගික මනාප හේතුවෙන් ක්‍රීඩා මාධ්‍ය ක්ෂේත්‍රය මෑත වසරවලදී භාජනය වී තිබෙන්නේ සැලකිය යුතු පරිවර්තනයකට. නිදර්ශනයක් ලෙස ක්‍රීඩා මාධ්‍ය කර්මාන්තයේ අනාගත දැක්ම පිළිබඳ සිදු කර ඇති විශ්ලේෂණවලට අනුව 2023 වසරේදී ගෝලීය ක්‍රීඩා මාධ්‍ය වෙළෙඳපොළ ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 398.2ක් පමණ වී ඇති අතර එය 2024 සහ 2032 වසර අතර දළ වශයෙන් 12.60%ක සංයුක්ත වාර්ෂික වර්ධන වේගයක් (CAGR) සමග 2032 වසර වන විට ඇමරිකානු ඩොලර් මිලියන 1,158.50ක් පමණ දක්වා වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර තිබෙනවා.

ක්‍රීඩා පුවත් ප්‍රේක්ෂකයන් විසින් ආවරණය කරන සහ භාවිත කරන ආකාරය ක්‍රීඩා කර්මාන්තයේ ඩිජිටල් පරිවර්තනය වෙනස් කර ඇත්තේ විප්ලවීය ලෙස. පසුගිය දශකයේ ශ්‍රව්‍ය සහ දෘශ්‍ය ඇතුළු නව මාධ්‍ය ආකෘති කිහිපයක් මතු ව තිබෙනවා. ක්‍රීඩා මාධ්‍යවල විශාල කොටසක් තවමත් ලිඛිත ආකෘතියක් යටතේ ආවරණය වන අතර එයට ක්‍රීඩා අංශයේ සිදුවන සිදුවීම් සඳහා කැප වූ නිශ්චිත පිටු සහිත ක්‍රීඩා සඟරා හෝ පුවත්පත් ද ඇතුළත්. ක්‍රීඩා මාධ්‍ය යනු ක්‍රීඩා ලෝලීන් සඳහා තොරතුරු මූලාශ්‍රයක් පමණක් නොව වග කිව යුතු ක්‍රීඩා පුවත්පත් කලාව ක්‍රීඩා කර්මාන්තයට සමාජ-දේශපාලනික වෙනස්කම් සිදු කිරීමේදී ඉතා ඵලදායී බව තහවුරු කර තිබෙනවා. ක්‍රීඩා කර්මාන්තයේ මතභේදාත්මක අංශ විස්තර කරන වාර්තා ලොව පුරා ක්‍රීඩා ආකෘති කිහිපයක සැලකිය යුතු වෙනස්කම්වලට තුඩු දී තිබෙනවා. ක්‍රීඩා මාධ්‍යවේදයේ ඇති භූමිකාව සීමා සහිත නොවන්නේ මේ නිසා. එය ක්‍රීඩාවේ සමස්ත ප්‍රගමනයට දායක වන පරිපාලනමය තීන්දු තීරණ ගැනීමට ද බලපෑම් කර තිබෙනවා. ඒ නිසා ජනප්‍රිය හෝ අපේක්‍ෂා කරන්නාවූ ක්‍රීඩා වාර්තාකරණ භූමිකාවකට පමණක් සීමා විය නොහැකියි. ජාතික මෙන් ම ජාත්‍යන්තර ක්‍රීඩාවේ තරග වාර්තාකරණය, දූෂණ, වංචා, අක්‍රමිකතා සහ ක්‍රීඩා ආණ්ඩුකරණයේ ව්‍යවස්ථාපනය යනාදී සියල්ල හෙළිදරව් කරන සහ ජනගත කරන මූලික මෙවලම ක්‍රීඩා මාධ්‍යවේදයයි.

20 වැනි සියවස අගභාගයේ සහ 21 වැනි සියවස මුල් භාගයේදී පමණ ක්‍රීඩා සංවිධානවල පාලන දුර්වලතා මතු වුණා. එනම්, ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධානවල/ආයතනවල සිදු වූ ඉහළ පෙළේ සදාචාර විරෝධී භාවිත, දූෂණය සහ වංචනික ක්‍රියා ලොවට නිරාවරණය වුණා. නිදර්ශනයක් ලෙස සෝල්ට් ලේක් සිටි ඔලිම්පික් උලෙළේ ලංසු තැබීමේ වංචාව, 2015 වසරේදී එළිදරව් වූ මුදල් විශුද්ධිකරණයට FIFA (Fédération International de Football Association) නිලධාරින්ගේ මැදිහත්වීම, ඉලෙක්ට්‍රොනික සන්නිවේදන වංචාව, IAAF (International Association of Athletics Federations) සහ තහනම් උත්තේජක සිදුවීමට IAAFහි ඉහළ පෙළේ නිලධාරින් (කප්පම් ගැනීමේ යෝජනා ක්‍රමයකට) සම්බන්ධ වීම සහ රුසියානු රාජ්‍ය අනුග්‍රහයලත් තහනම් උත්තේජක අපකීර්තියට අදාළ සිද්ධි සියල්ල හෙළිදරව් වූයේ ක්‍රීඩා මාධ්‍යවේදය ඔස්සේ. එහි බලපෑම කෙතරම් ද යත් අද වන විට ක්‍රීඩා පරිපාලනයේ/කළමනාකරණයේ ක්‍රීඩාවේ යහපාලනය ක්‍රියාත්මක කිරීම දක්වා වූ පාලන මූලධර්ම බිහිවීමට පදනම සකස් කෙරුණා. මේ නිසා ලොව සෑම රටක ම ක්‍රීඩා සංවිධානවල පූර්ණ සංශෝධන සිදු වන්නට වුණා.


ක්‍රීඩා ලෝකය සමග මහජනතාව සම්බන්ධ කරවන්නේ ක්‍රීඩා



මාධ්‍යවේදය. ක්‍රීඩා මාධ්‍යවේදය යනු ක්‍රීඩා ලෝකයේ හැඟීම්, සත්‍ය සහ වටිනාකම් ප්‍රකාශයට පත් කරන වෘත්තියක්. එහිදී වාර්තා කිරීම පමණක් නොව, විවිරණ, විග්‍රහය, විවේචනය සහ සත්‍ය විභාග කිරීම සහ ක්‍රීඩාවේ දර්ශනය සමාජගත කිරීම එයට ඇතුළත්. එය ක්‍රීඩාවේ සත්‍ය පසුබිම ගොඩනගන අතර ම ක්‍රීඩාශීලී ජන සංස්කෘතියක් නිර්මාණයට දායක වනු ඇති. ක්‍රීඩා ලෝකය දවසින් දවස සංකීර්ණ වීමත් සමග ම එය නිවැරදි ව සාධාරණ ව හා ගැඹුරින් විචාරය කිරීමට ක්‍රීඩා මාධ්‍යයට අවශ්‍ය වීම සත්‍යයක්. ක්‍රීඩා මාධ්‍යය සතු වගකීම ඇත්තේ ක්‍රීඩාව සහ ක්‍රීඩකයා අතර ඇති සබඳතාව ශක්තිමත් කිරීම සහ බාහිර පාර්ශ්වකරුවන් ද ක්‍රීඩාවේ කොටසක් බවට පරිවර්තනය කිරීම. ඒ සඳහා ක්‍රීඩාවේ පළපුරුදු අදහස් සහ විශ්වාසදායක තොරතුරු හෙළිදරව් කිරීම ද අවශ්‍ය වනවා. ඒ ඔස්සේ ක්‍රීඩකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම මෙන් ම තවත් ලෙසක ප්‍රේක්ෂකයන් ක්‍රීඩාව සමග සම්බන්ධ කරවීමට දායක වනවා. තවත් ලෙසක ක්‍රීඩා පරිපාලකයන් සහ ක්‍රීඩා ආයතන අතර විශ්වසනීයත්වය ගොඩ නගා ගැනීමට මෙන් ම ප්‍රතිරූපය ගොඩ නගා ගැනීමට ක්‍රීඩා මාධ්‍ය ප්‍රචාර, වාර්තා කිරීම් උපකාරි වනවා. මෙලෙසින් පැහැදිලි වන්නේ වර්තමානය වන විට ක්‍රීඩා මාධ්‍යවේදයේ දායකත්වය ක්‍රීඩාවේ උන්නතියට සාධනීය කාරණාවක් වී ඇති ආකාරය. නිදර්ශනයක් ලෙස ශ්‍රී ලංකාවේ සන්නිවේදන විෂය සම්බන්ධයෙන් රාජ්‍ය විශ්වවිද්‍යාලවල මෙන් ම පෞද්ගලික විශ්වවිද්‍යාල සහ ආයතනවල සහතික පත්‍ර, ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා, බාහිර උපාධි, අභ්‍යන්තර උපාධි මෙන් ම පශ්චාද් උපාධි දක්වා අවස්ථා තිබුණ ද රජයේ පිළිගත් ආයතන ක්‍රීඩා මාධ්‍යවේදීන් සඳහා වන ක්‍රීඩා මාධ්‍යවේදය සම්බන්ධ අධ්‍යාපන අවස්ථා මෙතෙක් ලබා දී නැහැ. මේ තත්ත්වය ක්‍රීඩා මාධ්‍යවේදීන්ට පමණක් බලපාන කාරණාවක් නොව එය සමස්ත ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ දියුණුවට ද බලපාන්නක්. විශේෂයෙන් තරගකාරී ක්‍රීඩාවට යොමු වන දරුවාගේ අනාගත වෘත්තීමය මාර්ගයකට යොමු කරවන මාර්ග මේ නිසා අවහිර වී තිබෙනවා. ඒ නිසා ක්‍රීඩාවේ ජයග්‍රහණ දිනා ගැනීම වෙනුවෙන් සිදු කරන සංවර්ධන අරමුණු අතර ක්‍රීඩා අධ්‍යාපනික අවස්ථා වැඩිදියුණුවට මෙන් ම ක්‍රීඩාවේ වෘත්තීය ගරුත්වය ඉහළ නැංවීමට අවශ්‍ය අධ්‍යාපනික වටපිටාවක් සකස් කළ යුතු ව තිබෙනවා. මෙයින් ක්‍රීඩා මාධ්‍යවේදය ඔස්සේ ක්‍රීඩාවේ දියුණුවට මෙන් ම පසුබෑමට මූලික වන කාරණා නිසි ලෙස අවබෝධ කර ගැනීමටත් උපකාර වනවා.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංස්කෘතිය, පාලනය සහ ජාතික අනන්‍යතාව ඇති කිරීමේදී ක්‍රීඩා මාධ්‍යවේදය ඉටු කර තිබෙන්නේ විශාල කාර්යභාරයක්. මෙහි වෘත්තීයභාවය වැඩිදියුණු කිරීමෙන් රටේ පිළිගත් සහ වෘත්තීය ක්ෂේත්‍රයක් ලෙස ක්‍රීඩා ජනමාධ්‍යවේදයේ කාලීන අවශ්‍යතාව අවධාරණය කළ යුතුයි. ක්‍රිකට් ප්‍රධාන මාතෘකාව බවට පත්වන රටක තවත් බොහෝ ක්‍රීඩා නියෝජනය අඩු හෝ සම්පූර්ණයෙන් ම නොසලකා හැර ඇති බව පෙනෙනවා.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංස්කෘතිය, පාලනය සහ ජාතික අනන්‍යතාව ඇති කිරීමේදී ක්‍රීඩා මාධ්‍යවේදය ඉටු කර තිබෙන්නේ විශාල කාර්යභාරයක්. මෙහි වෘත්තීයභාවය වැඩිදියුණු කිරීමෙන් රටේ පිළිගත් සහ වෘත්තීය ක්ෂේත්‍රයක් ලෙස ක්‍රීඩා ජනමාධ්‍යවේදයේ කාලීන අවශ්‍යතාව අවධාරණය කළ යුතුයි. ක්‍රිකට් ප්‍රධාන මාතෘකාව බවට පත්වන රටක තවත් බොහෝ ක්‍රීඩා නියෝජනය අඩු හෝ සම්පූර්ණයෙන් ම නොසලකා හැර ඇති බව පෙනෙනවා. ක්‍රීඩා මාධ්‍යවේදය වෘත්තියක් ලෙස සංවර්ධනය කිරීම යනු මාධ්‍ය වැඩිදියුණු කිරීම පමණක් නොව එය ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ රසිකයන්ගේ/ප්‍රේක්ෂකයන්ගේ සිට අනුග්‍රාහකයන්, පරිපාලකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් දක්වා සමස්ත ක්‍රීඩා පරිසර පද්ධතිය ම ශක්තිමත් කිරීමක්. මේ අනුව ශ්‍රී ලංකාවට වෘත්තීය ක්‍රීඩා මාධ්‍යවේදයක අවශ්‍යතාව මතු වන්නේ තොරතුරු සහ විනෝදාස්වාදය සඳහා පමණක් නොව ජාතික සංවර්ධනයට සහය වීම, විනිවිදභාවය වැඩිදියුණු කිරීම සහ තිරසර ක්‍රීඩා පරිසර පද්ධතියක් ගොඩනැගීම සඳහා. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ව්‍යුහගත, සදාචාරාත්මක සහ කුසලතා ඇති ක්‍රීඩා මාධ්‍යවේදීන්ගේ හිඟකම ක්‍රීඩාවේ සංවර්ධන ක්‍රියාදාමයට ද බලපාන්නේ ක්‍රීඩාවේ සැබෑ විභව ජනගත නොවීම හෝ ප්‍රමාද වීම නිසා. එබැවින් රටක ක්‍රීඩා සංවර්ධන ක්‍රියාවලියේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන් ම ක්‍රීඩා මාධ්‍යවේදය ඒකාබද්ධ හා සංවර්ධන මෙවලමක් ලෙස භාවිතය අවශ්‍ය අධ්‍යාපනික වටපිටාවක් සකස් කර දීම කාලීන අවශ්‍යතාවක්. එය දිගුකාලීන ආයෝජනයක්.



# නැවුම් දේශයක සිනමා අභිෂේකය




නුවන් කුමාර කටුගම්පල

මෙරට පළවූ අනෙකුත් සියලු සිනමා පුවත්පත් සහ සිනමා සඟරා ඛේදනීය ඉරණම්වලට ගොදුරු ව වැසී යද්දී 60 වැනි විය සපුරා, අඛණ්ඩ ව ඉදිරියට එන සරසවිය පුවත්පත බිහිවුණේ 1963 අප්‍රේල් 10 දින. එය මෙරට බිහිවූ 46 වැනි සිනමා පුවත්පත.

1964 මැයි 09 දින සරසවිය පුවත්පත 'සරසවිය සිනමා සම්මාන උලෙළ' ඇරඹුවේ වඩාත් විධිමත් ව සිනමාවේ සමස්ත පැතිකඩ ඇගයෙන සම්මාන උලෙළක අවශ්‍යතාව සපිරීමේ අරමුණින් අපක්ෂපාතී රාජ්‍ය මැදිහත්වීම ද සහිත ව. මෙවර (2025 ජූනි 24) එය පැවැත්වුණේ 36 වැනි වරට, 'නැවුම් දේශයක සිනමා අභිෂේකය' තේමාව යටතේ.

මේ වසරේ සම්මාන සඳහා සලකා බැලුණේ 2024 වර්ෂයේ ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා මෙරට සිනමා ශාලාවල තිරගත වූ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සිංහල සහ දෙමළ භාෂා මාධ්‍ය චිත්‍රපට. වර්ෂයේ තිරගත වී ඇති සිනමාපට 38න් 03ක් දෙමළ චිත්‍රපට. තරගකාරී අංශයේ සම්මාන 32ක් සඳහා චිත්‍රපට 37ක් තරග වැදුණා. මේ එහි ජයග්‍රහණ.




| | | |
|---|---|---|
| හොඳම චිත්‍රපටය | - | සිංහබාහු |
| හොඳම අධ්‍යක්ෂණය | - | උදයකාන්ත වර්ණසූරිය (ගිනි අවි සහ ගිනි කෙළි 2) |
| හොඳම දෙමළ භාෂා මාධ්‍ය චිත්‍රපටය | - | ඌළී |
| හොඳම ආකර්ෂණීය චිත්‍රපටය | - | මන්දාරා |
| හොඳම නළුවා | - | ධනුක දිල්ෂාන් (ගිනි අවි සහ ගිනි කෙළි 2) |
| හොඳම නිළිය | - | තිලක්ෂිනී රත්නායක (දූස්රා) |
| හොඳම නවක නළුවා සහ ජනප්‍රිය ම නළුවා | - | මේඝ සූරියආරච්චි (මන්දාරා) |
| හොඳම නවක නිළිය | - | අභිලාශී සන්තුෂ්ඨි (සිංහබාහු) |
| ජනප්‍රියම නිළිය | - | දිනක්ෂි ප්‍රියසාද් |
| හොඳම සහය නළුවා | - | සජිත අනුත්තර (සිංහබාහු) |
| හොඳම සහය නිළිය | - | තිසරි වත්සලා (මින්නු) |
| හොඳම හාස්‍යෝත්පාදක රංගන ශිල්පී | - | මහේන්ද්‍ර පෙරේරා (1970 Love Story) |
| හොඳම ප්‍රතිවීර රංගන ශිල්පී | - | අශාන් ඩයස් (1970 Love Story) |
| හොඳම තිරනාටකය | - | සුමිත්‍රා රාහුබද්ධ (මින්නු) |
| හොඳම කැමරාකරණය | - | අයේෂ්මන්ත හෙට්ටිආරච්චි (ගිනි අවි සහ ගිනි කෙළි 2)<br>විශ්ව බාලසූරිය (සිංහබාහු/මින්නු) |
| හොඳම සංස්කරණය | - | රුවන් චාමර රණසිංහ (ගිනි අවි සහ ගිනි කෙළි 2) |
| හොඳම ශබ්ද පරිපාලනය | - | සසික රුවන් මාරසිංහ (My Red Comrade) |
| හොඳම විශේෂ දෘශ්‍ය ප්‍රයෝග | - | රවීන් වෙත්තසිංහ (සිංහබාහු) |
| හොඳම සංගීත අධ්‍යක්ෂණය | - | සමන් පනාපිටිය (සිංහබාහු) |
| හොඳම කලා අධ්‍යක්ෂණය | - | ජනක ප්‍රසාද් (සිංහබාහු) |
| හොඳම වේෂ නිරූපණය | - | ශිල්පී විදුර අබේධීර (සිංහබාහු) |
| හොඳම රංග වින්‍යාසය | - | සුපුන් අබේසිංහ (සෝලෝ ටවුන්) |
| හොඳම රංග වස්ත්‍රාභරණ | - | ඕෂිනී රමේෂා (සිංහබාහු) |
| හොඳම ගායකයා | - | කිත්සිරි ජයසේකර (ගුරු ගීතය) |
| හොඳම ගායිකාව | - | නුවන්දිකා සේනාරත්න (සිංහබාහු) |
| හොඳම ගීත රචනය | - | නුවන් ජූඩ් ලියනගේ (ගුරු ගීතය) |

## කුසලතා සම්මාන

රිටිගල සුමේධ (සටන් අධ්‍යක්ෂණය-ශ්‍රී සිද්ධා), කසුනි කාවින්දි (රංගනය-සිහින සමීකරණ), යුලාන් ධෘෘ (රංගනය-සෝලෝ ටවුන්), සහේළි සදිත්මා (රංගනය-මන්දාරා), අරුණාචලම් සිවලිංගම් (සංස්කරණය-උෆ්ලී), රාජේස් වර්මා (කැමරාකරණය-උෆ්ලී), රංජිත් ජෝශප් සහ දීප වෙල්වම් (තිර රචනය-උෆ්ලී)

මෙවර ජූරියේ විශේෂ සම්මානයට පාත්‍ර වූයේ සෝලෝ ටවුන් චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂ චතුරංගන ද සිල්වා සහ රත්නපුර සීවලී මධ්‍ය මහා විද්‍යාලය නිර්මාණය කළ රොකට් චිත්‍රපටයේ නිර්මාණ ශිල්පීන් සහ ශිල්පිණියන් කණ්ඩායම. නව සම්මාන හතක් ඇතුළත් ව තිබීමත් 'ජනප්‍රිය ම සිනමා ගීතය' තේරීමත් මෙවර සරසවිය සම්මාන උලෙළේ විශේෂත්වයක්. එම සම්මානය හිමි වුණේ වීරයා චිත්‍රපටයේ 'සැප දුක දෙකට ම' ගීතයට. ජනප්‍රිය කාණ්ඩයේ තේරීම් සඳහා වැඩි ම කෙටි පණිවුඩ යොමු කිරීමෙන් දායක වූ පාඨකයා ඇගයීම ද එහි තවත් විශේෂත්වයක්.

සම්මාන උලෙළට පූර්වගාමී ව ජනප්‍රිය සිනමා දැක්මක් මරදාන සිනෙසිටි සිනමා ශාලාවේදී පැවැත්වුණා. එහිදී ප්‍රදර්ශනය වුණේ සිංහබාහු, මන්දාරා සහ සිහිනයකි ආදරේ යන වසරේ වැඩි ම ආදායම් වාර්තා ඉපැයූ චිත්‍රපට ත්‍රිත්වය. ඉතිහාසයේ මේ සිනමා දැක්ම සඳහා සතියක් චිත්‍රපට හතක් ප්‍රදර්ශනය කළ බවත් පසුගිය කාලයේ විවිධ හේතු මත එය නතර වී තිබුණු බවත් මේ වසරේ චිත්‍රපට තුනකින් යළි අරඹා ඉදිරි වර්ෂවලදී නැවත දින හතක් එය පැවැත්වීමට ක්‍රියා කරන බවත් සරසවිය පුවත්පතේ කර්තෘ, ප්‍රවීණ සිනමා ලේඛක සහ විචාරක ආචාර්ය නුවන් නයනජිත් කුමාර පැවසුවා.



















දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත
Department of Government Information
news.lk
GFU Sri Lanka
Rs. 100/-